# තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය

# 2017

## වාර්ෂික කාර්ය සාධන වාර්තාව
## (2017.01.01 – 2017.12.31 දක්වා)

**9 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල**

# දැක්ම

" තිරසර බවින් පොහොසත් රටක්"

# මෙහෙවර

" මානව සමාජය වෙනුවෙන් ප්‍රතිලාභ බෙදාහදා ගැනීම සහතිකවීම, විතැන් තත්ත්ව යටතේ සතුන් සංරක්ෂණය, ශාක සම්පත් සංරක්ෂණය හා සංවර්ධනය මෙන්ම සොබාදහම සංරක්ෂණය සහ අධ්‍යාපනය උදෙසා වනජීවී සංරක්ෂණය සහ තිරසර පරිභෝජනය යන සන්දර්භයන් යටතේ තිරසර සංවර්ධන ප්‍රවේශයන් ඔස්සේ දීප ව්‍යාප්ත තිරසර සංවර්ධන සහ ආර්ථික සංවර්ධන ප්‍රයත්නයන් උදෙසා නායකත්වය සැපයීම හා අදාළ කාර්යයන් කළමනාකරණය"

# ප්‍රධාන කාර්යයන්

- තිරසර සංවර්ධන, වනජීවී, උද්භිද උද්‍යාන හා සත්වෝද්‍යාන යන විෂයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන්, ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම් කටයුතු කිරීම.
- **1937** අංක **02** දරණ වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂා ආඥා පනත ක්‍රියාත්මක කරවීම.
- **1928** අංක **31** දරණ උද්භිද උද්‍යාන ආඥා පනත ක්‍රියාත්මක කරවීම.
- **1982** අංක **41** දරණ ජාතික සත්ත්ව උද්‍යාන පනත ක්‍රියාත්මක කරවීම.
- තිරසර මිනුම් සහ පාරිසරික දර්ශක සම්පාදනය කිරීම.
- ශ්‍රී ලංකාවේ වෘක්ෂලතා සංරක්ෂණය, උද්භිද උද්‍යාන නඩත්තුව හා මල් වගා කිරීම වැඩිදියුණු කිරීම.
- සිව්පාවන්, පක්ෂීන් සහ උරගයින් ආදී විවිධ සතුන් ඒකරාශී කිරීම හා ප්‍රදර්ශනය කිරීම.
- වනජීවී සම්පත් සංරක්ෂණය කිරීම.
- වනජීවී ආරක්ෂිත ප්‍රදේශයන්හි සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනයේ දී පරිසර සංරක්ෂණය සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- වනජීවී භාරය, වන සත්ත්ව සංරක්ෂණ අරමුදල, සත්ත්ව උද්‍යාන සංරක්ෂණ අරමුදල, උද්භිද උද්‍යාන භාරකාර අරමුදල සම්බන්ධ කටයුතු මෙහෙයවීම හා අධීක්ෂණය.

# ගරු තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යවරයාගේ පණිවිඩය

තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතනවල 2017 වර්ෂයේ වාර්ෂික කාර්ය සාධනය පිළිබඳව ප්‍රකාශයට පත් කරනු ලබන වාර්තාවට පණිවිඩයක් ලබා දීමට හැකිවීම පිළිබඳව මම අතිශයින් සතුටුවෙමි.

තිරසර ලොවක් සඳහා මිනිස් ජීවිත මෙන්ම සත්ත්ව ජීවිතද අත්‍යාවශ්‍ය වේ.එම ජීවිත ආරක්ෂා කිරීම,රැක ගැනීම මෙන්ම ඔවුන්ගේ වාසස්ථාන සඳහා ගම් හා වනපෙත් රැකගැනීමද අප හමුවේ ඇති අභියෝගයකි.මෙම අභියෝග ජයගැනීම සඳහා 2017 වර්ෂයේදී ක්‍රියාවට නංවා ඇති වැඩසටහන් රාශියකි.තිරසර සංවර්ධනය සඳහා ඉදිරියට ක්‍රියාත්මක කලයුතු වැඩසටහන් රාශියක්ද සැලසුම් කර තිබේ.

ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධනය උදෙසා අවශ්‍ය ප්‍රතිපත්ති හා සැලසුම් සකස්කර ස්වාභාවික ව්‍යසනයන්ට මුහුණ දීමටත්, ස්වාභාවික ආපදා අවම කරගැනීමටත් හැකිවනු පිණිස කටයුතු කිරීමටත් අප සියලු දෙනාම කැපකිරීම් කලයුතු වේ.

වඳවීමේ තර්ජනයට ලක්ව සිටින සියලු වන ජීවීන් සංරක්ෂණය කිරීම, අන්තරාවට ලක්වූ සත්ත්ව විශේෂ සංරක්ෂණය හා රක්ෂිත වනජීවී ජාලය ස්ථාපිත කිරීම, දේශීය ශාක හා මල් වර්ග ගවේෂණය හා සංරක්ෂණය කිරීමටද කටයුතු කර ඇත.මිනිස් හා අලි සම්පත හානියක් නොවන පරිදි ගැටුම් අවම වන අයුරින් කටයුතු කිරීමත්, වනෝද්‍යාන හා සත්ත්ව උද්‍යාන සංවර්ධනය කර ආදායම් උපයන මාර්ග වැඩිදියුණු කිරීමත් මෙම වසරේදී කටයතු කර තිබේ .

වනජීවී සංරක්ෂණ, ජාතික සත්වෝද්‍යාන, ජාතික උද්භිද උද්‍යාන යන දෙපාර්තමේන්තු හා ශ්‍රී ලංකා වනජීවී භාරය විසින් 2030 වනවිට එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ලඟා කර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අභිමතාර්ථ සාර්ථක කර ගැනීමට අවශ්‍ය සැලසුම් හා වගකීම ඉටුකිරීමට පියවර ගෙන ඇත.

විශේෂයෙන්ම වනාන්තර අඩුවීම හා මිනිස් වාසස්ථාන වැඩිවීම තුලින් උද්ගතව ඇති අලි මිනිස් ගැටුම් අවම කිරීමත් වන සතුන්ගේ මෙන්ම මිනිස් ජීවිත ආරක්ෂා කිරීමටත් වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂා කර අවශ්‍ය රැකවරණය සැලසීමටත් ක්‍රියාකර ඇත.

මෙම වර්ෂයේදී ජාතික සත්වෝද්‍යාන, ජාතික උද්භිද උද්‍යාන වැඩිදියුණු කිරීමෙන් හා යාල වනෝද්‍යානය නවීකරණය කර සත්ත්ව සුබසාධන පහසුකම් වැඩි කිරීමෙන් ද සත්ත්ව අරණ ඉදිකිරීම වැනි ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම තුලත් මෙම ස්ථාන දේශීය හා විදේශීය සංචාරකයින්ගේ ආකර්ශනීය ස්ථාන බවට පත්කර අපේක්ෂිත ආදායම් ඉලක්ක කරා ලඟා වීමට හැකිවී ඇත.

තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ අරමුණු ඉලක්ක කරා රැගෙන යාමට උරදුන් බුද්ධශාසන අමාත්‍ය ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමාටත්, තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍ය ගරු සුමේධා ජී.ජයසේන මැතිනියටත්, අමාත්‍යාංශ ලේකම් ඩග්ලස් නානායක්කාර මහතා ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයටත් ,අමාත්‍යාංශය යටතේ පවත්නා සියලු ආයතන ප්‍රධානීන් ඇතුළු කාර්ය මණ්ඩලයටත් මාගේ ගෞරවනීය ස්තුතිය පුද කරමි.

**රවීන්ද්‍ර සමරවීර**
තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍ය

# ගරු තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යවරියගේ පණිවිඩය

වර්තමානයේදී මුළු ලෝකයම කථාකරන තිරසර ලොවක් වෙනුවෙන් වනජීවී සම්පත රැකගෙන තිරසර සංවර්ධනයට දායකත්වය ලබාදීමට මග පෙන්වන තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ 2017 වර්ෂයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාවට සුබපැතුම් එක්කිරීමට අවස්ථාව ලැබීම ගැන ප්‍රථමයෙන්ම මාගේ සතුට ප්‍රකාශ කරමි.

වනජීවී සංරක්ෂණ, ජාතික සත්වෝද්‍යාන, ජාතික උද්භිද උද්‍යාන යන දෙපාර්තමේන්තු සහ ශ්‍රී ලංකා වනජීවී භාරය අප අමාත්‍යාංශයට අයත් ආයතන වන අතර අපට අලුතෙන්ම එක්වූයේ මුළු ලෝකයම කතාකරන විෂයට අයත් ආයතනයකි. ඒ තිරසර සංවර්ධන ලේකම් කාර්යාලයයි.

සතා සිවුපාවා, ගහ කොළ, පරිසරය, ස්වභාවධර්මය සමතුලිත කරගෙන සිදුවන සංවර්ධනයෙන් පමණක් තිරසර සංවර්ධනයට අපට ළගාවිය හැක. එය පහසු නොවේ. එය දැඩි අභියෝගයකි. එම අභියෝගය ජයගැනීම භාරවී ඇත්තේද අපගේ අමාත්‍යාංශයටය.

2030 වර්ෂය සඳහා ශ්‍රී ලංකාව තිරසර සංවර්ධනය සඳහා නව නියාමනයන්, ප්‍රතිපත්ති හා ආයතනික රාමුවක් සකසමින් තිරසර සංවර්ධනයක් වෙනුවෙන් කැපවී සිටී. වර්තමානයේ ලෝකයේ රටවල් කිසිදු බේදයකින් තොරව මුහුණදී සිටින ප්‍රධානතම අභියෝගය ස්වභාවික ව්‍යසනයන්ය. එම ස්වභාවික ආපදා අනාගතයේදී අවම කරගැනීමට නම් දැන්වත් තිරසර සංවර්ධනයක් වෙනුවෙන් කැපවීම අත්‍යවශ්‍යව ඇත. මෙම තිරසර සංවර්ධනය ළඟාකර ගැනීමට නම් අරමුණු 17 ක් ඔස්සේ ඉලක්ක 169 ක් සපුරාගැනීමට අප අනිවාර්යයෙන්ම කැපවිය යුතුමය.

සත්ත්ව මිනිස් සංහිඳියාව යටතේ අලි මිනිස් ගැටුම අවම කිරීමටත් වන අලි විවිධ ක්‍රම වලින් මරණයට පත්වීම වැළැක්වීමටත් ගත් ක්‍රියාමාර්ගවල ඉහළ ප්‍රගතියක් 2017 වසර තුළ පෙන්නුම් කරයි. සත්ත්ව මිනිස් සංහිඳියාව අද අපමුහුණ දී සිටින මූලික ගැටලුවක්ව පවතී. එය ගම්මාන වලට මෙන්ම නගරබද ජනතාවද එකසේ මුහුණ දෙති. අලින්ගේ තර්ජන වැඩි වීමට අලි - මිනස් ගැටුම උග්‍ර වීමට ප්‍රධාන හේතුව ලෙස පවතින අලිමංකඩවල් 95% මිනිසුන් විසින් අහුරා ගෙන තිබීමයි. අලින්ගේ සංක්‍රමණික මාර්ගයන්හි ජීවත් වන පවුල් හඳුනාගෙන සාධාරණ වන්දියක් ගෙවා ඔවුන් නැවත පදිංචි කර අලිමංකඩවල් නිදහස් කිරීම. ජනතා සහභාගීත්වයෙන් විදුලි වැටවල් ඉදි කිරීම හා ඒවා නඩත්තු කිරීම ප්‍රජා සංවිධානයන්ට පැවරීම. මිනිස් ජනාවාස ආශ්‍රිතව සිටින වන අලින් වනජීවී රක්ෂිත වෙත පළවා හැරීම. පීඩාකාරීවන අලින් පුනරුත්ථාපනය සඳහා වන අලි රැඳවුම් මධ්‍යස්ථාන ඉදි කිරීම. වන අලින් හා සතුන්ට අවශ්‍ය ආහාර හා ජලය සුලබ වන පරිදි වාසස්ථාන සුපෝෂණය කිරීම. නීති විරෝධි දඩයම නැවැත්වීම හා වන සත්ත්ව - මිනිස් සංහිඳියාව ඇති කිරීම සඳහා බාලදක්ෂ ව්‍යාපාරය හා එක්ව කටයුතු කිරීම.

ජාතික උද්‍යානවලින් දිනකට රටට ලැබෙන ආදායම රුපියල් මිලියන 20 ක් පමණ වේ. සත්වයින්ට හා පරිසරයට හානියක් නොවන ලෙස දෙස් විදෙස් සංචාරකයින්ට අපහසුතාවක් ඇති නොවන පරිදි මෙම ආදායම වැඩි කිරීමට ක්‍රියාත්මක කළ වැඩසටහන් වලින් ප්‍රගතියක් ලැබී තිබේ. තල්මසුන්, ඩොල්ෆින් වැනි මත්සයින් නැරඹීම සඳහාද පෙරට වඩා දෙස් විදෙස් සංචාරකයින්ගේ අවධානය යොමු වී තිබීමද විශේෂත්වයකි.

මල් වගාකරුවන් දස දහසක් පමණ රටපුරා දැනට හඳුනාගෙන තිබෙන අතර ඔවුන්ට පහසුකම් ලබාදීමත් නව මල් වගාකරුවන් දිරිගන්වා ඔවුන්ට මල් අපනයනය තුළින් විශාල ආදායමක් උපයාගැනීමටත් හැකිවන පරිදි ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේනතුව මඟින්ද වැඩසටහන් කිහිපයක්ම ආරම්භ කරනු ලැබීය.

ශ්‍රී ලංකාවේ රක්ෂිත වනජීවී ජාලය ස්ථාපිත කිරීම, වඳවීයාමේ තර්ජනයට ලක්ව සිටින සියලු වනජීවීන් සංරක්ෂණ කිරීම, අන්ත්‍රාවට ලක්වූ සත්ත්ව විශේෂ සංරක්ෂණය, දේශිය ශාඛා හා මල් වර්ග ගවේෂණ කටයුතු මෙන්ම සංරක්ෂණ කටයුතු සිදු කිරීම, මානව සම්පතට හා අලි සම්පතට කිසිදු හානියක් සිදු නොවන ආකාරයෙන් අලි මිනිස් ගැටුම් අවම කර ගැනීම, ජාතික උද්‍යාන රැසක් සංවර්ධනය කිරීම ඇතුළු කරුණු රැසක් 2017 වර්ෂය තුළ සාර්ථකව ක්‍රියාත්මක කරනු ලබීය.

පරිසරය රැකගෙන පරිසරයට හිතකර ආකාරයෙන් සංවර්ධන කටයුතු ද මෙහෙයවීම අද ලෝකයේ තිබෙන බරපතලම අභියෝගාත්මක ගැටළුවකි. පසුගිය අවුරුදු 30 – 40 තුළ විවිධ ආකාරයෙන් පරිසරය දූෂණය වීම නිසා සිදුවූ පළවිපාක මේ වන විට මුළු ලෝකයේම ජනතාවට ක්‍රම ක්‍රමයෙන් අත්විදීමට සිදුවී තිබේ. සෑම රටකම විවිධ දේශගුණික විපර්යාසයන් ඇතිවී අධූ වැඩි වශයෙන් හදිසි ආපදා, ස්වභාවික විපත් සිදුවී ජනතාව අසරණවී සිටින්නේද තිරසර සංවර්ධනයක් සැලසුම් සහගතව ක්‍රියාත්මක නොවූ නිසාය. එම නිසා තිරසර සංවර්ධනය යන විෂය ප්‍රථම වරට අමාත්‍යාංශයක් යටතට පත්කළේ අපේ රටේ වීමද තවත් විශේෂත්වයකි.

අතිගරු ජනාධිපතිතුමාගේත්, ගරු අගමැතිතුමාගේත් ආශිර්වාදය ඇතිව වනජීවී සම්පත රැකගෙන තිරසර රටක් වෙනුවෙන් අප අමාත්‍යාංශය ඉදිරියේ ගෙන යන වැඩසටහන්වලට සියලුම දෙනාගේ සහයෝගය ලබාදෙන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

**සුමේධා ජී. ජයසේන**
තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය අමාත්‍ය

# තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ ලේකම්ගේ පණිවිඩය

තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය එයට අනුබද්ධ ආයතන වන වනජීවී සංරක්ෂණ, ජාතික සත්වෝද්‍යාන, ජාතික උද්භිද උද්‍යාන යන දෙපාර්තමේන්තු සහ වනජීවී භාරය යන ආයතන වලින් සමන්විත වන අතර එහි ප්‍රමුඛ කාර්යය වන්නේ පරිසරයේ ශාක හා සතුන් පිළිබඳ විශේෂ අවධානය යොමු කොට ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීමත්, මහජනතාවට සතුන්ගෙන් සිදුවන පීඩා අවම කිරීමට කටයුතු කරමින් වන සත්ත්ව මිනිස් සහජීවනය ඇති කිරීමට කටයුතු කිරීමත්ය.

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් වසර 2030 වන විට ලඟා කර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අභිමතාර්ථ 17 ක් සහ ඉලක්ක 169 ක් මුදුන් පමුණුවා ගැනීම සඳහා ක්‍රියාත්මකවීම අප හමුවේ ඇති ප්‍රධාන අභියෝගය වේ.මෙම අභියෝගය ජය ගැනීම සඳහා අප විසින් ක්‍රියාත්මක වැඩසටහන් සහ ඉදිරි උපාය මාර්ග සකස් කිරීමටත්, සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන සම්බන්ධීකරණය කරමින් ඒ පිළිබඳව දැනුවත් කිරීම හා සැලසුම්කරණයට අදාළ වගකීම මෙම අමාත්‍යාංශයට පැවරී ඇත.

අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු ත්‍රිත්වය අප රටට ප්‍රධාන වශයෙන් ආදායම් උපද්දවන දෙපාර්තමේන්තු වීම විශේෂිත වේ.වනජීවී හා පරිසර සංරක්ෂණය සඳහා ඉහළම ප්‍රමුඛතාවය ලබාදෙමින්, පාරිසරික සංචාරක කර්මාන්තය වැඩිදියුණු කිරීම තුළින් ජාතික ආදායම ඉහල නැංවීම සඳහා විශේෂ අවධානය යොමුව ඇත.

තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකවන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වනුයේ අලි මිනිස් සංහිඳියාව වර්ධනය කිරීම වේ. ඒ අනුව ක්‍රියාත්මකවන වනඅලි-මිනිස් ගැටුම අවම කිරීමේ ව්‍යාපෘතිය නව මුහුණුවරක් යටතේ සාර්ථකව ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත.

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව ශාක සංරක්ෂණයට ප්‍රමුඛතාවය ලබා දෙමින් සංචාරකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා උපායමාර්ග හඳුන්වාදීමත්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වනසතුන් හට වනාන්තරයේ අයිතිය තහවුරු කරමින් නිදහසේ ජීවත්වීමට අවකාශය සලසාදීම සඳහා සහ සත්ත්ව මිනිස් සහජීවනය ඇති කිරීම සඳහාත්, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව දැනට පවතින සත්වෝද්‍යාන තුල සතුන් කූඩු කිරීමේ ක්‍රමයෙන් පරිභාහිරව නිදහසේ ගත කිරීමට අවශ්‍ය ඉඩ පහසුකම් සලසා දෙමින් සංවර්ධනය කිරීම සඳහාත්, වනජීවී භාරය හරහා පරිසර අගය වර්ධනය කිරීම හා ප්‍රජා බල ගැන්වීමේ කටයුතු සිදු කරමින් පවතින අතර රටේ මහජනතාවට උපරිම සේවයක් ලබා දීමටත් දේශීය විදේශීය සංචාරකයන්ගේ ආකර්ෂණය කර ගැනීමටත් ඔවුන්ගේ රසවින්දනය උපරිම කිරීමටත් කටයුතු කරමින් පවතී.

තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර ළඟා කර ගැනීමට උරදුන් බුද්ධශාසන අමාත්‍ය ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමාටත්, වර්තමානයේ ඒ සඳහා නිරන්තරයෙන් මඟ පෙන්වමින් නායකත්වය හා උපදේශකත්වය ලබා දෙන ගරු තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍ය, රවීන්ද්‍ර සමරවීර මැතිතුමාට හා ගරු නියෝජ්‍ය ඇමතිනි, සුමේධා ජී. ජයසේන මැතිණියට මාගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි.

2017 වසරේ කාර්ය සාධන වාර්තාව සඳහා තොරතුරු ලබා දුන් සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට සහ අංශ ප්‍රධානීන්ටත්, කාර්ය සාධන වාර්තාව සැකසීමේ කටයුතුවල නිරත වූ සියළුම නිලධාරීන්ට හා භාෂා පරිවර්තන කටයුතු කර දුන් නිලධාරීන්ටත් මාගේ ස්තුතිය පුද කරමි.

**ඩග්ලස් නානායක්කාර**
ලේකම්
තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය

# පටුන

*පිටුව*


| | |
|---|---|
| පරිසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය | **11** |
| පාලන අංශය | **17** |
| සැලසුම් අංශය | **20** |
| සංවර්ධන අංශය | **22** |
| පරිසර සංවර්ධන අංශය | **25** |
| මුදල් අංශය | **31** |
| අභ්‍යන්තර විගණන අංශය | **34** |
| නීති අංශය | **36** |
| වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | **37** |
| ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව | **63** |
| ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව | **91** |
| ශ්‍රී ලංකා වනජීවී භාරය | **117** |

# 1. තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය

# 1. තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය

## 1.1. හැඳින්වීම

අංක 1933/13 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් 2015 සැප්තැම්බර් මස 21 වන දින තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය පිහිටුවන ලදී.

තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය පිහිටුවීමේ ප්‍රධාන අරමුණු වන්නේ,

- තිරසර සංවර්ධන, වනජීවි, උද්භිද උද්‍යාන හා සත්වෝද්‍යාන යන විෂයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම් කටයුතු.
- වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂා ආඥා පනත ක්‍රියාත්මක කරවීම.
- උද්භිද උද්‍යාන ආඥා පනත ක්‍රියාත්මක කරවීම.
- ජාතික සත්ත්ව උද්‍යාන පනත ක්‍රියාත්මක කරවීම.
- තිරසර මිනුම් සහ පාරිසරික දර්ශක සම්පාදනය කිරීම.
- වනජීවී සම්පත් සංරක්ෂණය කිරීම.

## 1.2. අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක දෙපාර්තමේන්තු හා ආයතන

1. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
2. ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව
3. ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
4. ශ්‍රී ලංකා වනජීවී භාරය
5. තිරසර සංවර්ධන ලේකම් කාර්යාලය (තිරසර සංවර්ධන පනත සම්මත වී ඇත.තිරසර සංවර්ධන ලේකම් කාර්යාලය ඉදිරියේදී පිහිටුවීමට නියමිතය.)

## 1.3. අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන්

### 1.3.1. පුත්තලම ඒකාබද්ධ සංචාරක සංවර්ධන සැලැස්ම

ක්‍රියාත්මක ප්‍රදේශය - පුත්තලම දිස්ත්‍රික්කය

ක්‍රියාත්මක ආයතනය - පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

අරමුණු -

- සංචාරක කර්මාන්තය දියුණු කිරීම තුළින් ප්‍රදේශයේ ජනතාව සවිබල ගැන්වීම.
- ප්‍රදේශයේ ජෛව විවිධත්වය සංරක්ෂණය ඉහළ නැංවීම.
- දේශීය හා විදේශීය සංචාරක ආකර්ෂණය ඉහළ නැංවීම.

ඇස්තමේන්තු මුදල - රු.මි. 500

ව්‍යාපෘති කාලය - 2017 - 2018

2017 වෙන්කළ ප්‍රතිපාදන - ඒකාබද්ධ අරමුදල රු.මි. 2.5

ක්‍රියාකාරකම් -

- සමුද්‍රීය පරිසරය පිළිබඳ පෝස්ටර්, සිතියම්, නිදර්ශක, පොත්, තොරතුරු, පත්‍රිකා හා ආකෘති සෑදීම.
- සමුද්‍රාසන්න පරිසර පද්ධතීන්, සමුද්‍ර දූෂණයෙන් තොර කලාපයන් ලෙස පවත්වා ගැනීම සඳහා සංචාරකයින් දැනුවත් කිරීමට අවශ්‍ය කලාප ආශ්‍රිතව දැනුවත් කිරීමේ පුවරු සවි කිරීම.
- සංචාරකයන් ගැවසෙන ප්‍රදේශ පොලිතීන් වලින් තොර කලාපයක් ලෙස පවත්වා ගැනීම සඳහා දැනුවත් කිරීමේ පුවරු සවිකිරීම.

භෞතික ප්‍රගතිය -

- සමුද්‍රාසන්න පරිසර පද්ධතීන්, සමුද්‍ර දූෂණයෙන් තොර කලාප ලෙස පවත්වා ගැනීම සඳහා සංචාරකයින් දැනුවත් කිරීම සඳහා කලාප ආශ්‍රිතව දැනුවත් කිරීමේ පුවරු 17 ක් සවිකිරීමට කටයුතු කිරීම. (පාලවිය හන්දිය, කන්දකුලියට හැරෙන හන්දිය, කල්පිටිය ධීවර වරාය, කන්දකුලිය ටිකට් කවුන්ටරය, මුතුපන්තිය වෙරළ, බත්තලගුණ්ඩුව, තලවිල පල්ලිය අසල ආදී ප්‍රදේශ වල)
- සංචාරකයන් ගැවසෙන ප්‍රදේශ පොලිතීන් වලින් තොර කලාපයක් කිරීම සඳහා දැනුවත් කිරීමේ පුවරු 09 ක් සවිකිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම. (කලාඔය ගඟේ වාඩිය නාන තොට, මුල්ලිපුරම් වෙරළ,පුත්තලම කලපු උද්‍යානය, සේරුක්කුලිය වෙරළ, කරුපුපනේ, ඉරනවිල වෙරළ, මාරවිල කුරුස පල්ලිය අසළ, මුදුකටුව වෙරළ හා උඩප්පුව වෙරළ ආශ්‍රිතව)
- දැනුවත් කිරීමේ අත්පත්‍රිකා බෙදා හැර ඇත.

මූල්‍ය ප්‍රගතිය (2017.12.31 දිනට)- රු.මි. 2.46

## 1.3.2. උතුරු පළාත් ඒකාබද්ධ සංචාරක සංවර්ධන සැලැස්ම

ක්‍රියාත්මක ප්‍රදේශය - උතුරු පළාත

ක්‍රියාත්මක ආයතනය - යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

අරමුණු -

- ප්‍රදේශයේ සංචාරක විභවතාවයන් ඇති ස්ථාන හඳුනාගෙන පාරිසරික සංචාරක කර්මාන්තය දියුණු කිරීම තුළින් ජනතාව සවිබල ගැන්වීම.

ඇස්තමේන්තු මුදල - රු.මි. 700

ව්‍යාපෘති කාලය - 2017 - 2021

2017 වෙන්කළ ප්‍රතිපාදන - ඒකාබද්ධ අරමුදල රු.මි. 5

ක්‍රියාකාරකම් -

- ප්‍රදේශය තුළ සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීමට අදාළ විභවතාවයන් පවතින ස්ථාන හඳුනා ගැනීම හා අදාළ දත්ත රැස්කිරීම.
- හඳුනාගන්නා ලද ප්‍රදේශයන් ආශ්‍රිතව ජීවත්වන ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා අවශ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන්/ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පාරිසරික සම්පත් ආරක්ෂා කිරීමේ වැදගත්කම පිළිබඳ ජනතාව දැනුවත් කිරීම.

භෞතික ප්‍රගතිය -

- හඳුනාගන්නා ලද ප්‍රදේශයන් ආශ්‍රිතව ඇති පරිසර පද්ධතීන් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් 03 ක් හා පුහුණු වැඩසටහන් 02 ක් ක්‍රියාත්මක කිරීම. (වෙලනායි,සරසාලෙ හා ඩෙල්ෆ්ට්)
- මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් මහජනතාව, රාජ්‍ය නිලධාරීන් හා පාසල් ළමුන් ඉලක්ක කර ගනිමින් පවත්වා ඇති අතර එහිදී වෙලනායි,සරසාලෙ හා නාගර්කෝවිල් ප්‍රදේශයන්හි හඳුනාගත් හැකි කඩොලාන පරිසර පද්ධතීන් හා තෙත්බිම් පිළිබඳවත්, ඩෙල්ෆ්ට් හි සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීමට විභවතාවයන් පවතින ස්ථාන පිළිබඳවත් සාකච්ඡා කළ අතර අදාළ කණ්ඩායම් විසින් එම ස්ථාන වලට ඇති තර්ජන හා එම ස්ථාන සංරක්ෂණයට යෝජනා ඉදිරිපත් කර ඇත.
- පර්යේෂණ කටයුතු සඳහා සුදුසු ස්ථාන හඳුනාගැනීම හා සමීක්ෂණ කටයුතු සඳහා උපකරණ බෙදා දී ඇත.




ඩෙල්ෆ්ට්හි පැවති දැනුවත් කිරීමේ වැඩසටහනක්



මන්ඩතිවුහි පැවති දැනුවත් කිරීමේ වැඩසටහනක්

මූල්‍ය ප්‍රගතිය (2017.12.31 දිනට) - රු.මි. 2.65


පාලන
මුදල්
සැලසුම්
නීති
අමාත්‍යාංශයේ අංශ
සංවර්ධන
අභ්‍යන්තර විගණන
තිරසර සංවර්ධන

## 1.4. පාලන අංශය

## 1.4.1. හැඳින්වීම

මෙම අමාත්‍යාංශය සතුව පවතින වටිනාම සම්පත වන මානව සම්පත මනාව කළමනාකරණය කිරීම තුළින් අමාත්‍යාංශ අරමුණු ඉටු කරවා ගැනීම සඳහා අවශ්‍ය සහය ලබා දීම පාලන අංශය මගින් සිදු කරනු ලබයි.

## 1.4.2. කාර්යභාරය

- අමාත්‍යාංශය තුළ සාමාන්‍ය පරිපාලනය හා විනය පවත්වාගෙන යාම.
- අමාත්‍යාංශයේ සියලු නිලධාරීන්ගේ ආයතන කටයුතු සිදු කිරීම.
- දෙපාර්තමේන්තුවේ ආයතන කටයුතු නිසියාකාරව සිදු කිරීමට අමාත්‍යාංශයෙන් අවශ්‍ය සහය ලබා දීම.
- පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව, පාර්ලිමේන්තු ප්‍රශ්න හා අමාත්‍ය මණ්ඩල සංදේශ වලට අදාළ කටයුතු සිදු කිරීම.
- අමාත්‍යාංශයේ මානව සම්පත් සංවර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම.

## 1.4.3. 2017.12.31 දිනට කාර්ය සාධනය

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව හා ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව යන ආයතන තුනටම අදාල ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව 2017.12.31 දිනට වැටුප් පරිවර්තන ලිපි 126 ක් සැකසීම.
- 2017.12.31 දිනට වැටුප් වර්ධක ලැබීම සඳහා හිමිකම් ලබා තිබූ නිලධාරීන් 75 දෙනෙකු සඳහා වැටුප් වර්ධකය ගෙවා ඇත.
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ විනය කටයුතු ගොනු 04 ක් යාවත්කාලීන කිරීම හා නඩත්තු කිරීම.
- පාලන අංශයට ලැබෙන සියලුම ලියාපදිංචි ලිපි හා සාමාන්‍ය ලිපි අප්‍රමාදව අදාළ ආයතන හා අංශ වලට යොමු කරනු ලබයි.
- අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන් 17 දෙනෙකුගේ දුරකතන බිල්පත් හා පොදු දුරකතන දෙකෙහි බිල්පත් කඩිනමින් ගෙවීම් කටයුතු සිදුකර ඇත.
- පාලන අංශය තුළ ආරම්භ කළ පුස්තකාලය මගින් අමාත්‍යාංශ කාර්යය මණ්ඩලයට පොත් ලබා දීම තුළින් ඔවුන්ගේ දැනුම් මට්ටම් ඉහළ නැංවීමට හා කියවීමේ රුචිය පුළුල් කිරීමට කටයුතු කර ඇත.
- අදාල කාලය තුල නිලධාරීන් අට දෙනෙක් ස්ථිර කර ඇති අතර එක් නිලධාරියෙකු උසස්වීම් ලබා දී ඇත.
- අමාත්‍ය මණ්ඩල සංදේශ 42 මේ වන විට යොමුකර ඇත.
- ගරු බුද්ධශාසන,තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමාගෙන් වාචික පිළිතුරු අපේක්ෂිත පාර්ලිමේන්තු ප්‍රශ්න 19 ක් සඳහා පිළිතුරු ලබා දී ඇත.

- ප්‍රවාහන අංශය මගින් පවත්වා ගෙන යනු ලබන වාහන සංචිතයේ වාහන 11 ක් පවතින අතර එමගින් මෙම අමාත්‍යාංශයේ සියළු අංශවලට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් ලබා දේ. ඊට අමතරව ප්‍රවාහන අංශය මගින් නිල වාහන 21 ක් නඩත්තු කරනු ලැබේ. වාහන 03 ක් සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ රාජකාරී සඳහා තාවකාලිකව ලබා දි ඇත. වාහන 18 ක් අමාත්‍යාංශය නමින් පවරා ගැනීමට කටයුතු සිදු කර ඇත.

## 1.4.4. මානව සම්පත සංවර්ධනය උදෙසා ලබා දුන් පුහුණු වීම්

පුහුණු කිරීම හා හැකියා වර්ධනය සඳහා 2017 වර්ෂයට අනුමත වු ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් දස ලක්ෂයක් (රු 1,000,000.00) වු අතර 2017.12.31 වනවිට එයින් රු. 499,224.00 මුදලක් වැය කර විවිධ පුහුණු වැඩසටහන් හා වැඩමුළුව සඳහා අමාත්‍යාංශයේ නිලධාරීන් සහභාගී කරවීමට කටයුතු කර ඇත.

| | ආයතනය | පුහුණුවේ නම | සහභාගීත්වය |
|---|---|---|---|
| 1 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | පරිගණක රියදුරු බලපත්‍රය | 05 |
| 2 | ජාතික කම්කරු අධ්‍යයන ආයතනය | කාර්යාල කළමනාකරණය සඳහා ඉංග්‍රීසි | 04 |
| | | වත්කම් කළමනාකරණය | 01 |
| | | ලිපිගොනුකරණය | 03 |
| 3 | සීමාසහිත නිපුණතා සංවර්ධන පදනම | බඳවාගැනීමේ පරිපාටිය | 03 |
| | | කැබිනට් පත්‍රිකා පිළියෙල කිරීම. | 02 |
| | | වාර්ෂික සේවා මණ්ඩලය | 01 |
| | | පෞද්ගලික ලිපිගොනු පවත්වා ගෙන යාම. | 02 |
| | | නායකත්වය හා පෞරෂ සංවර්ධනය | 01 |
| | | පරිගණක රියදුරු බලපත්‍රය | 03 |
| | | කාර්යාල කාර්ය සහයකයින්ගේ ආකල්ප හා වෘත්තීමය දැනුම වර්ධනය කිරීම | 11 |
| | | Excellence in HR for Talent Manag-ment | 01 |
| 4 | මූල්‍ය අධ්‍යයන ආයතනය | සේවක පඩි ලැයිස්තුව | 04 |
| | | ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 01 |
| | | CIGAS වැඩමුළුව | 01 |
| 5 | ඉංජිනේරු ආයතනය | වායුසමීකරණ පද්ධතා හා මූල්‍ය නියාමනය | 03 |
| 6 | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | ඉංජිනේරු සේවයේ III සේවයේ නිලධාරීන් සඳහා වන දෙවන භාෂා පුහුණු වැඩසටහන | 01 |
| 7 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- කැළණිය | දෙවන භාෂා පුහුණු වැඩසටහන | 08 |
| 8 | PRAG ආයතනය | ආරක්ෂිත රිය පැදවීම හා මාර්ග නීති පිළිබඳ මාර්ගෝපදේශය | 02 |

## 1.4.5. විදේශීය පුහුණු සහ වැඩමුළු

01. එම්.එම්.එස්.එස්.බී. යාලේගම මහතා (අතිරේක ලේකම් - තිරසර සංවර්ධන)

- Asia Pacific Conference (Taking Collective Action to Accelerate Transformation of Official Statistics for Agenda 2030 – (2017.03.26 සිට 2017.06.21 දක්වා තායිලන්තයේදී )
- Workshop for the Countries Presenting Voluntary review (VNRS) at the high level Political forum (HLPE) in 2018 (2017.12.04 සිට 2017.12.05)
- 2017 Sustainable Development Transition Forum on SDG Mainstreaming and means of Implementation (2017.10.30 සිට 2017.11.01)

02. ජී.පී සපුතන්ත්‍රී මහතා (අධ්‍යක්ෂ - තිරසර සංවර්ධන)

- Regional Workshop for setting Country SDG baseline and targets for water, sanitation and hugging (2017.04.18 සිට 2017.04.19 දක්වා තායිලන්තයේ දී )
- Seminar on Population Sustainable Development and poverty Reduction for Developing Countries 2017 (2017.06.07 සිට 2017.06.21 දක්වා චීනයේ දී)

03. ජේ.ඩී. අමරතුංග මහත්මිය (අධ්‍යක්ෂ - සංවර්ධන)

- Development Administration and Transformation Programme (The Malaysian Experience) 2017.10.21 සිට 2017.10.27 මැලේසියාවේදී

## 1.5. සැලසුම් අංශය

### 1.5.1. හැඳින්වීම

අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තුවල සංවර්ධන කාර්යයන් සැලසුම් කිරීම මෙම අංශයේ අරමුණ වේ.ඒ අනුව ජාතික අවශ්‍යතාවන් හඳුනාගනිමින් සංවර්ධන කටයුතු සැලසුම් කෙරෙන අතර එකී සැලසුම්, අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු හා ආයතන මඟින් දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට කටයුතු කෙරේ. 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉලක්ක ළඟා කර ගැනීම සඳහා මෙම අංශයේ කාර්යභාරය සුවිශේෂී වේ.

### 1.5.2. කාර්යභාරය

- අමාත්‍යාංශයට අදාළ සංවර්ධන සැලසුම් සකස් කිරීම.
- ක්‍රියාකාරී සැලැස්මට අනුව අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුව හා ආයතනය සම්බන්ධීකරණය කරගනිමින් මාසික, ත්‍රෛමාසික හා වාර්ෂිකව සමස්ත ප්‍රගතිය ලබාගැනීම හා තොරතුරු විමර්ශනය කර ප්‍රගති සමාලෝචන වාර්තා පිළියෙළ කිරීම.
- අමාත්‍යාංශයේ ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම, දෙපාර්තමේන්තුවල ප්‍රගති සමාලෝචන රැස්වීම් වලට සම්බන්ධවීම හා අවශ්‍ය මඟපෙන්වීම් කටයුතු සිදු කිරීම.
- අමාත්‍යාංශයට අනුබද්ධිත දෙපාර්තමේන්තුවල ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු පිළියෙළ කිරීමට සහායවීම හා එම ආයතන විසින් ක්‍රියාත්මක ව්‍යාපෘති අධීක්ෂණය හා මෙහෙයවීම.
- අමාත්‍යාංශයට අනුබද්ධිත දෙපාර්තමේන්තුවල සංවර්ධන යෝජනා සැකසීමේ දී අවශ්‍ය උපදෙස් ලබාදෙමින් එම යෝජනා මුදල් අමාත්‍යාංශයේ අනුමැතියට ඉදිරිපත් කිරීම.
- රු.මි. 50 ට වැඩි ව්‍යාපෘති වල ප්‍රගතිය මුදල් අමාත්‍යාංශය හා ව්‍යාපෘති කළමනාකරණ මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කිරීම.
- අයවැය කාරක සභා අවස්ථාවට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍යාංශයේ ප්‍රගතිය ඇතුළත් කාර්ය සාධන වාර්තා සැකසීම හා වාර්ෂික කාර්ය සාධන වාර්තා සැකසීම.
- ජනාධිපති ලේකම් කාර්යාලයට, මුදල් අමාත්‍යාංශයට, ප්‍රතිපත්ති සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයට, ශ්‍රී ලංකා මහ බැංකුවට, අනෙකුත් රේඛීය අමාත්‍යාංශ හා පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවල අවශ්‍යතාවය මත අවශ්‍ය වන තොරතුරු ලබාදීම.
- අමාත්‍යාංශයට අදාළ විෂයයන් පිළිබඳ තොරතුරු රැස්කිරීම හා යාවත්කාලීන කිරීම.
- අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති වාර්තා සැකසීම සහ ඊට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීම, මෙහෙයුම් කිරීම හා ඇගයුම් කටයුතු සිදු කිරීම.
- දෙපාර්තමේන්තු වල සිදුවන විශේෂ සිදුවීම් පිළිබඳ තොරතුරු සතිපතා ජනාධිපති ලේකම් කාර්යාලයට වාර්තා කිරීම.
- කාර්තුමය ප්‍රගතිය ජනාධිපති ලේකම් කාර්යාලයට වාර්තා කිරීම.

- දිස්ත්‍රික්ක වල පැවැත්වෙන වනජීවී දෙපාර්තමේන්තු වලට අදාළ රැස්වීම් සංවිධානය හා සම්බන්ධීකරණය.
- වනදිවි මිතුරු කමිටු හා අමාත්‍යාංශය සම්බන්ධීකරණ කටයුතු.
- පුත්තලම ඒකාබද්ධ සංචාරක සංවර්ධන සැලැස්මට හා උතුරු ඒකාබද්ධ සංචාරක සංවර්ධන සැලැස්මට අදාළ කටයුතු ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය.
- අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු මඟින් ඉදිරිපත් කර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා වූ තීරණ පිළිබඳව පසුවිපරම් කිරීම.
- වන අලි තර්ජනයට ලක්වන ජනතාව උදෙසා සකස් කරන වනඅලි හානි වන්දි ක්‍රමය සම්බන්ධව ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සහ එය ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීම.
- දෙපාර්තමේන්තුවල දෛනික ආදායම් වාර්තා ලබා ගැනීම හා තීරණ ගැනීමට අවශ්‍ය අවස්ථා වලදී ඒවා ඉදිරිපත් කිරීම.
- උතුරු නැගෙනහිර පළාත්වල කැලෑ ඉඩම් නිරවුල් කිරීමට අදාල සාමාජිකත්වය දැරීම.
- ජංගම සේවා වැඩසටහන් වලදී දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය කිරීම.
- මෙහෙයුම් මැදිරිය ස්ථාපනය කිරීමේ කටයුතු සහ තොරතුරු යාවත්කාලීන කිරීමේ කටයුතු සිදු කිරීම.

## 1.5.3. 2017.12.31 දිනට කාර්ය සාධනය

- අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා ආයතනයන්හි කාර්තුමය ප්‍රගති සමාලෝචන රැස්වීම් 12 ක් පවත්වන ලදී.
- දෙපාර්තමේන්තු විසින් පැවැත්වූ ප්‍රගති සමාලෝචන රැස්වීම් වලට සහභාගී වී ප්‍රගතිය වැඩිකර ගැනීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම් කටයුතු සිදු කර ඇත.
- ව්‍යාපෘති වල ප්‍රගතිය මුදල් අමාත්‍යාංශයට යොමු කොට ඇත.
- 2016 වර්ෂයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකසා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට හා අදාළ අනෙකුත් ආයතන වෙත ලබා දී ඇත.
- 2017 වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට ප්‍රගතිය හා 2018 වර්ෂයේ සිදු කිරීමට අපේක්ෂිත කාර්යය ඇතුලත් කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුව වෙත යොමු කර ඇත.
- ජනාධිපති ලේකම් කාර්යාලයට, මුදල් අමාත්‍යාංශයට, ශ්‍රී ලංකා මහ බැංකුවට, අනෙකුත් රේඛීය අමාත්‍යාංශ හා පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවට අවශ්‍ය තොරතුරු ලබා දී ඇත.
- ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුවට අවශ්‍ය තොරතුරු ලබා දෙමින් ඔවුන් සමඟ සම්බන්ධීකරණය කිරීම.
- 2018 අයවැය සඳහා ව්‍යාපෘති වාර්තා සහ අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම.
- වනජීවී, උද්භිද උද්‍යාන සහ සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවල ප්‍රගතිය සම්බන්ධ ගැටළු වලදී අදාල ආයතන සමඟ එක්ව ඒවා නිරාකරණය සඳහා කටයුතු කිරීම.
- 2018 යෝජිත ව්‍යාපෘති වාර්තා අනුමැතිය සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.
- උතුරු පළාත් ඒකාබද්ධ සංවර්ධන සැලැස්ම සහ පුත්තලම ඒකාබද්ධ සංවර්ධන සැලැස්මට අදාළ ව්‍යාපෘති යෝජනා අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් ක්‍රියාත්මක කිරීමේ කටයුතු හා සම්බන්ධීකරණ කටයුතු සිදු කර ඇත.
- මෙහෙයුම් මැදිරිය ස්ථාපනය කිරීමේ කටයුතු සහ තොරතුරු යාවත්කාලීන කිරීමේ කටයුතු සිදුකර ඇත.

## 1.6. සංවර්ධන අංශය

### 1.6.1. හැඳින්වීම

මෙම අංශය මඟින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව සහ ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන සංවර්ධන කටයුතු විධිමත්ව හා ඵලදායීව ක්‍රියාවට නැංවීම සඳහා මනාව සම්බන්ධීකරණය සිදුකරනු ලබයි.

### 1.6.2. කාර්යභාරය

- වනජීවී සංරක්ෂණ, ජාතික උද්භිද උද්‍යාන සහ ජාතික සත්වෝද්‍යාන යන දෙපාර්තමේන්තු වලට අයත් සංවර්ධන කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍යවන ප්‍රතිපත්තිමය තීරණ ගැනීම.
- වනජීවී සංරක්ෂණ, ජාතික උද්භිද උද්‍යාන සහ ජාතික සත්වෝද්‍යාන යන දෙපාර්තමේන්තුව වලට සම්බන්ධව අමාත්‍යාංශය වෙත ලැබෙන මහජන පැමිණිලි පිළිබඳව අවශ්‍ය කටයුතු කිරීම.
- ජනාධිපති කාර්යාලය වෙත සහ අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත ලැබෙන වනජීවී, උද්භිද උද්‍යාන හා සත්වෝද්‍යාන විෂයයන්ට අදාල මහජන පැමිණිලි විසඳීම සඳහා අදාළ ආයතන වෙත යොමු කිරීම.
- වනජීවී සංරක්ෂණ, ජාතික උද්භිද උද්‍යාන සහ ජාතික සත්වෝද්‍යාන යන දෙපාර්තමේන්තු සතු ඉඩම්, පුරාවිද්‍යා රක්ෂිත ආශ්‍රිත ගැටළු සහ රක්ෂිත තුළ පදිංචි මහජනතාවගේ ගැටළු පිළිබඳව කටයුතු කිරීම.
- වනජීවී සංරක්ෂණ, ජාතික උද්භිද උද්‍යාන සහ ජාතික සත්වෝද්‍යාන යන දෙපාර්තමේන්තු වලට අයත් ඉඩම් අත්පත් කර ගැනීම, විරෝධතා පරීක්ෂණ පැවැත්වීම සහ නව අත්පත් යෝජනා යැවීම සම්බන්ධයෙන් කටයුතු කිරීම
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් සම්බන්ධ ඉල්ලීම්, පැවරීම් හා ගැටළු සම්බන්ධව කටයුතු කිරීම.
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් ආශ්‍රිතව සිදුවන අනවසර ඉදිකිරීම් නවතා ඔවුන්ට විකල්ප ඉඩම් ලබා දීමට කටයුතු කිරීම.
- පෞද්ගලික පාර්ශවයන් විසින් ඉදිරිපත් කර ඇති විවිධ ඉඩම් ගැටළු පිළිබඳව නිරීක්ෂණය කර අවශ්‍ය කටයුතු සලසා දීම.
- ජාතික වනෝද්‍යාන, උද්භිද උද්‍යාන සහ සත්වෝද්‍යාන තුළ සිදුකරන සංවර්ධන කටයුතු, සත්ව රෝහල් ඉදි කිරීමේ කටයුතු, විදුලි වැට ඉදි කිරීම, වනඅලි රැඳවුම් මධ්‍යස්ථාන ඉදිකිරීම, වාසස්ථාන සුපෝෂණය කිරීම යනාදී කටයුතු සම්බන්ධීකරණය හා අධීක්ෂණය.
- සංවර්ධන විෂයට අදාල අමාත්‍ය මණ්ඩල තීරණ නියාමනය කිරීම.
- වනජීවී, උද්භිද උද්‍යාන සහ සත්වෝද්‍යාන කටයුතු වලට අදාළව සහ මෙම අමාත්‍යාංශයේ විෂය කටයුතු වලට අදාලව වෙනත් අමාත්‍යාංශ මඟින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉදිකරනු ලබන විදුලි වැටවල් සම්බන්ධ කටයුතු සහ විදුලි වැටවල් ඉදිකිරීම සම්බන්ධ ගැටළු සොයා බැලීම.
- අභය භූමි මායිම් නැවත සලකුණු කිරීමට අදාළ කටයුතු.
- හීලෑ අලි පැටවුන් සහ වෙනත් වනජීවී සතුන් සම්බන්ධ ඉල්ලීම් පිළිබඳ කටයුතු සම්බන්ධීකරණය.
- ආගමික පෙරහැර කටයුතු සඳහා හීලෑ අලි ඇතුන් ලබාදීම විධිමත් කිරීම හා ඉල්ලීම් පිළිබඳව ක්‍රියා කිරීම.

- මහජන පීඩාකාරී සත්ත්ව ප්‍රජාවන් සම්බන්ධ ගැටළු නිරාකරණ කිරීමට අදාළ පර්යේෂණ හා නිර්දේශ ලබාදීම.
- අලි සංරක්ෂණය සම්බන්ධ කටයුතු.
- පරිසර පද්ධති සංරක්ෂණය සහ කළමණාකරන ව්‍යාපෘතිය සම්බන්ධව අදාල ආයතන සමඟ එක්ව කටයුතු කිරිම.
- ශ්‍රී ලංකාව තුළ මල් වගාව වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය පුළුල් සැලැස්මක් සකස් කිරීමට අදාල ආයතන සමඟ එක්ව කටයුතු කිරිම.
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව සහ ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවයන දෙපාර්තමේන්තු තුනට අදාල සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් සම්බන්ධ කටයුතු.
- ආපදා කළමනාකරණ සැලැස්ම සහ වැඩසටහන් ව්‍යාපෘතිය 2014 – 2018 එම ව්‍යාපෘතිය අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරවීම.
- සමුද්‍ර ක්ෂීරපායින් සංරක්ෂණය සම්බන්ධ කටයුතු.
- මහළුළිය, නායගඟ කුඩා ජල විදුලි බලාගාරය -හෝර්ටන් තැන්න ව්‍යාපෘතිය හා මුහුදු පැළෑටි සංරක්ෂණ ව්‍යාපෘතියට අදාල කටයුතු.
- නව සංවර්ධන යෝජනා ක්‍රම පිළිබඳව යෝජනා ලබා ගැනීම, ඇගයීම හා නිර්දේශ ලබාදීම.
- පාර්ලිමේන්තුවේ දී විවාදයට ගනු ලබන පාර්ලිමේන්තු ප්‍රශ්ණ විශ්ලේෂණය කර සාරාංශගත කිරීම.
- ගරු අමාත්‍යතුමා සහභාගී වන දිස්ත්‍රික් වැඩමුළු සහ සංචාරයන් පිළිබඳව සම්බන්ධීකරණ කටයුතු සිදු කිරිම සහ එම අවස්ථාවන්හි දි ඉදිරිපත් කරනු ලබන ගැටළු සඳහා විසඳුම් ඉදිරිපත් කිරීම සහ අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීම.
- ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබන සත්ත්ව හුවමාරු වැඩසටහන් පිළිබඳව සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් සඳහා සහභාගී වීම සහ අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව සහ ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබන නව ඉදිකිරීම්වල මූලික සැළසුම් සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දීම.
- කසළ බැහැර කරන ස්ථාන වල වන අලි ගැවසීම වැළැක්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට අදාලව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සමඟ අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- වනජීවී වනසංරක්ෂණ හා වෙනත් රක්ෂිත ප්‍රදේශවල ආරක්ෂාව තහවුරු කිරීම සම්බන්ධව කටයුතු කිරීම.
- දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් පැන නඟින ගැටළු නිරාකරණය කිරීම සම්බන්ධයෙන් විසඳුම් ලබා ගැනීම සඳහා ගරු අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි කමිටු පත්කිරීම සහ සම්බන්ධීකරණය.

## 1.6.3. 2017.12.31 දිනට කාර්ය සාධනය

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අදාලව ලැබුණු මහජන පැමිණිලි 24ක් සම්බන්ධව කටයුතු කිරීම සඳහා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඒ සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.
- ජනාධිපති කාර්යාලයෙන් ලැබෙන වනජීවී, උද්භිද උද්‍යාන සහ සත්වෝද්‍යාන විෂයට අදාල මහජන පැමිණිලි 33 ක් සම්බන්ධව කටයුතු කිරීම සඳහා අදාල ආයතන වෙත යොමු කර ඒ සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.
- අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් ලැබෙන වනජීවී, උද්භිද උද්‍යාන සහ සත්වෝද්‍යාන විෂයට අදාල මහජන පැමිණිලි 06 ක් සම්බන්ධව කටයුතු කිරීම සඳහා අදාල ආයතන වෙත යොමු කර ඒ සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් සම්බන්ධව පිටස්තර පුද්ගලයන් හා ආයතන අතර පවතින ගැටළු 09 ක් නිරාකරණය කිරීමට කටයුතු සලසා ඇත.
- ජාතික උද්‍යාන තුල වැව් ප්‍රතිසංස්කරණය සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව වැඩසටහනක් ක්‍රියාත්මක කරවීම මගින් වනජීවී දෙපාර්තමේන්තුවේ උද්‍යාන වල වැව් ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අනුමැතිය ලබා දී ඇත.
- සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරවීම සඳහා අවශ්‍ය අවස්ථා වල අමාත්‍යාංශයේ සහය ලබා දී ඇත.
- වනජීවී සංරක්ෂණ විෂය සම්බන්ධව අමාත්‍ය මණ්ඩල සංදේශ 04 ක් ඉදිරිපත් කර ඇති අතර වෙනත් අමාත්‍ය මගින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 02 ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත.
- ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් පින්නවල නව සත්වෝද්‍යානයට සහ අලි අනාථාගාරය පුළුල් කිරීම සම්බන්ධයෙන් අත්පත් කර ගන්නා ඉඩම් නිශ්චිතව හඳුනාගැනීම හා අත්පත් කර ගැනීමට නොහැකි ඉඩම් නිශ්චය කර ඇත.
- ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් පින්නවල නව සත්වෝද්‍යානයට සහ අලි අනාථාගාරය පුළුල් කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනිමේ ක්‍රියාවලියේ දී නව අත්පත් යෝජනා 04 ක් ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර විරෝධතා පරීක්ෂණ 09 ක් සිදු කර අවසන් අතර නිර්දේශ ඉඩම් අමාත්‍යාංශය වෙත යැවීමට නියමිතය.
- ජල සම්පත් කළමනාකරණ කටයුතු පිළිබඳ අදාළ ආයතන මගින් පවත්වනු ලබන රැස්වීම්, වැඩමුළු සහ ක්ෂේත්‍ර පරීක්ෂණ වලට සහභාගිවී ඇත.
- වනජීවී සංරක්ෂණ, වනෝද්‍යාන සහ උද්භිද උද්‍යාන සම්බන්ධ පොදු කටයුතු සිදු කර ඇත.
- ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට සත්ත්ව විශේෂ අල්ලා ගැනීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අවශ්‍ය අනුමැතිය ලබා දීමට කටයුතු කර ඇත.
- බැම්බු උද්‍යානයක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය සහ අධීක්ෂණය කිරීම සිදු කර ඇත.
- රජරට නවෝදය - ජනපති වැඩසටහන ක්‍රියාත්මක කරවීම සඳහා, අවශ්‍ය අවස්ථා වල දී අමාත්‍යාංශයේ සහය ලබා දී ඇත.
- හීලෑ අලි ඇතුන් විධිමත් කිරීම සම්බන්ධව නීති රෙගුලාසි හා නිර්නායකයන් සකස් කර අමාත්‍ය මණ්ඩල සංදේශ මගින් අනුමත කරවා ගෙන ඇත.
- අලි ඇතුන් සඳහා වූ ඉල්ලීම් දිස්ත්‍රික්ක අනුව වෙන් වශයෙන් හඳුනාගෙන අලි ඇතුන් ලබාදිය යුතු ස්ථාන/ පුද්ගලයින් නිශ්චය කර ගැනීමට ඉල්ලීම් කර ඇති පුද්ගලයින් ස්ථාන සම්බන්ධයෙන් තොරතුරු රැස් කර ඇත.

## 1.7. තිරසර සංවර්ධන අංශය

### 1.7.1. හැඳින්වීම

තිරසර සංවර්ධන සහ වනජීවී අමාත්‍යාංශය ස්ථාපනය කිරීම තුළින් මෙරට තිරසර සංවර්ධන අවශ්‍යතා සහ උපමානයන් සම්බන්ධීකරණය පිණිස වූ සමෝධානිත අවස්ථාවක් ඇති කරලයි.

තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ මූලික මෙහෙවර වන්නේ සමෝධායික ප්‍රවේශයක්, අන්තර් අමාත්‍යාංශ/ ආයතන යාන්ත්‍රණයක් සහ පාර්ශවකරුවන්ගේ පුළුල් සහභාගිත්වය තුළින් පාරිසරික, සාමාජයීය සහ ආර්ථික තිරසාරභාවය සහතික කරලීම උදෙසා සංවර්ධන අභියෝගයන් මෙහෙයවීම පිණිස වන ප්‍රතිපත්ති, උපායමාර්ග, යාන්ත්‍රණයන් සහ ක්‍රම ශිල්පයන් පිළිබඳ සම්බන්ධීකරණය සිදු කිරීමයි.

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රය සහ තිරසර සංවර්ධන අභිමතාර්ථයන් (SDG's) ජාතික මට්ටමින් ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සහ පහසුකම් සැලසීම සිදු කරන කේන්ද්‍රීය ජාතික මට්ටමේ ආයතනය වන්නේ තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයයි.

තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය විසින් තිරසර සංවර්ධන අංශයක් ස්ථාපනය කර තිබෙන අතර එමඟින් ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන අභිමතාර්ථයන් ඉටු කරලීම පිණිස වන ප්‍රතිපත්තිමය සහ ආයතනික රාමුවක් සහ ක්‍රමෝපායික හා කාර්යය සැලැස්මක් සඳහා වන ජාතික තිරසර සංවර්ධන සැලැස්මක් සැකසීමේ කාර්යය මේ වනවිට ආරම්භ කර තිබේ.

### 1.7.2. කාර්යභාරය

- අවශ්‍ය තිරසර සංවර්ධන ප්‍රතිපත්ති, ක්‍රමෝපායන්, වැඩසටහන්, යාන්ත්‍රණයන් සහ ක්‍රම ශිල්පයන් සැකසීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම ඇතුළු තිරසර සංවර්ධන ක්‍රියාකාරකම් හා මැදිහත් වීම් සිදු කිරීමේ කේන්ද්‍රීය ආයතනය ලෙස කටයුතු කිරීම.
- තිරසර සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තීන් ක්‍රියාවට නැංවීමට අවශ්‍ය ප්‍රමුඛතා හඳුනා ගැනීම හා යාන්ත්‍රණයන් ගොඩනැඟීම පිණිස ජාතික මට්ටමේ සහ ඉන් පහළ මට්ටමේ අදාල ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම හා ඒ සඳහා සහාය දැක්වීම.
- තිරසර සංවර්ධන හා සම්බන්ධ පර්යේෂණ සඳහා පහසුකම් සැලසීම හා එම පර්යේෂණ ප්‍රතිඵල, ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ හා ක්‍රියාවට නැංවීම පිණිස යොමු කිරීම.
- තිරසර සංවර්ධන 2030 න්‍යාය පත්‍රය සහ තිරසර සංවර්ධන අභිමතාර්ථයන් සඳහා වන ජාතික හා ජාත්‍යන්තර කැපවීම සම්බන්ධයෙන් අධීක්ෂණය, ඇගයීම හා වාර්තා කිරීම ඇතුළු පහසුකම් සැලසීම හා සම්බන්ධීකරණය.

## 1.7.3. 2017.12.31 දිනට කාර්ය සාධනය

### 1.7.3.1. දැනුවත් කිරීමේ වැඩමුළු

| අනු අංකය | වැඩසටහන | දිනය | ස්ථානය | සහභාගීත්වය | අරමුණ |
|---|---|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකාව තුල තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාවට නැංවීම සඳහා වන අභියෝග, ප්‍රතිපත්ති, ක්‍රමෝපායන් සහ වැඩසටහන් පිළිබඳ උපදේශන වැඩමුළුව | 2017.02.16 | සෙත්සිරිපාය II වන අදියර, ශ්‍රවණාගාරය | ශ්‍රී ලංකාව තුල තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාවට නැංවීම සඳහා ආයතන සම්බන්ධීකරණය කර ගැනීම සඳහා නම් කරන ලද ප්‍රධාන කේන්ද්‍රීය නිලධාරීන්(Focal Point Officers), සියලුම දිස්ත්‍රික්කවල අධ්‍යක්ෂවරුන් (සැලසුම්) / පළාත් මට්ටමින් සියලු නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් | ශ්‍රී ලංකාව තුල තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාවට නැංවීම සඳහා ආයතන සම්බන්ධීකරණය කර ගැනීම පිළිබඳව සාකච්ඡා කිරීම. |
| 02. | SDG 14 සම්බන්ධ වැඩසටහන | 2017.05.25 සහ 2017.05.26 | Club Palm Bay Marawila හෝටලය | එක්සත් ජාතීන්ගේ සාගර සමුළුවට ශ්‍රීලංකාවේ ක්ෂේත්‍රයේ මැදිහත්වීම ඉදිරිපත්කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) මූල්‍ය අනුග්‍රහය යටතේ SDG 14 සම්බන්ධව(තිරසර සංවර්ධනය පිණිස සාගර, මුහුදු හා සාගර සම්පත් සංරක්ෂණය හා ධරණීය භාවිතය සම්බන්ධව)සියලුම පාර්ශවකාර ආයතන | SDG 14 ක්‍රියාත්මක කිරීමට ඉටු කල යුතු කාර්යයන් හා එම කාර්යයන් සිදුකල යුතු ආයතන හඳුනාගැනීම. |
| 03 | තිරසර සංවර්ධනය පිළිබඳ උපාය මාර්ගික සැලසුම් සකස් කිරීමේ වැඩමුළුව | 2017.08.29 | බත්තරමුල්ල Water's Edge | දෙපාර්තමේන්තු වල ප්‍රධානීන් | තිරසර සංවර්ධන අභිමථාර්තයන් ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක කිරීමේදී විවිධ කාර්යයන් සිදුකල යුතු ප්‍රධාන පාර්ශවකරුවන් හඳුනාගැනීම සහ මෙම සංවර්ධන ඉලක්කයන් ශ්‍රී ලංකාව තුල ක්‍රියාකල යුතු ක්‍රමවේද පිළිබඳව එකඟතාවයක් ලබා ගැනීම. |
| 04. | "පරිණාමීය දේශීයකරණය" තේමාවෙන් යුත් දෙවන තිරසර සංවර්ධන පළාත් සහභාගීත්ව මණ්ඩපය" | 2017.08.31 | කුරුණෑගල Blue Sky හෝටලය | වයඹ පළාත් සභාවේ මන්ත්‍රීවරුන් සහ පළාත් පාලන ආයතන මන්ත්‍රීවරුන්, සියලුම ජොෂ්ඨ රාජ්‍ය නිලධාරීන් දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන්, දිස්ත්‍රික් සැලසුම්කරණයට අදාළ නිලධාරීන්, විශ්වවිද්‍යාල වල තිරසර සංවර්ධන විෂයට අදාල කථිකාචාර්යවරුන්, වාණිජ මණ්ඩල නියෝජිතයින් සහ තිරසර සංවර්ධනය පිළිබඳව කටයුතු කරන සිවිල් සංවිධාන ක්‍රියාකාරීන් | වයඹ පළාත් තිරසර සංවර්ධන සැලැස්ම සකස් කිරීම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 05. | මොණරාගල දිස්ත්‍රික් තිරසර සංවර්ධන සැලැස්ම සකස් කිරීම | 201711.04.. | කුරුණෑගල "hotel Ruby" | දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරුන් සහ පළාත් පාලන ආයතන මන්ත්‍රීවරුන්, සියලුම ජොෂ්ඨ රාජ්‍ය නිලධාරීන් දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන්, දිස්ත්‍රික් සැලසුම්කරණයට අදාළ නිලධාරීන්, විශ්ව විද්‍යාලවල තිරසර සංවර්ධන විෂයට අදාල කථිකාචාර්යවරුන්, වාණිජ මණ්ඩල නියෝජිතයින් සහ තිරසර සංවර්ධනය පිළිබඳව කටයුතු කරන සිවිල් සංවිධාන ක්‍රියාකාරීන් | මොණරාගල දිස්ත්‍රික් තිරසර සංවර්ධන සැලැස්ම සකස් කිරීම. |

## 1.7.3.2. ක්‍රියාකාරකම්

| අනු අංකය | ක්‍රියාකාරකම් | දිනය | ස්ථානය | සහභාගීත්වය | අරමුණ |
|---|---|---|---|---|---|
| 01. | තිරසර සංවර්ධන අරමුණු 17 ඇතුලත් පොත් මුද්‍රණය. | 2017 මාර්තු | - | - | පාසල් සිසුන් හා අනෙකුත් පාර්ශවයන් වෙත දැනුම පුළුල් කිරීම. |
| 02. | තිරසර සංවර්ධන සැලැස්ම පිළිබඳ දැනුවත් කිරීම සඳහා මාධ්‍ය සාකච්ඡාව. | 2017.06.05 | අමාත්‍යාංශ ශ්‍රවණාගාරය | ගරු අමාත්‍යතුමා, අමාත්‍යාංශ නිලධාරීන් හා මාධ්‍යවේදීන් | තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සම්බන්ධව මාධ්‍ය හමුවක් ඔස්සේ ජනතාව වෙත මෙම පණිවිඩය ව්‍යාප්ත කිරීමට අවස්ථාව ලබා ගැනීම හා The draft Institutional mandates handbook සහ Institutional Architecture for implementing SDGs in Sri Lanka යන ග්‍රන්ථ එළි දැක්වීම. |

| අනු අංකය | ක්‍රියාකාරකම් | දිනය | ස්ථානය | සහභාගීත්වය | අරමුණ |
|---|---|---|---|---|---|
| 03. | රජයේ ආයතන වලට අදාල තිරසර සංවර්ධන ඉලක්ක ඇතුලත් ලේඛනයක් නිර්මාණය කිරීම. | 2017 ජුනි | - | - | රජයේ ආයතන වලට අදාල තිරසර සංවර්ධන ඉලක්ක අමාත්‍ය මණ්ඩලයේ අවධානයට යොමු කිරීම.තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු 03හි තිරසර සංවර්ධන සැලැස්මේ පිටපතක් ද අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම. |
| 04 | තිරසර සංවර්ධනය පිළිබඳ උපදේශන කමිටු රැස්වීම | 2017.09.21 | අමාත්‍යාංශ ශ්‍රවණාගාරය | ලේකම්තුමා ඇතුළු පාර්ශවකරුවන් | තිරසර සංවර්ධන අරමුණු ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය උපදෙස්, යෝජනා ලබා ගැනීම සඳහා. |
| 05 | තිරසර සංවර්ධනය පිළිබඳ දෙවන උපදේශන කමිටු රැස්වීම | 2017.10.19 | අමාත්‍යාංශ ශ්‍රවණාගාරය | උපදේශන කමිටු සාමාජිකයින් | තිරසර සංවර්ධන අරමුණු ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය උපදෙස්, යෝජනා ලබා ගැනීම සඳහා. |
| 06 | තිරසර සංවර්ධනය පිළිබඳ කාර්යභාරය හා වගකීම් හඳුනාගැනීම සඳහා වූ රැස්වීම. | 2017.10.27 | අමාත්‍යාංශ ශ්‍රවණාගාරය | උපදේශන කමිටු සාමාජිකයින් | තිරසර සංවර්ධනය පිළිබඳ කාර්යභාරය හා වගකීම් හඳුනාගැනීම. |
| 07 | තිරසර සංවර්ධනය පිළිබඳ තෙවන උපදේශන කමිටු රැස්වීම | 2017.11.28 | අමාත්‍යාංශ ශ්‍රවණාගාරය | උපදේශන කමිටු සාමාජිකයින් | තිරසර සංවර්ධන අරමුණු ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය උපදෙස්, යෝජනා ලබාගැනීම සඳහා. |
| 08. | තිරසර සංවර්ධනය පිළිබඳ විශේෂ උපදේශන කමිටු රැස්වීම | 2017.12.13 | අමාත්‍යාංශ ශ්‍රවණාගාරය | උපදේශන කමිටු සාමාජිකයින් | ස්වේච්ඡා ජාතික සමාලෝචන වාර්තාව සැකසීමට යෝජනා ලබා ගැනීම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 09. | ස්වේච්ඡා ජාතික සමාලෝචනය (VNR) | | | | උපදේශකවරුන් පත් කිරීම සඳහා Concept paper සකස් කිරීම |

### 1.7.3.3. විදේශ වැඩමුළු සඳහා සහභාගි වීම

| අනු අංකය | වැඩමුළු | දිනය | ස්ථානය | සහභාගීත්වය | අරමුණ |
|---|---|---|---|---|---|
| 01. | තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය සඳහා ක්‍රියාත්මක කිරීම | 2016.04.03/04 /05 | තායිලන්තයේ බැංකොක් නුවර | ගරු අමාත්‍යතුමා | මෙරට තිරසර සංවර්ධනය න්‍යාය පත්‍රය සහ එය ක්‍රියාත්මක කිරීමේ වැඩපිළිවෙල සඳහා කරුණු සාකච්ඡා කිරීම. |

### 1.7.3.4. ප්‍රාදේශීය වැඩසටහන්

| අනු අංකය | වැඩසටහන | දිනය | ස්ථානය | සහභාගීත්වය | අරමුණ |
|---|---|---|---|---|---|
| 01. | තිරසර සංවර්ධන ගම්මාන සැලසුම්කරන වැඩසටහන-පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | 2017 මැයි | රන්දෙණිගල පුහුණු මධ්‍යස්ථානය | පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රාජ්‍ය නිලධාරීන්, තෝරා ගත් ගම් වැසියන්(මාකඳුර ඉහල,මාකඳුර පහල,පටුගම්පල) | තිරසර ගම්මාන සැලසුම්කරණ වැඩසටහන සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම. |
| 02. | තිරසර සංවර්ධන ගම්මාන සැලසුම්කරන වැඩසටහන-පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | 2017 සැප්තැම්බර් | රන්දෙණිගල පුහුණු මධ්‍යස්ථානය | පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රාජ්‍ය නිලධාරීන්, තෝරා ගත් ගම් වැසියන් (පන්නල කුඹුර,මූකලාන,හෙන්ඩියගල,වෙල්පල්ල,මැල්ලවලාන, මාගොලව,උඩුගම) | තිරසර ගම්මාන සැලසුම්කරණ වැඩසටහන සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම. |
| 03. | තිරසර සංවර්ධන ගම්මාන සැලසුම්කරන වැඩසටහන-පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | 2017 නොවැම්බර් | රන්දෙණිගල පුහුණු මධ්‍යස්ථානය | පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රාජ්‍ය නිලධාරීන්, තෝරා ගත් ගම් වැසියන් | තිරසර ගම්මාන සැලසුම්කරණ වැඩසටහන සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම |

## 1.7.3.5. පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහන්

| අනු අංකය | වැඩසටහන | දිනය | ස්ථානය | සහභාගීත්වය | අරමුණ |
|---|---|---|---|---|---|
| 01. | තිරසර සංවර්ධන අභිමථාර්ත පිළිබඳ පුහුණු වැඩමුළුව | 201710.19/21. | "Heritance Hotel" මීගමුව | වයඹ පළාත්, ඌව පළාත්, සබරගමු පළාත් හා මධ්‍යම පළාතේ සියළුම අමාත්‍යාංශ වල සැලසුම් අධ්‍යක්ෂක වරුන්, දිස්ත්‍රික් සැලසුම් අධ්‍යක්ෂක වරුන් හා විශ්වවිද්‍යාලවල කථිකාචාර්ය වරුන් | තිරසර සංවර්ධන අභිමථාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා දිස්ත්‍රික් හා පළාත් මට්ටමින් සංවර්ධන සැලසුම් සකස් කිරීම හා සියළු පළාත් හා දිස්ත්‍රික්ක වල ක්‍රියාකාරී පුහුණු කරුවන්ගේ සංචිතයක් ඇති කිරීම. |
| 02. | තිරසර සංවර්ධන අභිමථාර්ත පිළිබඳ පුහුණු වැඩමුළුව | 201711.09/11. | "Jetwing Blue Hotel" මීගමුව | උතුරු මැද පළාත්, දකුණු පළාත් හා බස්නාහිර පළාතේ සියළුම අමාත්‍යාංශ වල සැලසුම් අධ්‍යක්ෂකවරුන්, දිස්ත්‍රික් සැලසුම් අධ්‍යක්ෂක වරුන් හා විශ්වවිද්‍යාලවල කථිකාචාර්ය වරුන් | තිරසර සංවර්ධන අභිමථාර්ත සාක්ෂාත් කර ගැනීම සඳහා දිස්ත්‍රික් හා පළාත් මට්ටමින් සංවර්ධන සැලසුම් සකස් කිරීම හා සියළු පළාත් හා දිස්ත්‍රික්ක වල ක්‍රියාකාරී පුහුණු කරුවන්ගේ සංචිතයක් ඇති කිරීම. |

# 1.8. මුදල් අංශය

## 1.8.1. හැඳින්වීම

අමාත්‍යාංශයේ මුදල් අංශය ගෙවීම්, ප්‍රසම්පාදන, ගබඩා හා වත්කම් කළමනාකරණ, ගිණුම් වශයෙන් අංශ 4 කින් සමන්විත වේ. පාර්ලිමේන්තු මූල්‍ය පාලනය උත්තරදායි බව හා බැඳුණු තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ ලේකම් විසින් ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා ලෙස ඉටු කළ යුතු අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල මූල්‍ය පාලන කාර්යභාරයට අවශ්‍ය සෘජු සහාය දැක්වීම මෙම අංශයේ ප්‍රධාන කාර්යය හා කර්තව්‍යයයි. ඒ අනුව අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල මූල්‍ය පාලන කටයුතු සැලසුම් කිරීම, සංවිධානය කිරීම, මෙහෙයවීම හා ඊට අදාළ පාලන කටයුතු මෙම අංශය මඟින් ඉටුකරනු ලබයි.

වාර්ෂික අයවැය ලේඛනය හා විසර්ජන ගිණුමට අදාළ වන ආදායම් හා වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ඒවා මහා භාණ්ඩාගාරයේ අදාළ දෙපාර්තමේන්තු සමඟ සම්බන්ධීකරණය කිරීම, වාර්ෂික මුදල් ප්‍රවාහ පාලනය, ප්‍රසම්පාදන කටයුතු, ගබඩා හා වත්කම් කළමනාකරණය, ගෙවීම් කටයුතු සංවිධානය හා ගෙවීම් කිරීම, කාලීන මූල්‍ය වාර්තා හා මූල්‍ය ප්‍රකාශන ඇතුළුව විසර්ජන ගිණුම පිළියෙල කිරීම සහ විගණකාධිපති හා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හා සම්බන්ධ කටයුතු අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සම්බන්ධයෙන් ක්‍රියා කිරීම මෙම අංශය මඟින් සිදුකරනු ලබයි.

## 1.8.2. කාර්යභාරය

- වාර්ෂික විසර්ජන පනතින් බලය ලැබූ වියදම් මුදල් රෙගුලාසි, අණපනත්, චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කරමින් කළමනාකරණය කිරීම.
- විගණකාධිපතිට හා මහා භාණ්ඩාගාරයට අවශ්‍ය මාසික, ත්‍රෛමාසික, අර්ධ වාර්ෂික හා වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම.
- විසර්ජන ගිණුම ඇතුළු අවසාන ගිණුම් සැකසීම හා ඉදිරිපත් කිරීම.
- ගබඩා හා වත්කම් කළමනාකරණය.
- වාර්ෂික වියදම් හා ආදායම් ඇස්තමේන්තු සැකසීම.
- අමාත්‍යාංශයට අදාළ වැටුප්, පොදු තැන්පත් ඇතුළු සියළුම මූලධන හා පුනරාවර්තන ගෙවීම් කටයුතු ඉටු කිරීම හා වියදම් කළමනාකරණය කිරීම.
- අමාත්‍යාංශයෙහි හා අමාත්‍යාංශය යටතේ පවත්නා දෙපාර්තමේන්තු හා ආයතනවල ප්‍රසම්පාදන කමිටු පත්කිරීම හා අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කාර්යයන් ඉටු කිරීම හා අධීක්ෂණය.
- අමාත්‍යාංශයේ හානි හා පාඩු පිළිබඳ ගිණුම් කටයුතු හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල හානි හා පාඩු වාර්තා සැකසීම, වාර්තා කිරීම, සැසඳීම හා විගණකාධිපතිට ඉදිරිපත් කිරීම.

- අමාත්‍යාංශයට අදාළ රාජ්‍ය ගිණුම් කාරක සභා හා රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කාරක සභා කටයුතු ඉටු කිරීම හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල ගිණුම් කාරක සභා කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- අමාත්‍යාංශයෙහි මාසික හා වාර්ෂික ගිණුම් පිළියෙල කිරීම, අමාත්‍යාංශය යටතේ පවත්නා ආයතනවල වාර්ෂික ගිණුම් හා වාර්තා අධීක්ෂණය.
- රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ´බී` ගිණුමෙන් ණය ගෙවීම, ඒවා නිසි පරිදි අයකර ගැනීම හා ඊට අදාළ ගිණුම් පවත්වා ගැනීම.
- විගණකාධිපතිගේ විගණන විමසුම් සම්බන්ධ අමාත්‍යාංශ කටයුතු.
- වාර්ෂික මුදල් ප්‍රවාහ කටයුතු, ප්‍රධාන අග්‍රිම, අතුරු අග්‍රිම අධීක්ෂණය හා පාලනය, ගිණුම් තැබීම හා වාර්තා කිරීම.
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල අරමුදල් පාලන කටයුතු හා ගිණුම් කටයුතු පිළිබඳ අධීක්ෂණමය කාර්යයන් ඉටු කිරීම සහ ඒවායේ අයවැය හා වාර්ෂික ගිණුම් පිළිබඳ කටයුතු.

## තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය

2017 වර්ෂයේ වියදම

| වැය විෂයය | වැය විස්තරය | 2017 ඇස්තමේන්තුව (රු.) | අතිරේක ප්‍රතිපාදන (රු.) | මු.රෙ 66 මාරු කිරීම් (රු.) | ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව (රු.) | 2017.12.31 දිනට වියදම(රු.) | ප්‍රතිපාදන ඉතිරිවීම්(රු.) | ප්‍රගතිය(%) |
|---|---|---|---|---|---|---|---|---|
| | **එකතුව** | **176,171,000** | **2,046,000** | **1,128,100** | **177,820,100** | **174,225,503.53** | **3,594,596.47** | |
| 1001 | වැටුප් හා දීමනා | 36,500,000 | 2046000 | 7,715,400 | 46,261,400 | 46,218,373.35 | 43,026.65 | **100** |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 5,550,000 | 0 | 659,600 | 6,209,600 | 6,030,049.85 | 179,550.15 | **97** |
| 1003 | වෙනත් දීමනා | 36,000,000 | 0 | -9,617,100 | 26,382,900 | 26,379,551.53 | 3,348.47 | **100** |
| 1101 | දේශීය ගමන් වියදම් | 1,640,000 | 0 | 212,000 | 1,852,000 | 1,796,915.33 | 55,084.67 | **97** |
| 1102 | විදේශීය ගමන් | 3,000,000 | 0 | 196,400 | 3,196,400 | 3,194,425.96 | 1,974.04 | **100** |
| 1201 | ලිපිද්‍රව්‍ය | 3,500,000 | 0 | 380,000 | 3,880,000 | 3,880,000.00 | - | **100** |
| 1202 | ඉන්ධන | 13,800,000 | 0 | -2,450,700 | 11,349,300 | 11,336,009.44 | 13,290.56 | **100** |
| 1203 | ආහාර පාන හා නිල ඇඳුම් | 180,000 | 0 | 0 | 180,000 | 179,629.73 | 370.27 | **100** |
| 1205 | වෙනත් | 2,000,000 | 0 | -1,314,500 | 685,500 | 685,475.56 | 24.44 | **100** |
| 1301 | වාහන | 7,300,000 | 0 | 3,656,200 | 9,834,200 | 9,792,270.03 | 41,929.97 | **100** |
| 1302 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 2,000,000 | 0 | -702,000 | 1,298,000 | 1,296,522.66 | 1,477.34 | **100** |
| 1303 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 800,000 | 0 | -777,400 | 22,600 | 22,600.00 | - | **100** |
| 1401 | ප්‍රවාහන | 5,600,000 | 0 | 72,1000 | 5,672,100 | 5,661,819.32 | 10,280.68 | **100** |
| 1402 | තැපැල් හා සන්නිවේදන | 2,000,000 | 0 | 2,130,000 | 4,130,000 | 3,923,777.58 | 206,222.42 | **95** |
| 1403 | විදුලිය හා ජලය | 200,000 | 0 | 38,6000 | 238,600 | 238,100.74 | 499.26 | **100** |
| 1404 | කුලී හා දේශීය බදු | 51,301,000 | 0 | 0 | 51,301,000 | 48,267,222.30 | 3,033,777.70 | **94** |
| 1409 | වෙනත් | 4,000,000 | 0 | 886,3000 | 4,886,300 | 4,886,196.58 | 103.42 | **100** |
| 1506 | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | 600,000 | 0 | -270,0000 | 330,000 | 326,440.07 | 3,559.93 | **99** |
| 1701 | පාඩු හා කපා හැරීම් | 0 | | 29,000 | 29,000 | 29,000.00 | - | **100** |
| 1703 | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම | 200,000 | | -118,800 | 81,200 | 81,123.50 | 76.50 | **100** |
| | **එකතුව** | **74,050,000** | **28,000,000** | **396,900** | **59,446,900** | 27,295,487 | **32,151,413.44** | |
| 2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 1,200,000 | 0 | 800,000 | 2,000,000 | 1,693,248.40 | 306,751.60 | **85** |
| 2002 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 850,000 | 0 | 0 | 850,000 | 579,917.29 | 270,082.71 | **68** |
| 2003 | වාහන | 4,200,000 | 0 | 435,200 | 4,635,200 | 4,634,629.77 | 570.23 | **100** |
| 2101 | වාහන* | 43,000,000 | 25,000,000 | 0 | 25,000,000 | - | 25,000,000.00 | **0** |
| 2102 | ලී බඩු හා කාර්යාල උපකරණ | 2,000,000 | 0 | -1,385,700 | 3,385,700 | 3,376,279.17 | 9,420.83 | **100** |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1,800,000 | 3,000,000 | -1,800,000 | 3,000,000 | 2,997,055.25 | 2,944.75 | **100** |
| 2401 | කාර්යය මණ්ඩල පුහුණු | 1,000,000 | 0 | 0 | 1,000,000 | 713,402.55 | 286,597.45 | **71** |
| 1 2501 | තිරසර සංවර්ධනය | 12,500,000 | 0 | -424,000 | 12,076,000 | 8,843,933.56 | 3,232,066.44 | **73** |
| 2 2501 | උතුරු පළාත් සංවර්ධන වැඩසටහන | 5,000,000 | 0 | 0 | 5,000,000 | 1,980,168.50 | 3,019,831.50 | **40** |
| 3 2501 | පුත්තලම සංවර්ධන වැඩසටහන | 2,500,000 | 0 | 0 | 2,500,000 | 2,476,852.07 | 23,147.93 | **99** |
| | **එකතුව** | **250,221,000** | **30,046,000** | **1,525,000** | **237,267,000** | **201,520.990** | **35,746,010** | |

වාහන සඳහා රු.මි. 18.604 ඇණවුම් කර ඇත.අත්මුදල් නොලැබීම නිසා වියදම් ලෙස ගිණුම් ගත කර නොමැත.මේ පිළිබඳව භාන්ඩාගාර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට හා හා.මේ.දෙ. ලිපි යවා ඇත.

## 1.9. අභ්‍යන්තර විගණන අංශය

### 1.9.1. හැඳින්වීම

මුදල් රෙගුලාසි 133 හි දැක්වෙන අභ්‍යන්තර විගණන පරමාර්ථ ඉටුවන පරිදි ස්ථාපිත කර ඇති අභ්‍යන්තර විගණන අංශය අමාත්‍යාංශයේ මූල්‍ය හා මෙහෙයුම් කටයුතු පිළිබඳව ක්‍රියාත්මක වන අභ්‍යන්තර පාලන ක්‍රම වල කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය ඇගයීම සඳහා නිරන්තර සෝදිසි පරීක්ෂණ සිදු කරනු ලැබේ. වාර්ෂික විගණන සැලැස්ම පරිදි අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන කටයුතු හා විශේෂ විමර්ශන කටයුතු ඉටුකරන අතරම අමාත්‍යාංශය යටතට ගැනෙන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් අමාත්‍යාංශය වෙනුවෙන් විශේෂ පරීක්ෂණ කටයුතු මෙහෙය වීමද සිදුකරනු ලැබේ.

### 1.9.2. කාර්යභාරය

- අමාත්‍යාංශයේ මුදල් කටයුතු පිළිබඳ අභ්‍යන්තර පාලන ක්‍රමය පරීක්ෂා කර වැරදි හා වංචා වැළැක්වීම සඳහා අමාත්‍යාංශ තුළ ක්‍රියාත්මක වන අභ්‍යන්තර සෝදිසි හා පාලන ක්‍රමය නිරන්තර සමීක්ෂණය කිරීම ස්වාධීන ඇගයීමක් පවත්වා ගෙන යාම.

- ගිණුම් සහ වෙනත් වාර්තා වල විශ්වාසනීයභාවය නිශ්චය කිරීම සහ යොදා ගෙන ඇති ගිණුම් පිළිවෙත මඟින් නිවැරදි මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයේ දැයි සොයා බැලීම.

- කාර්යය මණ්ඩලයට පවරා දී ඇති වගකීම් ඉටුකිරීමෙහිලා ඔවුන්ගේ කාර්යය සාධනයෙහි ගුණාත්මකභාවය ඇගයීම.

- අමාත්‍යාංශයේ වත්කම් , සියලුම ආකාරයේ අලාභ හානිවලින් කොතරම් දුරට ආරක්ෂා කර ඇත්දැයි සොයාබැලීම.

- රජයේ ආයතන සංග්‍රහය , රජයේ මුදල් රෙගුලාසි සහ රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශ විසින් සහ භාණ්ඩාගාර විසින් වරින්වර නිකුත් කර ඇති වෙනත් පරිපූරක උපදෙස්ද පිළිපැද තිබේදැයි සොයා බැලීම.

- නාස්තිය සහ පමණ ඉක්මවා කෙරෙන වියදම් වැළැක්වීමට මෙන්ම අනාවරණය කර ගැනීමට තෝරා ගනු ලබන අභ්‍යන්තර පාලන ක්‍රමයේ සාර්ථකත්වය සොයා බැලීම.

- අමාත්‍යාංශයේ ගිණුම් පටිපාටිය සහ කිසියම් මුදල් වැය වීමකට තුඩුදෙන එකී මෙහෙයුම් පරීක්ෂා කිරීම සහ අමාත්‍යාංශයේ දේපල හා වත්කම් ආරක්ෂාකාරී ලෙස අරපිරිමැස්මෙන් යුතුව විධිමත් ලෙස පරිහරණය කරන්නේ දැයි සොයා බැලීම.

- අමාත්‍යාංශය සඳහා විගණන කළමනාකරණ කමිටු පැවැත්වීම.

- අවශ්‍ය අවස්ථා වලදී විශේෂ විමර්ෂණ පැවැත්වීම.

## 1.9.3. 2017.12.31 දිනට කාර්ය සාධනය

### 1.9.3.1. අභ්‍යන්තර විගණන විමසුම්

1. තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය
   - අත්තිකාරම් බී ගිණුම් හා වවුචර් පරීක්ෂාව
   - දෛනික ධාවන සටහන් හා වවුචර් පරීක්ෂාව
   - පෞද්ගලික ලිපිගොනු පරීක්ෂාව
   - නිවාඩු ලිපිගොනු පරීක්ෂාව
   - වවුචර් පරීක්ෂාව
   - දෛනික ධාවන සටහන් පොත් හා ලිපිගොනු පරීක්ෂාව
   - අමාත්‍යාංශ නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම් පරීක්ෂාව
   - අමාත්‍යාංශයේ සංවර්ධන හා පරිපාලන ඌණතා මගහරවා ගැනීම.

2. ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව
   - පින්නවල අලි අනාථාගාරයේ ගබඩා පාලනය

### 1.9.3.2. විශේෂ පරීක්ෂණ

| කාර්තුව | ආයතනය | ඉටු කල කාර්යය |
|---|---|---|
| පළමුවන | ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව | පින්නවල අලි අනාථාගාරයේ අලි වසුරු හා කුණුරොඩු බැහැර කිරීම පිළිබඳ පරීක්ෂාව |
| දෙවන | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | යාල ජාතික උද්‍යානයේ විශේෂ පරීක්ෂණය |
| තෙවන | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | කීර්තිබණ්ඩාරපුර අඩවි ආරක්ෂක කාර්යාලයේ විශේෂ පරීක්ෂණය |
| සිව්වන | වනජීවී භාරය | වනජීවී භාරයේ කටයුතු පිළිබඳ විශේෂ පරීක්ෂණය |

### 1.9.3.3. පරීක්ෂණ

| කාර්තුව | ආයතනය | ඉටු කල කාර්යය |
|---|---|---|
| පළමුවන | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | • වන සත්ත්ව සංරක්ෂණ අරමුදලේ 2016 සංශෝධිත අයවැය ඇස්තමේන්තුව<br>• මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතියේ වනජීවී සංරක්ෂණ කටයුතු වලට අදාල අවබෝධතා ගිවිසුම් මත සපයන ලද මූල්‍ය ප්‍රතිපාදන පියවීම සම්බන්ධ පරීක්ෂාව |
| | ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව | • පින්නවල සත්වෝද්‍යානයේ හංසයන් සඳහා කූඩුවක් සෑදීම පිළිබඳ පරීක්ෂණය |
| තෙවන | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | • කවුඩුල්ල හා මින්නේරිය ජාතික වනෝද්‍යාන පරීක්ෂාව<br>• කටුකැලියාව හා වැලිකන්ද බීට්ටු කාර්යාල පරීක්ෂාව |
| සිව්වන | වනජීවී භාරය | • වනජීවී භාරය සම්බන්ධයෙන් ලැබී ඇති පෙත්සම්වල අඩංගු තොරතුරු පරීක්ෂාව |

### 1.9.3.4. විගණන කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම

රැස්වීම් - 04 ( මැයි, ජූලි,ඔක්තෝම්බර් හා දෙසැම්බර් යන මාස වලදී රැස්වීම් පවත්වන ලදී.)

## 1.10. නීති අංශය

### 1.10.1. කාර්යභාරය

- තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය සහ ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු සම්බන්ධව අමාත්‍යාංශය විසින් ඉටු කළ යුතු නීති කටයුතු ඉටු කිරීම.

- 1937 අංක 02 දරණ වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත (469 වන අධිකාරිය),1982 අංක 41 දරණ ජාතික සත්වෝද්‍යාන පනත හා 1928 අංක 31 දරණ ජාතික උද්භිද උද්‍යාන පනත යන පනත් සඳහා අවශ්‍ය වන්නා වූ රෙගුලාසි, නියෝග සහ සංශෝධන සකස් කිරීම සඳහා සහය ලබා දීම සහ එම සංශෝධන නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

- අමාත්‍යාංශය සහ දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් පවත්නා නඩු සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය කටයුතු කිරීම, නීතිපති දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන උපදේශනාත්මක සාකච්ඡාවට සහභාගී වීම සහ අවශ්‍ය නිරීක්ෂණ සකස්කර ඉදිරිපත් කිරීම.

- අමාත්‍යාංශය යටතේ පවත්නා දෙපාර්තමේන්තු වල ප්‍රමාද වී පවත්නා නීති කටයුතු කඩිනමින් නිම කිරීමට සහය ලබා දීම.

- එමෙන්ම අමාත්‍යාංශයට එරෙහිව හා අමාත්‍යාංශය වෙනුවෙන්ද අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු තුනෙහි නඩු, ගිවිසුම්, අධිකරණ කටයුතු වලට අදාල අනෙකුත් සියලු නඩු කටයුතු සම්බන්ධීකරණය කිරීම.

# 2. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

# දැක්ම

**වර්තමාන හා ඉදිරි පරම්පරාවන් උදෙසා වනජීවී සම්පත් දිගුකාලීනව සංරක්ෂණය කිරීම**

# මෙහෙවර

**සියල්ලන් හා එක්ව වෘත්තීමය කළමනාකරණයක් මඟින් වනජීවී සම්පත්වල සංරක්ෂණය සහතික කිරීම**

# කාර්යභාරය

- සියලුම භූගෝලීය, දේශගුණික හා ජෛව කලාප තුළ වනජීවී සම්පත්වල ප්‍රමාණවත් නියැදි ආවරණය වන පරිදි ශ්‍රී ලංකාවේ වනජීවී රක්ෂිත ජාලය ස්ථාපිත කිරීම මඟින් ඒවායේ දිගුකාලීන පැවැත්ම තහවුරු කිරීම.
- කෘෂිකර්මාන්තය හා ජල විදුලිය නිපදවීම සඳහා ජලය සපයන මහා පරිමාණ ජලාශයන්ගේ ජලපෝෂක ප්‍රදේශ ආරක්ෂා කර ගැනීම, ආගමික හා සංස්කෘතික උරුමයන් ආරක්ෂා කරගැනීම, ආවේණික හා දුලබ වනජීවී විශේෂයන් ආරක්ෂාකර ගැනීම, සුවිශේෂී පරිසර පද්ධතීන් ආරක්ෂා කරගැනීම වැනි විශේෂිත අරමුණු ඇති වනජීවී රක්ෂිත ප්‍රකාශයට පත් කර වනජීවී රක්ෂිත ජාලය තුළ නිසි ලෙස කළමනාකරණය කිරීම.
- අලින් වැනි වඳවීමේ තර්ජනයට ලක්ව සිටින දේශීය වනජීවී විශේෂයන් සංරක්ෂණය සඳහා සුදුසු ක්‍රමවේදයන් භාවිත කරමින් විශේෂ ව්‍යාපෘතීන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම මඟින් එම විශේෂයන් ගේ දිගු කාලීන පැවැත්ම සහතික කිරීම.
- වනජීවී රක්ෂිතවලින් බැහැර ප්‍රදේශවල ආරක්ෂිත වනජීවී විශේෂයන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම.
- තත්කාලීනව බලපවත්නා ජාතික වනජීවී ප්‍රතිපත්තිය හා නීතිය ඵලදායීව ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකා රජය විසින් අත්සන් තබා ඇති වනජීවී සංරක්ෂණය හා අදාල වඳවීමේ තර්ජනයට ලක් වූ විශේෂයන්ගේ ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ සම්මුතිය (CITES), ජාත්‍යන්තර වැදගත්කමක් ඇති තෙත් බිම් පිළිබඳ සම්මුතිය (Ramsar) හා සංක්‍රමණික වනසත්ත්ව විශේෂයන්ගේ සංරක්ෂණය පිළිබඳ සම්මුතිය (CMS - Bonn) යන ජාත්‍යන්තර සම්මුතීන් ක්‍රියාත්මක කිරීම සඳහා ලත් අධිකාරි බලය අනුව කටයුතු කිරීම.
- වනජීවී රක්ෂිත ආශ්‍රිතව පාරිසරික සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය මඟින් ජාතික ආර්ථිකයට එයින් ලබාදෙන දායකත්වය ප්‍රශස්ථ තලයක පවත්වා ගැනීම.
- වනජීවී සම්පත්වල සංරක්ෂණය හා විද්‍යාත්මක කළමනාකරණයක් සඳහා අවශ්‍ය දත්ත හා තොරතුරු රැස්කර ගැනීමට පර්යේෂණ කටයුතු ප්‍රවර්ධනය.
- ස්වභාව සම්පත් සංරක්ෂණය පරමාර්ථය කොටගත් වෙනත් ආයතන සමඟ අන්‍යෝන්‍ය අවබෝධය හා සහයෝගය වර්ධනය කර ගනිමින් සංරක්ෂණ ක්‍රියාදාමය ශක්තිමත් කර ගැනීම.
- සාමාන්‍ය මහජනතාව, රාජ්‍ය නිලධාරීන් හා වෙනත් කණ්ඩායම් අතර වනජීවී සංරක්ෂණය ව්‍යාප්ත කිරීමෙන් ඔවුන්ගේ දායකත්වය ඊට නොඅඩුව ලබා ගැනීම ඉලක්ක කර ගත් වනජීවී සංරක්ෂණ අධ්‍යාපනික වැඩසටහන් සැලසුම්කර ක්‍රියාත්මක කිරීම.
- වනජීවී රක්ෂිත තුළ ස්වභාව සම්පත් මත ඒ අවට පදිංචි ජනතාවගේ යැපීම අවම කර ගැනිම ඉලක්ක කොටගත් සමාජ ආර්ථික සංවර්ධන වැඩ සටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම.

# 2. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

## 2.1. හැඳින්වීම

ශ්‍රී ලංකාවට ඉතා විශාල ජෛව විවිධත්වයක් උරුම වී තිබෙන  ශාක සහ සත්ත්ව ප්‍රජාවන්ගෙන් ගහණ වූ පරිසර පද්ධතීන් ආරක්ෂා කරගැනීමෙහි මූලික වගකීම පැවරී ඇත්තේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට වේ. 1949 වර්ෂයේ දී ආරම්භ කරන ලද වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙහි මූලික කාර්යයභාරය වන්නේ ශ්‍රී ලංකාව තුළ වනජීවී සම්පත් සංරක්ෂණය කිරීමයි. ඒ අනුව ශ්‍රී ලංකාවෙහි සියලූම ප්‍රධාන ගංගාවන්ගේ මූලාශ්‍රයන් මෙන්ම කෘෂිකර්මාන්තය හා විදුලිය ජනනය සඳහා ජලය සපයන මහා පරිමාණ ජලාශයන් ඇතුළු ජලාශ 40 ක පෝෂක ප්‍රදේශයන් ආරක්ෂාව ලබන්නේ වනජීවී රක්ෂිත ජාලය තුළ ය. දිවයිනෙහි මුලු බිම් ප්‍රමාණයෙන් 14 %ක් ඉක්මවන එම වනජීවී රක්ෂිත ජාලය කළමනාකරණය කිරීමෙහි වගකීම දරන්නේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවයි.එම වනජීවී රක්ෂිත ජාලය විවිධ සංරක්ෂණ මට්ටම් යටතේ ප්‍රකාශයට පත් කරන ලද වනජීවී රක්ෂිත  වලින් සමන්විතය.













## 2.2. ජාතික උද්‍යාන සඳහා සංචාරක පැමිණීම සහ ආදායම - 2017

| මාසය | පැමිණීම | | | ආදායම (රු.මි.) | | | |
|---|---|---|---|---|---|---|---|
| | දේශීය | විදේශීය | එකතුව | දේශීය | විදේශීය | වෙනත් | එකතුව |
| ජනවාරි | 107,460 | 101,939 | 209,399 | 5.38 | 189.60 | 89.72 | 284.7 |
| පෙබරවාරි | 128,607 | 107,574 | 236,181 | 6.2 | 206.45 | 82.05 | 294.7 |
| මාර්තු | 91,854 | 83,245 | 175,099 | 3.49 | 168.60 | 73.44 | 245.53 |
| අප්‍රේල් | 168,641 | 78,201 | 246,842 | 8.28 | 147.71 | 67.40 | 223.39 |
| මැයි | 79,521 | 37,582 | 117,103 | 3.92 | 72.64 | 35.07 | 111.63 |
| ජුනි | 71,735 | 38,733 | 110,468 | 3.53 | 75.17 | 35.57 | 114.27 |
| ජූලි | 111,082 | 102,711 | 213,793 | 5.46 | 192.27 | 78.59 | 276.32 |
| අගෝස්තු | 208,983 | 123,002 | 331,985 | 9.74 | 230.13 | 91.76 | 331.63 |
| සැප්තැම්බර් | 130,848 | 56,651 | 187,499 | 5.98 | 102.17 | 50.24 | 158.39 |
| ඔක්තෝබර් | 90,799 | 59,220 | 150,019 | 4.16 | 110.72 | 48.12 | 163 |
| නොවැම්බර් | 77,732 | 62,867 | 140,599 | 3.82 | 120.46 | 54.32 | 178.6 |
| දෙසැම්බර් | 173,556 | 90,301 | 263,857 | 8.5 | 169.81 | 84.32 | 262.63 |
| **එකතුව** | **1,440,818** | **942,026** | **2,382,844** | **68.45** | **1,785.74** | **790.58** | **2,644.77** |

### 2.2.1. 2017 වසරේ සංචාරකයින්ගේ පැමිණීම




### 2.2.2. 2017 වසරේ සංචාරකයින්ගෙන් ලද ආදායම



## 2.2.3. ජාතික උද්‍යාන සඳහා සංචාරක පැමිණීම සහ ආදායම - 2017

| ජාතික උද්‍යානය | සංචාරක පැමිණීම | | | ආදායම (රු.මි.) | | | |
|---|---|---|---|---|---|---|---|
| | දේශීය | විදේශීය | එකතුව | දේශීය | විදේශීය | වෙනත් | එකතුව |
| යාල | 314,606 | 290,100 | **604,706** | 18.45 | 623.84 | 246.77 | **889.06** |
| හෝටන් තැන්න | 313,579 | 121,725 | **435,304** | 17.49 | 269.32 | 118.11 | **404.92** |
| උඩවලව | 170,849 | 159,532 | **330,381** | 9.31 | 344.50 | 146.49 | **500.30** |
| වස්ගමුව | 29,189 | 2,420 | **31,609** | 1.08 | 3.51 | 6.76 | **11.36** |
| මින්නේරිය | 103,006 | 95,797 | **198,803** | 5.80 | 207.25 | 75.03 | **288.07** |
| බුන්දල | 11,860 | 10,947 | **22,807** | 0.47 | 15.80 | 9.06 | **25.33** |
| හොරගොල්ල | 5,478 | 10 | **5,488** | 0.22 | 0.01 | 0.04 | **0.27** |
| කවුඩුල්ල | 107,961 | 122,788 | **230,749** | 4.24 | 178.63 | 87.59 | **270.46** |
| ලුණුගම්වෙහෙර | 5,787 | 3,344 | **9,131** | 0.24 | 4.40 | 5.14 | **9.77** |
| ගල්ඔය | 11,169 | 3,782 | **14,951** | 0.39 | 1.71 | 8.22 | **10.32** |
| කුමන | 31,494 | 7,251 | **38,745** | 1.07 | 10.72 | 10.57 | **22.36** |
| අංගම්මැඩිල්ල | 3,478 | 8 | **3,486** | 0.14 | 0.01 | 0.62 | **0.77** |
| ගැල්වේස්ලෑන්ඩ් | 6,085 | 350 | **6,435** | 0.23 | 0.48 | 0.11 | **0.81** |
| විල්පත්තු | 46,613 | 24,247 | **70,860** | 2.73 | 47.98 | 48.89 | **99.59** |
| මදුරුඔය | 2,984 | 304 | **3,288** | 0.14 | 0.52 | 1.04 | **1.70** |
| ලාහුගල | 296 | 30 | **326** | 0.01 | 0.04 | 0.73 | **0.79** |
| පරෙවි දූපත් | 79,531 | 25,128 | **104,659** | 3.13 | 35.83 | 19.09 | **58.05** |
| හික්කඩුව | 23,270 | 2,508 | **25,778** | 0.11 | 0.07 | 0.00 | **0.18** |
| උඩවලව ඇත් අතුරු සෙවන | 163,580 | 67,877 | **231,457** | 3.00 | 36.62 | 2.94 | **42.56** |
| වැලිපර අභයභූමිය | 9,578 | 3,837 | **13,415** | 0.19 | 4.44 | 2.04 | **6.67** |
| කලාවැව | 425 | 41 | **466** | 0.02 | 0.06 | 0.14 | **0.22** |
| කතරගම කාර්යය මණ්ඩල සංචාරක නිවාසය | 0.0 | | | | | 0.07 | **0.07** |
| චුණ්ඩිකුලම් සංචාරක නිවාසය | 0.0 | | | | | 0.32 | **0.32** |
| මහකනදරාව සංචාරක නිවාසය | 0.0 | | | | | 0.04 | **0.04** |
| මිහින්තලේ සංචාරක නිවාසය | 0.0 | | | | | 0.03 | **0.03** |
| රිටිගල දැඩි රක්ෂිතය | 0.0 | | | | | 0.00 | **0.00** |
| ගිරිතලේ ජාතික වනජීවී පර්.හා පුහුණු මධ්‍යස්ථානය | 0.0 | | | | | 0.31 | **0.31** |
| මිරිස්ස | 0.0 | | | | | 0.00 | **0.00** |
| නල්ලතන්නිය | 0.0 | | | | | 0.45 | **0.45** |
| එක්ගල්ඔය වනජීවී සංචාරක නිවාසය | 0.0 | | | | | 0.00 | |
| **එකතුව** | **1,440,818** | **942,026** | **2,382,844** | **68.45** | **1785.74** | **790.58** | **2644.77** |


## 2.2.4. 2016 සහ 2017 වර්ෂවල සංචාරකයින්ගේ පැමිණීම සහ ආදායම

| මාසය | පැමිණීම | | ආදායම (රු.මි.) | |
|---|---|---|---|---|
| | 2016 | 2017 | 2016 | 2017 |
| ජනවාරි | 156,634 | 209,399 | 186.85 | 284.70 |
| පෙබරවාරි | 192,193 | 236,181 | 225.09 | 294.70 |
| මාර්තු | 177,201 | 175,099 | 189.49 | 245.53 |
| අප්‍රේල් | 194,680 | 246,842 | 128.22 | 223.39 |
| මැයි | 78,376 | 117,103 | 75.2 | 111.63 |
| ජූනි | 76,707 | 110,468 | 83.49 | 114.27 |
| ජූලි | 198,613 | 213,793 | 242.62 | 276.32 |
| අගෝස්තු | 328,565 | 331,985 | 309.13 | 331.63 |
| සැප්තැම්බර් | 146,213 | 187,499 | 154.22 | 158.39 |
| ඔක්තෝබර් | 221,705 | 150,019 | 143.45 | 163.00 |
| නොවැම්බර් | 133,022 | 140,599 | 168.26 | 178.60 |
| දෙසැම්බර් | 289,241 | 263,857 | 229.68 | 262.63 |
| **එකතුව** | **2,193,150** | **2,382,844** | **2135.70** | **2,644.77** |


## 2.2.5. 2010 වසරේ සිට 2017 දක්වා සංචාරක පැමිණීම (දේශීය /විදේශීය) සහ ආදායම

| වර්ෂය | පැමිණීම | ආදායම (රු.මි.) |
|---|---|---|
| **2010** | 758,783 | 406.85 |
| **2011** | 955,170 | 545.63 |
| **2012** | 1,033,763 | 708.06 |
| **2013** | 1,185,884 | 915.93 |
| **2014** | 1,402,834 | 1,235.47 |
| **2015** | 1,731,608 | 1,585.04 |
| **2016** | 2,189,316 | 2,135.71 |
| **2017** | 2,382,844 | 2,644.77 |

**2010 වසරේ සිට 2017 දක්වා සංචාරක පැමිණීම**




**2010 වසරේ සිට 2017 දක්වා සංචාරක ආදායම**



## 2.3. ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති - 2017

### 2.3.1. රක්ෂිත ප්‍රදේශවල වාසස්ථාන සුපෝෂණය

**මූල්‍ය ප්‍රගතිය**

ඇස්තමේන්තුගත මුදල - රු. මි. 100.00
වියදම - රු. මි. 77.56

**භෞතික ප්‍රගතිය**

- රක්ෂිත ප්‍රදේශවල වාසස්ථාන සුපෝෂණය යටතේ හෙක්ටයාර් 134 ක ආක්‍රමණශීලී ශාක ඉවත් කිරිම, හෙක්ටායාර් 124 ක තෘණ භූමි කළමනාකරණය සහ හෙක්ටායාර් 146 ක යටි පඳුරු ඉවත් කිරීම සිදුකර ඇත.
- රක්ෂිත ප්‍රදේශ තුල පිහිටි වැව් 10 ක අළුත්වැඩියා කටයුතු සහ දිය වලවල් 18 ක ඉදි කිරීම් අවසන් කර ඇත.
- සූර්ය බලයෙන් ක්‍රියා කරන ජල සම්පාදන පද්ධතියක් කුමණ ජාතික උද්‍යානයේ ස්ථාපිත කරන ලදී.



ගැල්ලුකඩ වැව



නැබඩගස්වැව

යාල ජාතික උද්‍යානයේ ප්‍රතිසංස්කරණය කරන ලද වැව්

### 2.3.2. රක්ෂිත ප්‍රදේශවල මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය කිරිම

**මූල්‍ය ප්‍රගතිය**

ඇස්තමේන්තුගත මුදල - රු. මි. 40.00
වියදම - රු. මි. 36.66

**භෞතික ප්‍රගතිය**

- ජාතික උද්‍යානවල මාර්ග සංවර්ධනය කිරීම යටතේ සපත්තු පාලම් 28 ක් අවසන් කර ඇත.
- ජාතික උද්‍යානවල මාර්ග සංවර්ධනය කිරීම යටතේ කි.මී. 156 ක් සංවර්ධනය කර ඇත.





වනජීවී රක්ෂිත ප්‍රදේශවල මාර්ග ප්‍රතිසංස්කරණය

## 2.3.3. රක්ෂිත ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

### මූල්‍ය ප්‍රගතිය

ඇස්තමේන්තුගත මුදල - රු. මි. 10.00
වියදම - රු. මි. 2.13

### භෞතික ප්‍රගතිය

- රක්ෂිත ප්‍රදේශවල කාර්යාල සහ නිල නිවාස සඳහා ජල සැපයුම් පද්ධති 12 ක් අවසන්කර ඇත.
- රක්ෂිත ප්‍රදේශවල කාර්යාල සහ නිල නිවාස සඳහා විදුලි සැපයුම් පද්ධති 08 ක් අවසන්කර ඇත.
- සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම යටතේ රක්ෂිත ප්‍රදේශවල කාර්යාල වැසිකිළි පද්ධති 02 ක් පිළිසකර කර අවසන් කර ඇත.

## 2.3.4. රක්ෂිත ප්‍රදේශවල මායිම් සළකුණු කිරිම

### මූල්‍ය ප්‍රගතිය

ඇස්තමේන්තුගත මුදල - රු. මි. 20.00
වියදම - රු. මි. 15.76

### භෞතික ප්‍රගතිය

රක්ෂිත ප්‍රදේශ ජාලය ශක්තිමත් කිරීම සඳහා එම රක්ෂිත ප්‍රදේශවල මායිම් මිනුම් කිරීම සහ සලකුණු කිරීම සිදුකරනු ලබයි. රක්ෂිත ප්‍රදේශවල මායිම් සළකුණු කිරිම යටතේ 2017 වසරේ පහත සඳහන් ක්‍රියාකාරකම් දැනට සිදු කර ඇත.



මායිම් කණු

- වනජීවි රක්ෂිත පිළිබඳව සහ ඒවායේ සංරක්ෂණය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා දැන්වීම් පුවරු 257 ක් සාදා අවසන්කර ඇත.
- කි.මී. 60 ක් දිග රක්ෂිත මායිම් සළකුණු කිරිම සිදුකර අවසන්කර ඇත.
- රක්ෂිත ප්‍රදේශවල මායිම් සළකුණු කිරිම සඳහා නව මායිම් කණු 2,500 ක් මිල දී ගන්නා ලදී.

## 2.3.5. විදුලි වැටවල් ඉදි කිරීම





ඒකාබද්ධ අරමුදලේ ප්‍රතිපාදන යටතේ ආරම්භ කරනු ලැබීය.

**අරමුණු**

1. අලි-මිනිස් ගැටුම අවම කිරීම.
2. අලි-මිනිස් ගැටුම අවම කිරීම සඳහා ක්‍රමෝපායන් සංවර්ධනය සහ හැකියා වර්ධනය.

**මූල්‍ය ප්‍රගතිය**

ඇස්තමේන්තුගත මුදල - රු.මි. 100.00
වියදම - රු.මි. 99.95

**භෞතික ප්‍රගතිය**

- කි.මි. 488 ක් දිග විදුලි වැටවල් ඉදිකිරීම අවසන්කර ඇත.
- මේ වනවිට කි.මි. 4,446 ක් දිග විදුලි වැටවල් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට භාර දී වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ නඩත්තු කටයුතු සිදුකරමින් පවතී.

## 2.3.6. වනඅලි-මිනිස් ගැටුම අවම කිරීම

**අරමුණු**

1. විශේෂ වනඅලි සංරක්ෂිත කලාප ස්ථාපිත කිරීම.
2. වනඅලි සංචරණය සඳහා පිවිසුම් මාර්ග ජාලයක් ස්ථාපිත කිරීම.
3. වනඅලි වාසස්ථාන හඳුනාගැනීම හා සංවර්ධනය.
4. වනඅලි රක්ෂිත තත්ත්වය වර්ධනය කිරීම.
5. ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම.
6. විදුලි වැටවල් සැකසීම හා නඩත්තුව.
7. මහජනතාව දැනුවත් කිරීම හා සවිබල ගැන්වීම.
8. වනඅලි රැඳවුම් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම.
9. වනඅලි පිළිබඳ විද්‍යාත්මක තොරතුරු ජාලයක් ස්ථාපිත කිරීම.
10. අලි මිනිස් ගැටුම වලක්වාලීම සඳහා වනජීවී පාලන ඒකක පිහිටුවීම.
11. වනඅලි සංරක්ෂණය සඳහා අරමුදලක් ස්ථාපනය කිරීම .
12. වෙනත් වනසත්ත්ව හා මිනිස් ගැටුම අවම කිරීම.

**මූල්‍ය ප්‍රගතිය**

ඇස්තමේන්තුගත මුදල - රු.මි. 373.85
වියදම - රු.මි. 344.71

**භෞතික ප්‍රගතිය**

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මඟින් දැනට ඉදිකර ඇති විදුලි වැටවල් නඩත්තු කරමින් පවතී.
- 2016 වසරේ අවිච්ඡේද කි.මී. 800 ක් දිග විදුලි වැට සඳහා උපකරණ මිල දී ගැනීම සිදුකර ඇත.
- වනඅලි හානි අවම කිරීම සඳහා ඉදිවන විදුලි වැට සඳහා වැට කණු 2,232 ක් මිල දී ගන්නා ලදී.
- වනඅලි පාලන ඒකක 05 ක පාලන කටයුතු සිදුකරමින් පවතී.
- වනඅලින් නිර්වින්දන කටයුතු සඳහා නිර්වින්දන උපකරණ මිලදී ගැනීම සිදුකර ඇත.
- රූපවාහිණී සංස්ථාව මඟින් ප්‍රචාරය කරනු ලබන සොබාදහරා රූපවාහිණී වැඩසටහන් 50 ක් සාර්ථකව නිෂ්පාදනය කරන ලදී.
- විදුලි වැට උපකරණ ගබඩා කිරීම සඳහා වනජීවී කලාප සඳහා කන්ටේනර් 10 ක් මිල දී ගැනීම සිදුකර ඇත.
- වනඅලි සංක්‍රමණ රටාව හඳුනාගැනීම සඳහා වනඅලින් 05 ක් සඳහා GPS කරපටි 05 ක් පළඳවා අවසන් කර ඇත.

# 2.4. අනෙකුත් සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය

## 2.4.1. පාරිසරික සංචාරක කටයුතු සංවර්ධනය

**මූල්‍ය ප්‍රගතිය**

ඇස්තමේන්තුගත මුදල - රු.මි. 7.00
වියදම - රු.මි 5.93

**භෞතික ප්‍රගතිය**

- වස්ගමුව ජාතික උද්‍යානයේ පිහිටි කිරිඔය පාලම 2017.05.21 දින සහ ලාහුගල ජාතික උද්‍යානයේ මහවැව වනජීවී සංචාරක බංගලාව 2017.05.18 දින සංචාරකයින් සඳහා ගරු තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා විසින් විවෘත කරන ලදී.
- කොටුඅත්තාවල කුරුළු අභයභූමියේ සංචාරක පහසුකම් වැඩි දියුණු කිරීම යටතේ කන්ටේනර් පෙට්ටි 03ක් මිල දී ගෙන අවශ්‍ය සංචාරක පහසුකම් (ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම සහ සනීපාරක්ෂක පහසුකම්) ස්ථාපිත කරන ලදී.
- ගැල්වේස්ලෑන්ඩ් ජාතික උද්‍යානයේ ස්වභාවික මංපෙත (Nature Trail) අළුත්වැඩියා කිරීම සහ කඳවුරු නිවාසයේ ජල හා වැසිකිළි පහසුකම් ඇති කිරීම සිදුකර අවසන්කර ඇත.
- රන්දෙණිගල වනජීවී සංචාරක බංගලාව සහ ගල්ඔය ජාතික උද්‍යානයේ ඉඟිණියාගල සංචාරක නිවාසයේ අළුත්වැඩියාවන් අවසන් කර ඇත.

- එක්ගල්ඔය වනජීවී බංගලාවේ මුළුතැන්ගෙය හා වැසිකිළිය අළුත්වැඩියාව කිරීම අවසන් කර ඇත.
- යාල ජාතික උද්‍යානයේ දඹකොටේ සංචාරක නිවාසය අළුත්වැඩියා කර ඇත.
- කුමණ ජාතික උද්‍යානයේ කිරිගල්ඇඹේ සංචාරක නිවාසය ඉදිකර අවසන් කර ඇත.




මහවැව වනජීවී සංචාරක බංගලාව - ලාහුගල ජාතික උද්‍යානය



කිරිඔය පාලම විවෘත කිරීම - වස්ගමුව ජාතික උද්‍යානය

## 2.4.2. ජනවිහිදුම්කරණ කටයුතු සංවර්ධනය

**මූල්‍ය ප්‍රගතිය**

| | |
|---|---|
| ඇස්තමේන්තුගත මුදල | - රු. මි. 3.20 |
| වියදම | - රු. මි. 3.10 |

**භෞතික ප්‍රගතිය**

- සමනල අඩවිය සහ මඩු ජාතික උද්‍යානය අවට ජනතාවගේ සහභාගිත්වයෙන් ශ්‍රමදාන වැඩසටහන් 08 ක් පවත්වන ලදී.
- වනජීවී රක්ෂිත අවට ප්‍රජා මූල සංවිධානයන්හී ප්‍රගති සමාලෝචන වැඩසටහන් 06 ක්, ක්ෂද්‍ර සැලසුම් සකස් කිරීම සහ ප්‍රජාව සවිබල ගැන්වීමේ වැඩසටහන් 17 ක් සහ වනජීවී සංරක්ෂණය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් 10 ක් සාර්ථකව පවත්වන ලදී.
- වස්ගමුව ජාතික උද්‍යාන අවට දෙහි පැල /කිතුල් සහ ගොරකා පැල යොදා ගෙන ජීව වැට කි.මී. 7ක් දීර්ඝ කිරීම කටයුතු සිදුකරන ලදී.





දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

## 2.4.3. තර්ජනයට ලක් වූ විශේෂ සංරක්ෂණය

### මූල්‍ය ප්‍රගතිය



ඇස්තමේන්තුගත මුදල - රු.මි.2.00
වියදම - රු.මි.0.01

### භෞතික ප්‍රගතිය





- සතුන්ට ප්‍රතිකාර සහ සායන කටයුතු සඳහා ඩෑන් ඉන්ජෙක්ටර් (Dan inject) 02 ක් මිල දී ගැනිම වනඅලි ගැටුම අවම කිරීමේ වැය විෂයය යටතේ මිල දී ගන්නා ලදී.

## 2.4.4. තොරතුරු සන්නිවේදන පද්ධති වැඩිදියුණු කිරීම

### මූල්‍ය ප්‍රගතිය

ඇස්තමේන්තුගත මුදල - රු. මි. 4.80
වියදම - රු. මි. 1.40

### භෞතික ප්‍රගතිය

- පරිගණක 190 ක් සඳහා ප්‍රති වෛරස් මෘදුකාංගය මිල දී ගන්නා ලදී.
- ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම පරිගණක ගතකිරීම යටතේ 6 –Port Router 03ක් මිල දී ගන්නා ලදී.
- ප්‍රධාන කාර්යාලය සහ ක්ෂේත්‍ර කාර්යාවල ගුවන් විදුලි සන්නිවේදන පද්ධතියේ සහ පරිගණකගත තොරතුරු සන්නිවේදන පද්ධතිවල නඩත්තු කටයුතු සිදු කරන ලදී.
- කතරගම, ලුණුගම්වෙහෙර, අම්පාර, පොළොන්නරුව සහ අනුරාධපුර සහකාර අධ්‍යක්ෂ කාර්යාලවල පරිගණක ජාලයන් ස්ථාපිත කිරීම සිදු කරන ලදී.

## 2.4.5. ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය

### මූල්‍ය ප්‍රගතිය

ඇස්තමේන්තුගත මුදල -රු.මි. 18.00
වියදම -රු. මි.14.72

### භෞතික ප්‍රගතිය

- රක්ෂිත ප්‍රදේශවල නිලධාරීන්ගේ පරිපාලන කටයුතු පහසුකිරීම සඳහා ගොඩනැගිලි 17 ක් සහ ප්‍රධාන කාර්යාලයේ අළුත්වැඩියා කටයුතු අවසන් කර ඇත.
- රක්ෂිත ප්‍රදේශවල නිලධාරීන්ගේ නිල නිවාස 06 ක් ප්‍රතිසංස්කරණය කිරීම අවසන් කර ඇත.
- තවද රක්ෂිත ප්‍රදේශවල ගොඩනැගිලි සඳහා විදුලි සැපයුම් 01 ක ජල සැපයුම් 01 ක, වනජීවී සංචාරක බංගලා 01 ක, වැසිකිලි පද්ධති 01 ක, ගිණි අවි රඳවන 02ක, සහ වාහන ගරාජ් 01 ක අළුත්වැඩියා කටයුතු 2017 වසරේදී සිදු කර ඇත.

## 2.4.6. ගොඩනැගිලි ඉදිකිරීම

### මූල්‍ය ප්‍රගතිය

ඇස්තමේන්තුගත මුදල - රු.මි. 25.00
වියදම - රු.මි. 10.55

**භෞතික ප්‍රගතිය**

- පදවිය අඩවි ආරක්ෂක කාර්යාලය ඉදි කිරීම අවසන්කර ඇත.
- මීට අමතරව අංගම්මැඩිල්ල ජාතික උද්‍යානයේ නිකවැව බීට්වු කාර්යාල(75%), ලාහුගල ජාතික උද්‍යාන සහ මුලතිව් අඩවි ආරක්ෂක කාර්යාලය සහ ඒකාබද්ධ නිල නිවාසය(40%) ඉදි කිරීම් කටයුතු සිදු කරමින් පවතී.
- උඩවලව ජාතික උද්‍යානයේ ගල්කොටු කන්ද බීට්වු කාර්යාලය සහ කලමැටිය අඩවි ආරක්ෂක කාර්යාල සඳහා වාහන ගරාජ 02ක් ඉදි කරන ලදී.
- වස්ගමුව ජාතික උදයානයේ ගිණි අවි රඳවන 01ක් ඉදි කරන ලදී.

## 2.4.7. ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ මිලට ගැනීම

**මූල්‍ය ප්‍රගතිය**

ඇස්තමේන්තුගත මුදල - රු. මි.5.85
වියදම - රු. මි.5.83

**භෞතික ප්‍රගතිය**

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට සහ කලාප කාර්යාල සඳහා පහත සඳහන් කාර්යාලයීය උපකරණ මිල දී ගන්නා ලදී.

| උපකරණ | ප්‍රමාණය | උපකරණ | ප්‍රමාණය | උපකරණ | ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| ලිපිගොනු කබඩ් | 7 | මුද්‍රණ යන්ත්‍ර | 12 | Vacuum Cleaner | 07 |
| වානේ අල්මාරි | 1 8 | ඩොට් මෙට්‍රික් ප්‍රින්ටර්ස් | 07 | කාර්යාල පුටු | 03 |
| පරිගණක පුටු | 10 | ඩිජිටල් Audio රෙකෝඩරය | 03 | ඇඳන් | 04 |
| පරිගණක මේස | 04 | Cash Safe | 04 | විදුලි පංකා | 05 |
| Low Back Chairs | 05 | විධායක මේස | 05 | A3 වර්ණ ප්‍රින්ටරය | 24 |
| High Back Chairs | 04 | කාර්යාල මේස | 24 | ෆැක්ස් උපකරණය | 02 |
| Counter Chairs | 01 | ඡායා පිටපත් යන්ත්‍ර | 02 | විදුලි කේතල් | 01 |
| අමුත්තන්ගේ පුටු | 02 | කාර්යාල කාර්ය සහයක මේස | 01 | | |
| ශීතකරණ | 02 | යෝජනා මේසය | 12 | | |
| ජල පෙරණ | 08 | | | | |
| UPS | 23 | | | | |

## 2.4.8. යන්ත්‍රෝපකරණ මිළදී ගැනීම

**මූල්‍ය ප්‍රගතිය**

ඇස්තමේන්තුගත මුදල - රු.මි. 5.00
වියදම - රු.මි. 3.20

**භෞතික ප්‍රගතිය**

- උඩවලව සහ යාල ජාතික උද්‍යානවල ඇති JCB යන්ත්‍ර 2ක් සහ අළුත්වැඩියා කර ඇත.

## 2.4.9. වාහන අළුත්වැඩියාව

### මූල්‍ය ප්‍රගතිය

ඇස්තමේන්තුගත මුදල - රු.මි. 10.00
වියදම - රු.මි. 9.77

### භෞතික ප්‍රගතිය

2017 වර්ෂය තුළ ප්‍රධාන කාර්යාලයේ සහ ක්ෂේත්‍ර කාර්යාලවල අලි ලොරි 02 ක්, වෑන් 01 ක්, ඩබල් කැබ් 04 ක්, ජීප් 01 ක්, සින්ගල් කැබ් 03 ක් සහ කෘ කැබ් 01 ක් ඇතුළුව වාහන 12 ක් අළුත්වැඩියාවන් සිදු කර ධාවනය සඳහා එක්කර ඇත.

## 2.4.10. පුහුණු හා පර්යේෂණ කටයුතු

### මූල්‍ය ප්‍රගතිය

ඇස්තමේන්තුගත මුදල - රු.මි.2.50
වියදම - රු.මි.2.50

### භෞතික ප්‍රගතිය

- පර්යේෂණ කමිටු 04 ක් පවත්වා ඇති අතර එහිදි කමිටු සමාජිකයන් විසින් නිර්දේශ කර බාහිර පර්යේෂකයන්ගේ පර්යේෂණ ව්‍යපෘති සඳහා අනුමැතිය දී ඇත.
- දෙපාර්තමේන්තු පර්යේෂණ සම්මන්ත්‍රණ 01 ක් පවත්වන ලද අතර එහිදී 2017 වසරේ මුදල් ප්‍රතිපාදන යටතේ දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් සිදුකරන ලද පර්යේෂණ 11 ක වාර්තා ලබා දී ඇත.
- පක්ෂීන්ට මුදු පැළදවීමේ ජාතික වැඩසටහනේ සැසි 02 ක් බුන්දල ජාතික උද්‍යානයේ දී පවත්වා අවසන්කර ඇත.

## 2.4.11. සංරක්ෂණය, අධ්‍යාපනය හා විවරණය

### මූල්‍ය ප්‍රගතිය

ඇස්තමේන්තුගත මුදල - රු.මි. 6.20
වියදම - රු.මි. 6.12

### භෞතික ප්‍රගතිය

වනජීවී සම්පත් සංරක්ෂණය සඳහා බාහිර පාර්ශවයන්ගේ දායකත්වය ලබා ගැනීමත්, ඒ සඳහා පාසැල් ළමුන් , ග්‍රාමීය ජනතාව සහ රජයේ නිලධාරීන් යන ඉලක්කගත කණ්ඩායම් සඳහා ව්‍යාප්ති , අධ්‍යාපන සහ විවරණ වැඩසටහන් පවත්වන අතර 2017 වර්ෂයේ දී පහත වැඩසටහන් පවත්වා ඇත.

| වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව | දැනුවත් කරන ලද සංඛ්‍යාව |
|---|---|---|
| ලෝක තෙත් බිම් දිනය සනිටුහන් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන | 04 | පාසැල් සිසුන් 120 |
| ලෝක වනජීවී දිනය සනිටුහන් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් | 05 | පාසැල් සිසුන් 150 |
| ලෝක ජෛව විවිධත්ව දිනය සැමරීම සඳහා පැවැත් වූ දැනුවත් කිරීමේ වැඩසටහන් | 03 | පාසැල් සිසුන් 108 |
| පරිසර දිනය සැමරීම සඳහා පැවැත් වූ දැනුවත් කිරීමේ වැඩසටහන් | 05 | පාසැල් සිසුන් 150 |
| පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 35 | පාසැල් සිසුන් 900 |
| රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 46 | රාජ්‍ය නිලධාරීන් 2020 |
| විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ප්‍රදර්ශන පැවැත්වීම | 08 | මහජනතාව හා පාසැල් සිසුන් 2452 |
| මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 03 | 1200 |
| ප්‍රදර්ශන වැඩසටහන් | 10 | 3600 |

- වනන්තරේ කතන්දරේ වැඩසටහන් 52ක් ගුවන් විදුලි සංස්ථාව මගින් ප්‍රචාරය කරන ලදී.
- වනදිවි සම්පත් රැක ගැනීම මැයෙන් අත් පත්‍රිකා 10,000 ක් මුද්‍රණය කරන ලදී.
- ·දිනමිණ "වනදිවි" අතිරේකයේ කලාප 12 ක් පුවත්පතේ පළ කරන ලදී.
- "*kingdom of Wildlife* " වීඩියෝපට පිටපත් කිරීම් (පිටපත් 50 ක්), සහ නයාරු නන්දිකඩාල් කෙටි වීඩියෝපට පිටපත් කිරීම් (පිටපත් 04 ක්) සිදු කරන ලදී.

## 2.4.12. ආරක්ෂාව සහ නීතිය ක්‍රියාත්මක කිරීම

### මූල්‍ය ප්‍රගතිය

ඇස්තමේන්තුගත මුදල - රු. මි. 6.30
වියදම - රු. මි. 6.25

### භෞතික ප්‍රගතිය

වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත යටතේ ආරක්ෂිත ප්‍රදේශතුල හා ඉන් බැහැර ප්‍රදේශවල වනජිවී අපරාධ මැඩලීම සඳහා විශේෂ කාර්ය භාරයක් වනජිවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලැබේ. එසේම දිනෙන් දින වර්ධනය වන මානව ක්‍රියාකාරකම් හේතුවෙන් මෙරට ජෛව විවිධත්වයට විශාල බලපෑමක් එල්ල වන බැවින් ඒවා ආරක්ෂා කර ගැනීම සඳහා වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ නීතිමය ප්‍රතිපාදන ක්‍රියාත්මක කරනු ලබයි. මේ යටතේ 2017 වසරේ පහත සඳහන් කටයුතු සිදුකරන ලදී.

- ගිණි අවි සඳහා පතරොම් 6,500 ක් මිල දී ගන්නා ලදී.
- නියං සමයේ රක්ෂිත ප්‍රදේශ තුළ අනවසර වනජීවී අපරාධ මැඩලීම සඳහා මුර සංචාර සිදුකරන ලදී.
- ජල ගැලුම් නිම්න ජාතික උද්‍යානයේ අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීම සිදුකරන ලදී.
- වනජීවී කලාප සඳහා ගිනි අවි රඳවන 17 ක් ක්ෂේත්‍ර කාර්යාල 17 ක ස්ථාපිත කිරීමේ කටයුතු සිදුකර ඇත .
- එයට අමතරව දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා පහත සඳහන් කෙටි කාලීන පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලදී.



වනජීවී නිලධාරින් වැටලීමක් සිදු කරමින්

## 2.4.13. ජාතික වනජීවී පර්යේෂණ හා පුහුණු කේන්ද්‍රය පවත්වාගෙන යාම

### මූල්‍ය ප්‍රගතිය

ඇස්තමේන්තුගත මුදල - රු. මි. 9.58
වියදම - රු. මි. 9.38

### භෞතික ප්‍රගතිය

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර බඳවා ගැනීම් යටතේ නවක වනජීවී නියාමක නිලධාරීන් 33 දෙනෙක් සඳහා වනජීවී කළමනාකරණය පිළිබඳ සේවාරම්භක පුහුණු පාඨමාලාව සහ නිලධාරීන් 26 දෙනකු සඳහා වනජීවී සංරක්ෂණ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහතිකපත්‍ර පාඨමාලාව - X ගිරිතලේ ජාතික වනජීවී පර්යේෂණ හා පුහුණු කේන්ද්‍රයේදී පවත්වන ලදී.

- නිලධාරීන් 25 දෙනකු සඳහා වනජීවී සංරක්ෂණ ජොෂ්ඨ කළමනාකරණ සහතිකපත්‍ර පාඨමාලාව - X I පවත්වන ලදී.
- පර්යටන පක්ෂීන් පිලිබඳව වාර්තාමය වැඩසටහනක් රූපගත කිරීම සිදුකරන ලදී.



ජාතික වනජීවී පර්යේෂණ හා පුහුණු කේන්ද්‍රය— ගිරිතලේ

## 2.5. වෙනත් ආයතන වලින් ලද ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

### 2.5.1. මොරගහකන්ද ව්‍යාපෘතිය යටතේ සිදුකරන වනජීවී සංරක්ෂණ කටයුතු

**අරමුණු**

1. කළුගඟ හා යෝජිත මොරගහකන්ද ජලාශය ආශ්‍රිතව ප්‍රේරක කලාපයක් ප්‍රකාශයට පත් කිරීම සහ එහි මිනිස් ක්‍රියාකාරකම් අවම කිරීම.
2. ඉහත ප්‍රදේශයේ වනජීවී මිනිස් ගැටුම අවම කිරීම සඳහා වනජීවී බාධක පිහිටුවීම. (විදුලි වැටවල්, අගල් කැපීම ආදිය)
3. වනජීවී මිනිස් ගැටුම අවම කිරීම සඳහා ව්‍යාප්තියට යටත් වන ප්‍රදේශයේ වනජීවී වාසස්ථාන දියුණු කිරීම.
4. ව්‍යාපෘති ප්‍රදේශය ආශ්‍රිත වනජීවී රක්ෂිත ප්‍රදේශවල පාරිසරික සංචාරක කර්මාන්තය දියුණු කිරීම.
5. ව්‍යාපෘති ප්‍රදේශය ආශ්‍රිතව වනජීවී රක්ෂිත ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

**මූල්‍ය ප්‍රගතිය**

ඇස්තමේන්තුගත මුදල -රු. මි 52.10
වියදම -රු. මි. 41.86

**භෞතික ප්‍රගතිය**

- වස්ගමුව ජාතික උද්‍යානයේ මාර්ග දෙපස කි.මී. 24 ක් දුරට යටි කැලය ඉවත් කිරීම අවසන්කර ඇත.
- වස්ගමුව ජාතික උද්‍යානයේ විල්මිටිය සිට සංස්ථාපිටිය දක්වා මාර්ග අලුත්වැඩියාව අවසන්කර ඇත.
- වස්ගමුව ජාතික උද්‍යානයේ යුධගනාව ඇළේ සිට මහවැලි බීට්ටුව දක්වා මාර්ග අලුත්වැඩියාව අවසන්කර ඇත.
- කවුඩුල්ල ජාතික උද්‍යානයේ මාර්ග දෙපස කි.මී 15 ක් දුරට යටිකැලය ඉවත් කිරීම අවසන්කර ඇත.
- සෝමාවතිය ජාතික උද්‍යානයේ සපත්තු පාලමක් ඉදිකිරීම අවසන් කර ඇත.
- සෝමාවතිය ජාතික උද්‍යානයේ බෙරුවිල සහ පුබ්බිලිය නව වනජීවී බීට්ටු කාර්යාල 02 ක් ඉදි කිරීම අවසන්කර ඇත.
- වනජීවී නිලධාරීන් 60 ක් සඳහා දෙමළ භාෂා පුහුණු පාඨමාලා 02 ක් සාර්ථකව පවත්වා අවසන්කර ඇත.
- කටුකැලියාව, බටුඔය බීට්ටු කාර්යාලය අළුත්වැඩියා කර ඇත.
- අංගම්මැඩිල්ල ජාතික උද්‍යානයේ නිල නිවාස 01 ක් සහ තොරතුරු මධ්‍යස්ථානය අළුත්වැඩියා කර ඇත.
- පනිජ්ජඔය බීට්ටු කාර්යාලය, සෝමාවතිය ජාතික උද්‍යානය තුල සංචාරක කටයුතු ප්‍රවර්ධනය සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- මින්නේරිය ජාතික උද්‍යානය තුල නව සංචාරක බංගලාවක් ඉදිකිරීම අවසන්කර ඇත.
- ගංගාධාර ස්වභාව රක්ෂිතයේ කි.මී 12 ක් දිග මායිම් සලකුණු කිරීම අවසන්කර ඇත .
- වස්ගමුව ජාතික උද්‍යානය ආක්‍රමණශීලී මයිල ශාක ඉවත් කිරීම සහ කවුඩුල්ල ජාතික උද්‍යානයේ Slasher මගින් තෘණ භූමි කළමනාකරණය (හෙක්. 70 ක්) අවසන්කර ඇත.
- ගිරිතලේ ජාතික වනජීවී පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයේ නව සංචාරක බංගලාවට යන මාර්ගය අලුත්වැඩියා කිරීම සිදුකර ඇත.

## 2.5.2. පරිසර පද්ධති සංරක්ෂණ හා කළමණාකරණ ව්‍යාපෘතිය (ESCAMP)

ලෝක බැංකු ආධාර මත පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය (ESCAMP) 2017-2021 දක්වා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වනසංරක්ෂණ දෙපාර්තමේන්තු මගින් ක්‍රියාත්මක වන අතර ඒ සඳහා ඇමෙරිකන් ඩොලර් මි. 45 ක ප්‍රතිපාදන වෙන් වී ඇත. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ තෝරාගත් රක්ෂිත ප්‍රදේශවල ඇතුලත හා පිටත ගොඩබිම්, සමුද්‍රීය සහ තෙත් බිම් පරිසර පද්ධති කළමනාකරණ සංරක්ෂණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම වේ. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් 2017 වසරේදී පහත සඳහන් ව්‍යාපෘති සංරචක යටතේ කාර්යන් ආරම්භ කර ඉදිරියට කටයුතු සිදු කරමින් පවතී.

ඒ අනුව 2017 වසරේදී මෙම ව්‍යාපෘතිය මගින් සිදුකරන ලද කාර්යන්ගේ ප්‍රගතිය පහත සඳහන් ලෙස දැක්විය හැක.

- **සංරචක 2a**

වනජීවී රක්ෂිත ප්‍රදේශ අවට ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය කිරීම (ඇමෙරිකන් ඩොලර් මි. 6)

| කාර්යයන් | ඇස්තමේන්තුව 2017(රු.මි.) | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| බුන්දල ජාතික උද්‍යානය අවට ගම්මානවල ජනතාව සඳහා ක්ෂද්‍ර සැලසුම් 05 ක් සකස් කිරීම. | 2.1 | 0.95 | • ක්ෂද්‍ර සැලසුම 05ක් අවසන් කර ඇත.<br>• ප්‍රජා උප ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම කෝන්වලාන සහ නෙදිගම්විල අවසන් කර ඇත.<br>• දකුණ වනජීවී කලාපයෙන් පරිබාහිර කලාපයන්හි සේවයේ නියුතු වනජීවී නිලධාරි ප්‍රජා ක්‍රියාකාරකම් සඳහා සංවේදී කිරීමේ වැඩසටහන් 01ක් පවත්වා ඇත. |

- **සංරචක 2b**

අලි-මිනිස් සහ පැවත්ම තුලින් වනඅලි හානි අවම කිරීම (ඇමෙරිකන් ඩොලර් මි. 11)

| කාර්යයන් | ඇස්තමේන්තුව –2017 (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| වනඅලි සංගණනය. | 5 | - | වැඩමුළු 02ක් පවත්වා ඇත. (1%) |
| වනඅලින්ගේ සංක්‍රමණ රටාව අධීක්ෂණය කිරීම. | 25 | - | හඳුනාගත් වනඅලීන් 40ක් සඳහා GPS කරපටි මිල දී ගැනීමට ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවති. (10%) |
| ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානය වනඅලි සංරක්ෂණ උද්‍යානය ඉදි කිරීම. | 150 | - | ඇස්තමේන්තු සකස් කරමින් පවතී. (3%) |

- **සංරචක 3a**

වනජීවී රක්ෂිත ප්‍රදේශ සංරක්ෂණය සහ කළමණාකරනය (ඇමෙරිකන් ඩොලර් මි. 11.6)

| කාර්යයන් | ඇස්තමේන්තුව 2017(රු.මි.) | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| යාල ජාතික උද්‍යානය ජල ප්‍රභවයන් වැඩි දියුණු කිරීම. | 50 | | කුඩා වැව් 12 ක්, ගල්කෙම් 04 ක් හා කොන්ක්‍රීට් වතුර වලවල් 07 ක් සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවතී. |
| වනජීවී රක්ෂිත ප්‍රදේශවල වනජීවී අපරාධ මැඩලීම සඳහ SMART patrolling ක්‍රමය යොදා ගැනීම. | 5 | 8.99 | මූලික පුහුණු වැඩයටහන් හා ක්ෂේත්‍ර පුහුණු කටයුතු උද්‍යාන 07ක් තුල අවසන් කර ඇත. වැටලීම් ඒකක(Patrolling units) සඳහා දත්ත එකතුකිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. |
| වනජීවී රක්ෂිත ප්‍රදේශවල කළමනාකරණය සඳහා යටිතල පහසුකම් සංවර්ධනය හා වැඩි දියුණු කිරීම. | 20 | | ව්‍යාපෘති යෝජනා සකස් කරමින් පවතී. (1%) |

- **සංරචක 3b**

වනජීවී රක්ෂිත ප්‍රදේශවල පාරිසරික සංචාරක කටයුතු වැඩි දියුණු කිරීම (ඇමෙරිකන් ඩොලර් මි. 6)

| කාර්යයන් | ඇස්තමේන්තුව –2017(රු.මි.) | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| යාල සහ බූන්දල ජාතික උද්‍යානය පාරිසරික සංචාරක කටයුතු සංවර්ධනය කිරීම. | 22.0. | - | ව්‍යාපෘති යෝජනා සකස් කරමින් පවතී (1%) |

- **සංරචක 3c**

ආයතන ධාරිතාව සහ ආයෝජන හැකියාව වර්ධනය කිරීම (ඇමෙරිකන් ඩොලර් මි. 6.6)

| කාර්යයන් | ඇස්තමේන්තුව –2017(රු.මි.) | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| ගිරිතලේ ජාතික වනජීවී පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයේ යටිතල පහසුකම් සංවර්ධනය. | 40 | - | තාක්ෂණ උපදේශකයින් තෝරාගෙන ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවතී. (5%) |
| වනජීවී සංරක්ෂණය සහ කළමනාකරණය පිළිබඳ ඩිප්ලොමා පාඨමාලාව. | 8.0 | 11.48 | ගිරිතලේ ජාතික වනජීවී පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයේ සය මාසික පාඨමාලාව පවත්වාගෙන යමින් පවතී. (60%) |
| දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා වසර පහක පුහුණු සැලසුමක් පිළියෙල කිරීම. | - | - | සකස්කර අවසන් කර ඇත. (100%) |

| කාර්යයන් | ඇස්තමේන්තුව –2017 (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| WILDLANKA පර්යේෂණ සම්මන්ත්‍රණය | 2.5 | 1.85 | 2017 .වසරේ පර්යේෂණ සම්මන්ත්‍රණය 2017.08.15 සහ 16 දිනවල කොළඹ ටාජ් සමුද්‍ර හෝටලයේදී පවත්වන ලදී (100%) |
| ආයතන සහ නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය කිරීම (පුහුණු, උපකරණ සහ වාහන) | 4.0. | - | ඩබල් කැබ් 05 ක් මිල දී ගෙන ඇත (100%) කාර්යාලීය උපකරණ මිල දී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවතී (10%) |
| **එකතුව** | **50.5** | **22.71** | |

## 2.6. ඒකාබද්ධ අරමුදලේ මූලධන වියදම් සාරාංශය

| අනු අංකය | වැඩසටහන | ප්‍රතිපාදන (රු.මි.) | ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | මූල්‍ය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
| 1 | පාරිසරික සංචාරක කටයුතු සංවර්ධනය. | 7 | 5.93 | 85% |
| 2 | ජනවිඥානීකරණ කටයුතු සංවර්ධනය. | 3.20 | 3.10 | 97% |
| 3 | තර්ජනයට ලක් වූ විශේෂ සංරක්ෂණය. | 2 | 0.01 | 1% |
| 4 | තොරතුරු සන්නිවේදන පද්ධති වැඩිදියුණු කිරීම. | 4.80 | 1.40 | 29% |
| 5 | ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය. | 18 | 14.72 | 82% |
| 6 | ගොඩනැගිලි ඉදි කිරීම. | 25 | 10.55 | 42% |
| 7 | ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ මිලදී ගැනීම. | 5.85 | 5.83 | 100% |
| 8 | යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම. | 9.5 | 7.15 | 75% |
| 9 | යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා කිරීම. | 5 | 3.20 | 64% |
| 10 | වාහන අළුත්වැඩියාව. | 10 | 9.77 | 98% |
| 11 | රක්ෂිත ප්‍රදේශවල මායිම් සළකුණු කිරිම. | 20 | 15.76 | 79% |
| 12 | පුහුණු හා පර්යේෂණ කටයුතු. | 2.5 | 2.50 | 100% |
| 13 | සංරක්ෂණ අධ්‍යයනය හා විවරණය. | 6.2 | 6.12 | 99% |
| 14 | ආරක්ෂාව සහ නිති ක්‍රියාත්මක කිරිම. | 6.3 | 6.25 | 99% |
| 15 | ජාතික වනජීවී පර්යේෂණ හා පුහුණු කේන්ද්‍රය පවත්වාගෙන යාම. | 9.6 | 9.39 | 98% |
| 16 | යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. | 10 | 2.13 | 21% |
| 17 | රක්ෂිත ප්‍රදේශවල මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය කිරිම. | 40 | 36.66 | 92% |
| 18 | රක්ෂිත ප්‍රදේශවල වාසස්ථාන සුපෝෂණය. | 100 | 77.56 | 78% |
| 19 | විදුලි වැට ඉදිකිරිම. | 100 | 99.95 | 100% |
| 20 | වනඅලි මිනිස් ගැටුම අවම කිරීම. | 373.85 | 344.71 | 92% |
| | **එකතුව** | **758.8** | **662.69** | **87%** |

## 2.6.1. වියදම් සාරාංශය 2017- ඒකාබද්ධ අරමුදල

| වියදම් කාණ්ඩය | 2017 ඇස්තමේන්තුව (රු. මි.) | 2017 වියදම (රු. මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|
| මූලධන වියදම් | 758.8 | 662.69 | 87 |
| පුනරාවර්තන වියදම් | 1,116.65 | 1,113.68 | 100 |
| එකතුව | **1,875.45** | **1,776.37** | 95 |

## 2.6.2. වියදම් සාරාංශය 2017- වනජීවී සංරක්ෂණ අරමුදල

| වියදම් කාණ්ඩය | 2017 ඇස්තමේන්තුව (රු. මි.) | 2017 වියදම (රු. මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|
| වනජීවි සංරක්ෂණ අරමුදල | 1,205.73 | 943.14 | 78 |

## 2.6.3. 2017 වසරේ වනජීවී සංරක්ෂණ අරමුදලේ වියදම් සාරාංශය

| වැය විෂයය | විස්තරය | ඇස්තමේන්තුව (රු.මි.) | වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 3000 | ස්වෙච්ඡා මාර්ගෝපදේශක දීමනා | 80 | 72.67 | **91** |
| 3001 | තත්කාර්ය කම්කරු දීමනා | 12 | 9.44 | **79** |
| 3002 | ගමන් වියදම් | 28 | 23.40 | **84** |
| 3003 | ඉන්ධන | 48 | 40.06 | **83** |
| 3005 | ප්‍රසාද දීමනා (උසාවි දඩ මුදල් ලැබීම් වලින්) | 16 | 11.98 | **75** |
| 3006 | මිය ගිය වනඅලි ඉවත් කිරීම/වළ දැමීම/පිළිස්සීම | 1.5 | 0.93 | **62** |
| 3007 | මහජනයාට, සතුන්ගෙන් වන හානි සඳහා වන්දි ගෙවීම | 12 | 11.37 | **95** |
| 3008 | අලි වෙඩි මිල දී ගැනීම | 71 | 69.55 | **98** |
| 3009 | අලි පලවා හැරීම | 10 | 6.39 | **64** |
| 3010 | සතුන් සඳහා ආහාර වියදම් | 85 | 60.37 | **71** |
| 3011 | සේවා ගාස්තු | 300 | 245.80 | **82** |
| 3012 | වාහන අළුත්වැඩියාව | 32 | 31.90 | **100** |
| 3013 | විදුලිය හා ජලය | 11 | 8.77 | **80** |
| 3014 | තුවක්කු බලපත්‍ර ගෙවීම | 0.18 | 0.18 | **99** |
| 3015 | වඳවීමේ තර්ජනයට ලක්වී ඇති වනජීවීන් සංරක්ෂණය | 10 | 4.84 | **48** |
| 3016 | ගුවන් විදුලි පණිවිඩ පහසුකම් වෙනුවෙන් ගෙවීම් | 4 | 3.77 | **94** |
| 3017 | බංගලාවල රෙදි පිරිසුදු කිරීම | 1.5 | 0.99 | **66** |
| 3018 | නීතිඥ ගාස්තු | 0.5 | 0.37 | **73** |
| 3019 | විවිධ වියදම් | 10 | 9.49 | **95** |

| වැය විෂයය | විස්තරය | ඇස්තමේන්තුව (රු.මි.) | වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 3020 | යන්ත්‍ර උපකරණ, විදුලි උපකරණ, ගොඩනැගිලි නඩත්තු වියදම්<br><br>රක්ෂිත ප්‍රදේශවල පිහිටි පරිපාලන ගොඩනැගිලි 21 ක් නිල නිවාස 03 ක් වැසිකිළි පද්ධති 07 ක් වනජීවී සංචාරක බංගලා 07 ක් අළුත්වැඩියාවන් අවසන් කර ඇත. ඊට අමතරව රක්ෂිත ප්‍රදේශවල පිහිටි ජාතික උද්‍යානවල ප්‍රවේශයන් 02 ක් ජල සැපයුම් පද්ධති 01 ක් විදුලි සැපයුම් පද්ධති 04 ක අළුත්වැඩියා කටයුතු සිදු කර ඇත.) | 85 | 78.53 | **92** |
| 3021 | මෙහෙයුම් ද්‍රව්‍ය හා උපාංග (වෛද්‍ය) | 8 | 6.43 | **80** |
| 3022 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය වියදම් | 4 | 2.82 | **70** |
| 3023 | නිලධාරීන්ගේ රෝහල් සහ වෛද්‍ය ගාස්තු | 1 | 0 | **0** |
| 3024 | නිලධාරීන්ගේ ජීවිත හා ශාරීරක හානි සඳහා වන්දි | 1 | 0.58 | **58** |
| 3028 | සංචාරකයින්ගේ සහ වනජීවින්ගේ උද්‍යානවල පහසුකම් වැඩි දියුණු කිරීම<br><br>• කුමන සහ ලාහුගල ජාතික උද්‍යානවල වනජීවී සංචාරක නිවාස 02 ක් ඉදිකර අවසන් කර ඇත .<br>• උඩවලව ඇත් අතුරු සෙවණේ පරිපාලන ගොඩනැගිලි 02 ක් ඉදි කිරීම් කටයුතු අවසන් කර ඇත.<br>• රක්ෂිත ප්‍රදේශවල පිහිටි නිල නිවාස 03 ක් ඉදි කිරීම් කටයුතු අවසන් කර ඇත.<br>• ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානය තුල වාහන නැවතුම්පලවල් 01 ක් ඉදි කර අවසන් කර ඇත.<br>• උඩවලව, යාල සහ ගල්ඔය ජාතික උද්‍යානවල වැසිකිළි පද්ධති 03 ක් ක් ස්ථාපිත කරන ලදී.<br>• පරෙවි දූපත ජාතික උද්‍යානය සඳහා කාර්යාලීය පහසුකම් වැඩි කිරීම සඳහා පරිසර හිතකාමී ගොඩනැගිලි (DURA House) 02 ක් ඉදි කර අවසන් කර ඇත.<br>• රක්ෂිත ප්‍රදේශවල පිහිටි ගොඩනැගිලි 05 ක ඉදි කිරීම් කටයුතු සිදු කරන ලදී.<br>• යළි පුබුදමු යාල වැඩසටහන යටතේ යාල ජාතික උද්‍යාන කලාප අංක III, IV හා V හී කි.මී 30 ක මාර්ග ඉදි කිරීම සහ සපත්තු පාලම් 40 ක් ජල මූලාශ්‍රයක්, යාල ජාතික උද්‍යානයේ ප්‍රධාන පිවිසුම,වැසිකිළි පද්ධති 01 ක,වැව් 02 ක සහ වනජීවී සංචාරක 01 ක් ඉදිකිරීමේ කටයුතු සිදුකර ඇත.ඊට අමතරව පිවිසුම් ගොඩනැගිල්ල, ප්‍රවේශ පත්‍ර කවුළුව ඉදි කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.<br>• කැස්බෑ සංරක්ෂණ කටයුතු වැඩි දියුණු කිරීම සඳහා ඌරණිය, රැකව උඩමලල යන ස්ථානවල සංරක්ෂණ ඒකක 06 ක් ඉදි කරන ලදී | 160 | 91.26 | **57** |
| 3029 | බෝට්ටු, වාහන සහ යන්ත්‍රෝපකරණ මිල දී ගැනීම | 7.5 | 5.45 | **73** |

| වැය විෂයය | විස්තරය | ඇස්තමේන්තුව (රු.මි.) | වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 3030 | සංචාරක බංගලා සහ ජාතික උද්‍යාන නඩත්තු කිරීම | 8.5 | 5.71 | **67** |
| 3034 | විදේශීය පුහුණු | 44.6 | 41.22 | **92** |
| 3036 | දිරි දීමනා | 64.5 | 56.04 | **87** |
| 3037 | සම්මුති හා සම්මන්ත්‍රණ | 6.5 | 6.41 | **99** |
| 3038 | දායක මුදල් | 0 | 0 | **0** |
| 3039 | ප්‍රධාන කාර්යාලයේ අංශවල පහසුකම් වැඩි දියුණු කිරීම | 15 | 5.36 | **36** |
| 3040 | ජනවිඥිදුම්කරණ කටයුතු<br>• ග්‍රාමීය ජනතාව සඳහා වනජීවී සංරක්ෂණය උදෙසා ආකල්ප වර්ධනය කිරීමේ වැඩසටහන් 05 ක් පාසැල් ළමුන් සඳහා පාසැල් උපකරණ බෙදා දීමේ වැඩසටහන් 02 ක් , ශ්‍රමදාන වැඩසටහන් 02 ක් හොරොව්පොතාන ආදායම් උත්පාදක ව්‍යාපෘති 01 ක් , පුත්තලම වනජීවී කලාපයේ ප්‍රජා පාදක ව්‍යාපෘති සඳහා ක්ෂුද්‍ර සැලසුම් සකස් කිරීමේ වැඩසටහන් 02 සහ ගැල්වේස්ලෑන්ඩ් ජාතික උද්‍යානය අසල ඇති ප්‍රජාකේන්ද්‍රය අළුත්වැඩියා කිරීම සහ ගල්ඔය ජාතික උද්‍යානය අවට පෙර පාසැල සඳහා ගොඩනැගිල්ලක් ඉදි කිරීම අවසන්කර ඇත. | 4 | 3.85 | **96** |
| 3041 | සමුද්‍ර සංරක්ෂණය<br>• සමුද්‍ර ජීවී සංරක්ෂණය පිළිබඳව විවිධ පාර්ශවයන් දැනුවත් කිරීමේ වැඩසටහන් 20 ක් ඉදිරියේදී පැවැත්වීමට සැලසුම් කර ඇත. | 19.15 | 1.54 | **8** |
| 3042 | වාසස්ථාන සුපෝෂණය<br>• හෙක්ටාර් 330 ක ආක්‍රමණශීලී ශාක සහ තෘණ තළමනාකරණ කටයුතු සිදු කිරීමට නියමිතව ඇත.<br>• වැව් 02 ක අළුත්වැඩියා කටයුතු සිදුකරමින් පවතී.<br>• ජල සැපයුම් පද්ධති 03 ස්ථාපිත කිරිමේ ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවතී. | 44.30 | 25.66 | **58** |
| 3043 | රක්ෂිත ප්‍රදේශවල වනජීවී සංරක්ෂණය පිළිබඳ පර්යේෂණ සිදු කිරීම. | 0 | 0 | **0** |
| | එකතුව | **1,205.73** | **943.14** | **78** |



යාල ජාතික උද්‍යාන මූලස්ථානයේ ප්‍රවේශ පත්‍ර කවුළුව ඉදි කිරීම



යාල වනජීවී සංචාරක බංගලාව ඉදිකිරීම

## 2.7. 2017 වසරේ දී දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන ලද සුවිශේෂ සේවාවන්

- වනජීවි රක්ෂිත ජාලය තුල වන අපරාධ මැඩපැවත්වීම සඳහා වැටලීම් 1,048 ක් සිදුකර වනසත්ව හා වෘක්ෂලතා අඥාපනත යටතේ නීතිය ක්‍රියාත්මක කර රු.මි. 34.86 ක දඩ මුදල් අයකරගෙන ඇත.

- 2017 වසරේ වනඅලි -මිනිස් ගැටුම අවම කිරීම සඳහා පහත සඳහන් ලෙස අලි වෙඩි මිල දී ගෙන වනඅලි තර්ජන සහිත ප්‍රදේශවලට බෙදා හැර ඇත.

| අලිවෙඩි වර්ගය | ප්‍රමාණය | වියදම (රු.මි.) |
|---|---|---|
| ගිගුම් (ලොකු) | 360,000 | 27.61 |
| ගිගුම් (කුඩා) | 150,000 | 10.02 |
| සංඥා දහර | 225,000 | 31.63 |
| **එකතුව** | **735,000** | **69.26** |

- නව සංශෝධිත වනඅලි හානි වන්දි ක්‍රමය සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇති අතර ඒ යටතේ පහත සඳහන් ලෙස වන්දි ගෙවීම් සංශෝධනය වී ඇත.

| වන්දි වර්ගය | පෙර පැවති වන්දි ක්‍රමය යටතේ වන්දි මුදල (රු.) | නව වන්දි ක්‍රමය යටතේ වන්දි මුදල (රු.) |
|---|---|---|
| ජීවිත හානි | 200,000 | 500,000 |
| ශාරීරික හානි | | |
| පූර්ණ බෙලහීනතාවය | 200,000 | 500,000 |
| අර්ධ බෙලහීනතාවය | 75,000 | 75,000 |
| දේපොළ හානි | 100,000 | 100,000 |

- WILDLANKA අන්තර්ජාතික පර්යේෂණ සම්මන්ත්‍රණය 2017 වසරේ අගෝස්තු මස 15 හා 16 දෙදින තුල ටාජ් සමුද්‍රා හෝටලයේදී “දේශගුණික වෙනස්වීම් සහ සංරක්ෂණය” තේමාව යටතේ දේශීය හා විදේශීය පර්යේෂකයින් රැසකගේ සහභාගිත්වයෙන් පැවත්විය.



# 3. ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

## දැක්ම

**"ලෝකයේ විශිෂ්ටතම සත්වෝද්‍යාන පවත්වා ගෙන යනු ලබන ආයතනයක් බවට පත්වීම."**

## මෙහෙවර

**"නවීන සත්වෝද්‍යාන සංකල්ප යටතේ, ආකර්ෂණීය ශිල්පීය ක්‍රම සහ ප්‍රවීණතාවයන් උපයෝගී කර ගනිමින්, පිළිගත් නීති රීති වලට අනුකූලව උපරිම රැකවරණය යටතේ නිවහන සපයමින්, විවිධත්වයෙන් යුතු සෞඛ්‍ය සම්පන්න සත්ත්ව එකතුවක් ප්‍රදර්ශනය කිරීම."**

## ප්‍රධාන පරමාර්ථ

- **සත්ත්ව අභිජනනය හා සංරක්ෂණය**
- **සත්ත්ව සුබසාධනය**
- **අධ්‍යාපනය**
- **පර්යේෂණය**
- **ප්‍රදර්ශනය හා විනෝදාස්වාදය**

# 3. ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

## 3.1. හැඳින්වීම

වන සතුන් අල්ලා තබා ගෙන පිටරට සත්වෝද්‍යාන වෙත ප්‍රවාහනය කරන තුරු රඳවා තබා ගන්නා පුද්ගලික වන සත්ත්ව එකතුවක් ලෙස 1920 දශකයේ පෙර භාගයේ දී දෙහිවල ප්‍රදේශයේ අක්කර 11 ක භූමි භාගයක් තුළ ජර්මන් ජාතික ජෝන් හාගෙන්බර්ග් මහතා විසින් ආරම්භ කරන ලද දෙහිවල සත්වෝද්‍යානය වර්ෂ 1936 ජූලි 01 වන දින රජයට පවරා ගන්නා ලදී.

පසුව මෙම සත්වෝද්‍යානය වර්ෂ 1946 දී ස්වාධීන රාජ්‍ය දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපිත කරන ලදී.පසුව ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ පාලනය සහ කළමනාකරණය කිරීමේ කටයුතු 1982 අංක 41 දරණ ජාතික සත්ත්ව උද්‍යාන පනතේ විධිවිධාන යටතට පත් කරන ලදී.

මේ වන විට ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ දෙහිවල ජාතික සත්වෝද්‍යානය, පින්නවල අලි අනාථාගාරය, පින්නවල සත්වෝද්‍යානය සහ රිදියගම සෆාරි උද්‍යානය යන උද්‍යාන ද ගෝනපොල සත්වෝද්‍යාන ගොවිපළ ද පාලනය වේ.

## 3.2. කාර්ය මණ්ඩල තොරතුරු

2017.12.31 දිනට ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව 882 ක් වන අතර එදිනට සේවයේ නියුතු සේවක සංඛ්‍යාව 695 කි.

| සේවක වර්ගීකරණය අනුව 2017.12.31 දිනට අනුමත සේවක සංඛ්‍යාව හා එදිනට සේවයේ නියුතු සේවක සංඛ්‍යාව | | | |
|---|---|---|---|
| **සේවක වර්ගීකරණය** | | **2017.12.31 දිනට සේවක සංඛ්‍යාව** | |
| | | **අනුමත** | **සේවයේ නියුතු** |
| 1 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 29 | 24 |
| 2 | තෘතීය මට්ටම | 02 | 01 |
| 3 | ද්විතීය මට්ටම | 230 | 166 |
| 4 | ප්‍රාථමික මට්ටම | 621 | 504 |
| **එකතුව** | | **882** | **695** |

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව 2017 වර්ෂය තුළ විවිධ තනතුරු සඳහා සේවකයන් 105 දෙනෙකු බඳවා ගන්නා ලදී.

| 2017 නව බඳවා ගැනීම් | | |
|---|---|---|
| **අනු අංකය** | **තනතුර** | **බඳවා ගත් සංඛ්‍යාව** |
| 1 | අලි බලන්නා | 10 |
| 2 | සත්ත්ව භාරකරු | 24 |
| 3 | ට්‍රැක්ටර් ක්‍රියාකරු | 2 |
| 4 | දම්වැල් කියත් ක්‍රියාකරු | 2 |
| 5 | ජල පොම්ප ක්‍රියාකරු | 1 |
| 6 | රිය සහායක | 4 |
| 7 | ආරක්ෂක නියාමක | 8 |
| 8 | උද්‍යාන කම්කරු | 23 |
| 9 | කම්කරු | 31 |
| **එකතුව** | | **105** |

# 3.3.මෙහෙයුම් ඒකක

## 3.3.1.ප්‍රධාන කාර්යාලය

2017 ජූලි මස 27 දින සිට එතෙක් දෙහිවල සත්ත්ව උද්‍යානය තුල ස්ථාපිතව පැවති ප්‍රධාන කාර්යාලය ටෙන්ඩර් කැඳවීම තුලින් තෝරාගන්නා ලද 251/2 ඒ, 251/2 බී, කොළඹ පාර, වත්තතෙ ගෙදර හන්දිය, මහරගම යන ස්ථානයේ පිහිටි ගොඩනැගිල්ලේ ස්ථාපිත කරන ලදී.

අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු දෙපාර්තමේන්තුවේ පරිපාලනය සහ මූල්‍ය පරිපාලනයට අදාළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 10 දෙනෙක් ද තෘතීය මට්ටමේ නිලධාරීන් 1 ක් ද සහය කාර්යය මණ්ඩලයේ 41 ක් ද ප්‍රධාන කාර්යාලයට අනුයුක්තව සේවය කරනු ලබයි.

## 3.3.2. දෙහිවල ජාතික සත්වෝද්‍යානය



ජෝන්හාගෙන් බර්ග් මහතා විසින් පුද්ගලික වන සත්ත්ව එකතුවක් ලෙස 1920 දශකයේ පෙර භාගයේ දී අක්කර 11ක භූමි භාගයක් සහිතව ආරම්භ කරන ලදී. එය 1936 වර්ෂයේ දී රජයට පවරා ගන්නා ලද අතර මේ වන විට අක්කර 23 ක භූමි භාගයක් පුරා පැතිරී ඇත.

දේශීය හා විදේශීය ක්ෂීරපායී, පක්ෂි, උරග සහ මත්ස්‍ය විශේෂ රාශියකින් සමන්විත අධ්‍යාපනික වටිනාකමකින් යුතු සත්ත්ව එකතුවක් දෙහිවල සත්වෝද්‍යානය සතුව පවතී.

2017 වර්ෂයේ දෙහිවල ජාතික සත්වෝද්‍යානය නැරඹීමට පැමිණි දේශීය නරඹන්නන් සංඛ්‍යාව 1,360,566 ක් සහ විදේශීය නරඹන්නන් සංඛ්‍යාව 27,626 කි. ඒ අනුව, සමස්ත නරඹන්නන් සංඛ්‍යාව 1,388,192 ක් වේ.

## 3.3.3. පින්නවල අලි අනාථාගාරය

පින්නවල අලි අනාථාගාරය වර්ෂ 1975 දී රඹුක්කන-පින්නවල අක්කර 25 ක භූමි ප්‍රදේශයක් තුළ අනාථ වූ අලින් පස් දෙනෙකුගෙන් යුතුව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ස්ථාපිත කරන ලදී. පසුව 1982 දී පින්නවල අලි අනාථාගාරය ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව යටතට පවරා ගන්නා ලදී.



අලි ඇතුන් 85 දෙනෙකු (අලි අනාථාගාරයට පමණක් අයත් අලි ඇතුන් 69 ක් සහ උසාවි නියෝග මත රඳවා සිටින හස්තීන් 16 ඇතුළුව) 2017 වර්ෂය අවසන් වන විට පින්නවල අලි අනාථාගාරය සතු විය.පින්නවල අලි අනාථාගාරය ආරම්භයේ සිට මේ දක්වා, අලි පැටවුන් 70 ක් උපත ලබා ඇති අතර 2017 වර්ෂයේ දී උපත් වාර්තා වී නැත.

2017 වර්ෂය තුළ පින්නවල අලි අනාථාගාරය නැරඹීමට පැමිණි දේශීය නරඹන්නන් සංඛ්‍යාව 611,584 ක් සහ විදේශීය නරඹන්නන් සංඛ්‍යාව 339,744 කි .ඒ අනුව, සමස්ත නරඹන්නන් සංඛ්‍යාව 951,328 ක් වේ.

## 3.3.4. පින්නවල සත්වෝද්‍යානය

පින්නවල අලි අනාථාගාරය නැරඹීමට පැමිණෙන සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමත් විවෘත සත්වෝද්‍යාන සංකල්පය නරඹන්නන්ට ලබා දීමත් අරමුණු කර ගෙන අක්කර 54 ක භූමි ප්‍රමාණයක විවෘත සත්වෝද්‍යානයක් ලෙස පින්නවල නව සත්වෝද්‍යානය ආරම්භ කරන ලදී. මෙම සත්වෝද්‍යානයෙන් කූඩු හෝ කුඩා සත්ත්ව අරණ වලට වඩා නිදහස් ව ජීවත් විය හැකි ඉඩකඩක් සතුන්ට ලබා දීමටත් නරඹන්නන් සඳහා වඩා වැඩි නිරීක්ෂණ පහසුකම් ලබා දීමටත් අදහස් කරයි.



මෙහි ශ්‍රී ලංකා දිවි අරණ, මිශ්‍ර මුව අරණ, වලස් අරණ, කිඹුල් අරණ යන සත්ත්ව අරණ ඉදිකිරීම් කටයුතු අවසන් කර ප්‍රදර්ශනය සඳහා විවෘතව ඇත.ප්‍රදර්ශනය කටයුතු 2015.04.17 දින සිට ආරම්භ කරන ලදී.

2017 වර්ෂය තුළ දේශීය නරඹන්නන් 253,266 ක් සහ විදේශීය නරඹන්නන් 1,559 ක් පින්නවල සත්වෝද්‍යානය නැරඹීමට පැමිණ ඇත. ඒ අනුව, සමස්ත නරඹන්නන් සංඛ්‍යාව 254,825 ක් වේ.

## 3.3.5. හම්බන්තොට සෆාරි උද්‍යානය

නව සත්වෝද්‍යාන සංකල්ප මත අක්කර 500 ක භූමි ප්‍රමාණයක ඉදිකෙරෙන සෆාරි උද්‍යානය ප්‍රථම අදියර 2016 මාර්තු 28 දින ආරම්භ විය.සිංහ කලාපය, ලෝක සත්ත්ව කලාපය හා ආසියානු අලි ඇතුන් සිටින කලාපය ප්‍රථම අදියර තුලින් මහජනයාට විවෘත විය.ඉදි කෙරෙමින් පවතින සත්ත්ව කලාප අතර අප්‍රිකානු ශාක භක්ෂක සත්ත්ව කලාපය, බෙංගාල කොටි කලාපය, ආසියානු සත්ත්ව කලාපය, ශ්‍රී ලංකා දිවි කලාපය,ඕස්ට්‍රේලියානු කලාපය, වීටා සතුන් සහිත කලාපය හා චිම්පන්සි කලාපය යන සත්ත්ව කලාප වේ.



තවද පක්ෂීන්, බළල් පවුලේ කුඩා සතුන්, වඳුරු විශේෂ සහ කුඩා ශාක භක්ෂකයින් සහිත අක්කර 35 ක භූමි ප්‍රමාණයකින් යුතු කුඩා සත්ත්ව රාජධානියක් ද, අක්කර 10 ක භූමි ප්‍රමාණයකින් යුතු උරග උයනක් සහ අක්කර 10 ක භූමි ප්‍රමාණයකින් යුතු සංරක්ෂණය සඳහාම වෙන් වූ සත්ත්ව සංරක්ෂණ මධ්‍යස්ථානයක් ද ඉදි වෙමින් පවතී.

ශ්‍රී ලාංකිකයින්ට සෆාරි සංචාරක අත්දැකීමක් ලබා දෙමින් පාරිසරික සංවරණය ප්‍රවර්ධනයට දායකවීම, සත්වෝද්‍යාන සත්ත්ව විශේෂ සඳහා අභිජනන වැඩසටහන් පැවැත්වීම, ගැළපෙන මාංශ භක්ෂක සතුන් ඔවුන්ගේ සාමාන්‍ය පරිසරය තුළට නැවත මුදාහැරීම සහ හුදකලා සත්ත්ව ගහන වල ජාන සංචිතය වැඩිදියුණු කිරීම මෙහි මූලික පරමාර්ථ අතර වේ.

2017 වර්ෂය තුළ දේශීය නරඹන්නන් 290,854 ක් සහ විදේශීය නරඹන්නන් 756 ක් හම්බන්තොට සෆාරි උද්‍යානය නැරඹීමට පැමිණ ඇත. ඒ අනුව, සමස්ත නරඹන්නන් සංඛ්‍යාව 291,610 ක් වේ.

## 3.3.6. සත්ත්ව ආහාර සපයන ගෝනපොළ ගොවිපොළ



දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ ශාක භක්ෂක සතුන් සඳහා අවශ්‍ය නැවුම් සහ පෝෂණ ගුණයෙන් යුතු ආහාර වලින් කොටසක් සැපයීම පිණිස මෙම ගොවිපොළ 1997 වර්ෂයේ දී හොරණ - ගෝනපොළ ප්‍රදේශයේ අක්කර 16 ක භූමියක් තුල ස්ථාපිත කරන ලදී. 2017 වර්ෂය තුළ රු.මි.4.62 ක් වටිනා සත්ත්ව ආහාර ප්‍රමාණයක් දෙහිවල සත්වෝද්‍යානය වෙත සපයන ලදී.

ගෝනපොළ ගොවිපොළ සත්වෝද්‍යාන අරමුණු සඳහා වඩාත් ඵලදායකව දායක කර ගනිමින් දෙහිවල සත්වෝද්‍යානයේ සත්ත්ව සංරක්ෂණ මධ්‍යස්ථානය හා සත්ත්ව නිරෝධායන පෙදෙස මෙහි ඉදි කිරීමට නියමිත ය.

## 3.4. සත්ත්ව එකතුව

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන පරමාර්ථ අතරින් පළමු ස්ථානය හිමි වන්නේ සත්ත්ව සංරක්ෂණය හා අභිජනනය උදෙසා ය. එම පරමාර්ථය ඉටුකර ගැනීම උදෙසා, දැනට ලෝකයේ වඳ වී යාමේ තර්ජනයට ලක් වී ඇති සතුන් ආරක්ෂා කර ගනිමින් 2017.12.31 දින වන විට සත්ත්ව විශේෂ 250 කට අයත් සතුන් 4902 කට නිවහන සපයනු ලැබීය. දෙපාර්තමේන්තුව සතු එක් එක් මෙහෙයුම් ඒකක යටතේ 2017.12.31 දිනට නිවහන සපයනු ලැබූ සත්ත්ව එකතුව පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

මෙයට අමතරව නිදහසේ වෙසෙන සමනල හා අනෙකුත් අපෘෂ්ඨවංශි විශේෂ සහ නිදැල්ලේ වෙසෙන කුරුළු විශේෂ රාශියක් මෙම උද්‍යාන තුල හඳුනාගත හැකිය.

| සත්ත්ව වර්ගීකරණය | | විශේෂ/පවුල් | සත්ත්වයින් ප්‍රමාණය |
|---|---|---|---|
| **දෙහිවල ජාතික සත්වෝද්‍යානය** | | | |
| 1 | ක්ෂීරපායී | 65 | 301 |
| 2 | පක්ෂි | 79 | 582 |
| 3 | උරග | 36 | 198 |
| 4 | මත්ස්‍ය සහ වෙනත් මුහුදු ජීවීන් | 68 | 3151 |
| **එකතුව** | | **248** | **4232** |
| **පින්නවල අලි අනාථාගාරය** | | | |
| **1** | ක්ෂීරපායී - ආසියානු අලියා | 01 | 85 |
| **එකතුව** | | **01** | **85** |
| **පින්නවල සත්වෝද්‍යානය** | | | |
| 1 | ක්ෂීරපායී | 13 | 146 |
| 2 | පක්ෂි | 08 | 35 |
| 3 | උරග | 03 | 09 |
| **එකතුව** | | **24** | **190** |
| **හම්බන්තොට සෆාරි උද්‍යානය** | | | |
| 1 | ක්ෂීරපායී | 30 | 266 |
| 2 | පක්ෂි | 10 | 27 |
| 3 | උරග | 02 | 09 |
| **එකතුව** | | **42** | **302** |
| **ගෝනපොළ ගොවිපොළ** | | | |
| 1 | ක්ෂීරපායී | 01 | 02 |
| 2 | පක්ෂි | 09 | 91 |
| **එකතුව** | | **10** | **93** |
| **ජා.ස.දෙ. සතු සමස්ත සත්ත්ව එකතුව** | | **325** | **4902** |

## 3.5. 2017 වර්ෂයේ සත්ත්ව හුවමාරු වැඩසටහන

සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට සතුන් ලබාගැනීමේ ප්‍රධානතම මාර්ගය විදේශීය සත්වෝද්‍යාන සමඟ සත්ත්ව හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමයි. මේ මඟින් දෙපාර්තමේන්තුවේ සත්ත්ව විශේෂ සංඛ්‍යාව ඉහල නැංවීම, නව ජාන එකතු කිරීම තුලින් අභිජනන වැඩසටහන් විධිමත් කර නිරෝගී සත්ත්ව පරම්පරාවක් ඇති කිරීම අරමුණු කරනු ලබයි.

2017 වර්ෂයේ දී ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව විසින් සත්ත්ව හුවමාරු වැඩසටහන යටතේ විදේශීය සත්වෝද්‍යාන සමඟ සතුන් හුවමාරු කිරීමක් සිදුකර නොමැත.

## 3.6. අධ්‍යාපනික,පර්යේෂණ සහ විශේෂ වැඩසටහන්

විතැන් සංරක්ෂණ මධ්‍යස්ථානයක් වශයෙන් ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව විවිධ අධ්‍යාපනික වැඩසටහන් පවත්වමින් සත්ත්ව සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳ සහ සත්ත්ව විශේෂ පිළිබඳ තොරතුරු මහජනතාව වෙත ලබා දෙයි. තවද එක් එක් මෙහෙයුම් ආයතන විසින් 2017 වර්ෂය තුළ දී විවිධ වූ විශේෂාංග පවත්වමින් දදැයේ දරුවන් සඳහා අධ්‍යාපනික දැනුමක් මෙන් ම විනෝද වීමේ අවස්ථාවද ලබා දෙන ලදී.

2017 වර්ෂය තුළ එක් එක් මෙහෙයුම් ආයතන මඟින් ක්‍රියාත්මක කරන ලද අධ්‍යාපනික සහ වෙනත් විශේෂ වැඩසටහන් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

### 3.6.1. දෙහිවල ජාතික සත්වෝද්‍යානය

#### 3.6.1.1.අධ්‍යාපනික වැඩසටහන්

| අනු අංකය | අධ්‍යාපනික වැඩසටහන් වර්ගය | ක්‍රියාකාරකම | ක්‍රියාකාරකම් ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | දේශන | විශ්ව විද්‍යාල සිසුන් සඳහා දේශන (බොරැල්ල ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය) | 02 |
| | | පාසල් ව්‍යාපෘති සඳහා දැනුවත් කිරීම | 117 |
| | | ක්ෂේත්‍ර චාරිකා- සේවක මහතුන් සඳහා (නකල්ස් සහ වස්ගමුව වනෝද්‍යාන ආශ්‍රිතව) | 01 |
| | | සේවක මහතුන් සඳහා දේශන | 18 |
| | | පාසල් ළමුන් සඳහා අධ්‍යාපනික වැඩසටහන් (පිටත) | 49 |
| | | බාහිර ඉල්ලීම් මත සත්වෝද්‍යානයෙන් බැහැරව කරනු ලබන දේශන. (පාසල්, රෝහල්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, වනජීවී ආයතනය) | 08 |
| | | බාහිර ඉල්ලීම් මත සත්වෝද්‍යානය තුළ කරනු ලබන දේශන (පාසල්, විශ්ව විද්‍යාල, ගුවන් හමුදාව, පාරම්පරික වෛද්‍යවරු) | 21 |
| 2 | ආයතනික පුහුණුව | විශ්ව විද්‍යාල සිසුන් (සබරගමුව, ශ්‍රී ජයවර්ධනපුර, ඌව වෙල්ලස්ස). | 7 |
| 3 | විශ්ව විද්‍යාල ව්‍යාපෘති | විශ්ව විද්‍යාල සිසුන් (කොළඹ,කැලණිය,රුහුණ) | 4 |
| 4 | මාර්ගෝපදේශ වැඩසටහන් | පාසල්, විශ්ව විද්‍යාල, වෙනත් කණ්ඩායම්. | 51 |
| 5 | ස්වේච්ඡා සේවකයින් | දේශීය<br>විදේශීය | 07<br>02 |
| 6 | ජංගම ප්‍රදර්ශන ඒකකය | ප්‍රදර්ශන | 23 |
| 7 | විස්තර කථන වැඩසටහන් | නරඹන්නන් සඳහා | 117 |
| 8 | අධ්‍යාපනික පුවරු | නාම පුවරු | 185 |
| | | විස්තරාත්මක පුවරු | 67 |
| 9 | වැඩමුළු | බොරැල්ල ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය සිසුන් සඳහා, බස්නාහිර පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව. | 2 |

#### 3.6.1.2. විශේෂාංග සහ විශේෂ දින සැමරුම්

- සිංහල හින්දු අළුත් අවුරුදු උත්සවය වෙනුවෙන් අලි ඇතුන් උදෙසා හිස තෙල් ගෑමේ චාරිත්‍රානුකූල උත්සවය පැවැත්වීම.
- 2017 ඔක්තෝබර් 01 ලෝක ළමා දිනය වෙනුවෙන් ළමුන් සඳහා අධ්‍යාපනික හා විනෝදාත්මක වැඩසටහන් පැවැත්වීම.
- 2017 සැප්තැම්බර් 21 දින සිට සිකුරාදා, සෙනසුරාදා සහ ඉරිදා දින වල රාත්‍රි 7-10 දක්වා දෙහිවල සත්වෝද්‍යානය රාත්‍රි නැරඹුම සඳහා විවෘත කිරීම.
- ජෛව විවිධත්ව දිනය සැමරීමේ උත්සවය පැවැත්වීම.

### 3.6.2. පින්නවල අලි අනාථාගාරය
### 3.6.2.1. අධ්‍යාපනික වැඩසටහන්

2017 වර්ෂය තුළ පින්නවල අලි අනාථාගාරය විසින් විවිධ අධ්‍යාපනික වැඩසටහන් පවත්වමින් අලි ඇතුන් සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳ සහ අලි ඇතුන් පිළිබඳ තොරතුරු මහජනතාව වෙත ලබා දෙන ලදී. එම වැඩසටහන් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| අනු අංකය | අධ්‍යාපනික වැඩසටහන් වර්ගය | ක්‍රියාකාරකම | ක්‍රියාකාරකම් ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | දේශන | විශ්ව විද්‍යාල සිසුන් සඳහා දේශන | 06 |
| | | පාසල් ව්‍යාපෘති සඳහා දැනුවත් කිරීම් | 12 |
| | | පාසල් ළමුන් සඳහා අධ්‍යාපනික වැඩසටහන් | 34 |
| | | පෙර පාසල් ළමුන් සඳහා අධ්‍යාපනික වැඩසටහන් | 01 |
| | | සේවකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් (ඩෙංගු මදුරුවන් ව්‍යාප්තිය වැළැක්වීම, මැලේරියා උණ රෝගය සහ එය ව්‍යාප්ත වීමේ අවදානම) | 02 |
| | | දේශීය නරඹන්නන් දැනුවත් කිරීම් කිරීමේ වැඩසටහන් | 12 |
| | | විදේශිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 47 |
| 2 | සේවක පුහුණු වැඩසටහන් | ජ්‍යෙෂ්ඨ අලි බලන්නා පුහුණු වැඩසටහන | 01 |
| | | ප්‍රාථමික සේවකයන් සඳහා දෙමළ භාෂා පුහුණු වැඩසටහන් | 03 |
| 3 | ස්වේච්ඡා සේවක වැඩසටහන | ස්වේච්ඡා සේවක සහභාගී වීම් | 51 |
| 4 | ප්‍රදර්ශන | ප්‍රදර්ශන සඳහා සහභාගී වීම් | 05 |
| 5 | පශු වෛද්‍ය අංශය මඟින් බාහිර පාර්ශවයන් සඳහා පුහුණු වැඩසටහන් | සීමාවාසික වෛද්‍ය පුහුණුව | 04 |
| | | දේශීය විශ්ව විද්‍යාල සිසුන් පුහුණුව (වයඹ, පේරාදෙණිය) | 06 |
| | | විදේශීය විශ්ව විද්‍යාල සිසුන් පුහුණුව (රාජකීය පශු වෛද්‍ය විද්‍යාලය- ලන්ඩන්) | 01 |

### 3.6.2.2. පර්යේෂණ

හස්තීන්ගේ අස්ථි බිඳීම් කළමනාකරණය (Elephant fracture Management)

### 3.6.2.3. විශේෂාංග සහ විශේෂ දින සැමරුම්

- 2017 පෙබරවාරි 16 දින පින්නවල අලි අනාථාගාරයේ 42 වන සංවත්සරය වෙනුවෙන් "කුංචනාදය 2017" නමින් විශේෂ උත්සවයක් පැවැත්වීම.
- 2017 ජුනි 05 ලෝක පරිසර දිනය වෙනුවෙන් පාසල් ළමුන් වෙනුවෙන් අධ්‍යාපනික වැඩසටහනක් සහ රුක් රෝපණ වැඩසටහනක් පැවැත්වීම.
- 2017 අගෝස්තු 12 ලෝක අලි දිනය වෙනුවෙන් අලි ඇතුන්ගේ වැදගත්කම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- 2017 ඔක්තෝබර් 01 ලෝක ළමා දිනය වෙනුවෙන් ළමුන් සඳහා අධ්‍යාපනික හා විනෝදාත්මක වැඩසටහන් පැවැත්වීම.
- සිංහල හින්දු අළුත් අවුරුදු උත්සවය සහ අලි ඇතුන් උදෙසා හිස තෙල් ගෑමේ චාරිත්‍රානුකූල උත්සවය පැවැත්වීම.
- සේවක සුබසාධනය උදෙසා,

  සුහදත්වය වර්ධනය කර ගැනීම සඳහා ක්‍රීඩා තරඟාවලි පැවැත්වීම.
  සමස්ත කාර්ය මඩුල්ල වෙනුවෙන් වෛද්‍ය කඳවුරක් පැවැත්වීම.

## 3.6.3. පින්නවල සත්වෝද්‍යානය
### 3.6.3.1. අධ්‍යාපනික වැඩසටහන්

2017 වර්ෂය තුළ පින්නවල සත්වෝද්‍යානය විසින් විවිධ අධ්‍යාපනික වැඩසටහන් පවත්වමින් සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ අරමුණු ලඟාකර ගැනීමට කටයුතු කර ඇත.

| අනු අංකය | අධ්‍යාපනික වැඩසටහන් වර්ගය | ක්‍රියාකාරකම | ක්‍රියාකාරකම් ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | දේශන | පාසල් ළමුන් සඳහා අධ්‍යාපනික වැඩසටහන් | 01 |
| | | බාල දක්ෂ ළමුන් සඳහා අධ්‍යාපනික වැඩසටහන් | 01 |
| | | දේශන (ආයතනයෙන් බැහැර) | 03 |
| | | සේවකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් (ජෛව පද්ධති පිළිබඳ දැනුවත් කිරීම) | 01 |
| 2 | පුහුණු වැඩසටහන් | සේවක පුහුණු වැඩසටහන් (ශාක කප්පාදුව, ප්‍රතිකාරය සහ නඩත්තුව පිළිබඳ පුහුණු වැඩසටහන්, දැනුම කළමනාකරණය පිළිබඳ වැඩමුළුව, මිය ගිය සතුන් පිරවීම සහ අස්ථි පද්ධති සකස් කිරීමේ මූලික පුහුණුව, රථවාහන හා යන්ත්‍ර සූත්‍ර පරිපාලනය,නව CIGAS වැඩසටහන පිළිබඳ පුහුණු පාඨමාලාව,පෝනීන් හැසිරවීම, TRAINING PROGRAMME ON META-DATA PORTAL FOR THE TECHNICAL LEVEL OFFICERS, ජ්‍යෙෂ්ඨ අලි බලන්නන්ගේ දෙවන පුහුණු පාඨමාලාව,නේවාසික නොවන දෙවන භාෂා (දෙමළ) පුහුණු පාඨමාලාව, ගබඩා කළමනාකරණය සහ මිලදී ගැනීමේ ක්‍රියාවලිය, KEEPER TALK පිළිබඳ මූලික පුහුණු වැඩසටහන) | 19 |
| 3 | සමීක්ෂණ | ශාක පිළිබඳ තොරතුරු මහජනතාව වෙත ලබා දිය යුතු අකාරය සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකිරීම. | 01 |

### 3.6.3.2. විශේෂාංග සහ විශේෂ දිනසැමරුම්

2017 ඔක්තෝබර් 01 ලෝක ළමා දිනය වෙනුවෙන් ළමුන් සඳහා අධ්‍යාපනික හා විනෝදාත්මක වැඩසටහන් පැවැත්වීම.

## 3.6.4. හම්බන්තොට සෆාරි උද්‍යානය
### 3.6.4.1. අධ්‍යාපනික වැඩසටහන්

පාරිසරික සංචරණයේ පළමු දේශීය අත්දැකීම ශ්‍රී ලාංකිකයින්ට ලබා දෙන හම්බන්තොට සෆාරි උද්‍යානය එහි කාර්යභාරය සාර්ථක කර ගැනීමට අවශ්‍ය අධ්‍යාපනික හා පුහුණු වැඩසටහන් පැවැත්වීම වෙනුවෙන් 2017 වසර තුළ අවධානය යොමු කරන ලදී.

| අනු අංකය | අධ්‍යාපනික වැඩසටහන් වර්ගය | ක්‍රියාකාරකම | ක්‍රියාකාරකම් ප්‍රමාණය |
|---|---|---|---|
| **1** | දේශන | සංචාරක මාර්ගෝපදේශකයන් සඳහා අධ්‍යාපනික වැඩසටහන. | 01 |
| **2** | වැඩමුළු | 2016 වර්ෂයේ ආරම්භ කරන ලද සෆාරි උද්‍යානයේ සත්ත්ව භාරකරුවන් සහ සංචාරක මාර්ගෝපදේශකයන් සඳහා වූ සය මාසික Spoken English පාඨමාලාව, සෆාරි උද්‍යානයේ සත්ත්ව භාරකරුවන් සඳහා සර්පයන් විශේෂ පිළිබඳ වැඩිදුර අධ්‍යාපනය. | 02 |

### 3.6.4.2. විශේෂාංග සහ විශේෂ දින සැමරුම්

- 2017.01.01 දින සෙත් පිරිත් සජ්ඣායනාව පැවැත්වීම.
- 2017.01.08 දින ජනාධිපති පදවි ප්‍රාප්තියට දෙවර්ෂ පූර්ණය නිමිත්තෙන් මහජන චීන සමූහාණ්ඩුවේ වන සංරක්ෂණ නියෝජ්‍ය අමාත්‍ය *වෙන් ෆෙංෂු* මැතිතුමා සහ තිරසර සංවර්ධන හා වනජීවී ගරු අමාත්‍ය ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමා අතින් ළමා උද්‍යානය හා ඒකක 12 කින් යුත් නව ග්‍රාමීය නිෂ්පාදන අලෙවි සංකීර්ණය සඳහා මුල් ගල් තැබීම.
- 2017.03.27 දින සෆාරි උද්‍යානය විවෘත කර වසරක් පිරීම නිමිත්තෙන් සර්වරාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනාව හා පසු දින භික්ෂූන් වහන්සේලා 15 නමකට උදේ දානය පිළිගැන්වීම.

2017 වසර තුළ විවිධ බාහිර ආයතන හරහා දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය වෙත ලබා දෙන ලද පුහුණු වැඩසටහන් පිළිබඳ සාරාංශය.


| අනු අංකය | පුහුණු පාඨමාලාව | පුහුණුව පවත්වන ලද ආයතනය | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | විශිෂ්ට අත්දැකීම් හුවමාරු කර ගැනීමේ වැඩමුළුව | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය | 01 |
| 02 | වත්කම් කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන (Training Program on Assets Management) | APFA | 02 |
| 03 | දැනුම කළමනාකරණය පිළිබඳ එක් දින වැඩමුළුව | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය | 09 |
| 04 | Diploma in Public Procurement &  Contract Administrations | මිලෝදා ආයතනය | 01 |
| 05 | රථවාහන හා යන්ත්‍ර සූත්‍ර පරිපාලනය | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 05 |
| 06 | ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (Certificate Course in English language) | SDFL | 04 |
| 07 | පරිපාලන නිලධාරීන් සඳහා වන ඵලදායිතා සංකල්ප පුහුණු පාඨමාලාව | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය | 01 |
| 08 | හරිත ඵලදායිතාව හා 3R ක්‍රමවේදය | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය | 04 |
| 09 | වාර්ෂික භාණ්ඩ පරීක්ෂණය හා වත්කම් අපහරණය | SDFL | 03 |
| 10 | වාහන  කළමනාකරණය | ප්‍රාග් ආයතනය | 01 |
| 11 | වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය කළමනාකරණය පිළිබඳ පුහුණුව | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය | 04 |
| 12 | බදුකරණය පිළිබඳ පාඨමාලාව | ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය | 01 |
| 13 | Workshop on innovative leadership & talent Management | | 01 |
| 14 | CPD Course on project Manage in PRIMAVERA | IESL | 01 |

| අනු අංකය | පුහුණු පාඨමාලාව | පුහුණුව පවත්වන ලද ආයතනය | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 15 | සිවිල් විශ්‍රාම වැටුප් ගණන් බැලීම හා ගෙවීම් පිළිබඳ පුහුණුව | SDFL | 01 |
| 16 | අභ්‍යන්තර විගණන හා අභ්‍යන්තර පාලන ක්‍රම | SDFL | 01 |
| 17 | Public Sector Capacity Development for Service Excellence | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 03 |
| 18 | දත්ත විශ්ලේෂණය පිළිබඳ මූලික සහතික පත්‍ර පාඨමාලාව | ශ්‍රී ලංකා පදනම | 01 |
| 19 | තොරතුරු දැන ගැනීමේ පනත පිළිබඳ එක් දින වැඩමුළුව | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 01 |
| 20 | සංවර්ධන සහකාර නිලධාරීන් හා කළමනාකරණ සහකාර නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය | SDFL | 05 |
| 21 | කොන්ත්‍රාත් පරිපාලනය ,ගෙවීම් කිරීමේ ක්‍රියා පටිපාටිය හා කොන්ත්‍රාත් ලිපි ගොනු නඩත්තුව | SDFL | 02 |
| 22 | කාර්යාල කටයුතු සඳහා Ms Word / Ms Excel හා විද්‍යුත් තැපැල, අන්තර්ජාල භාවිතය | SDFL | 01 |
| 23 | වැටුප් පරිවර්තනය පිළිබඳ පුහුණුව | SDFL | 02 |
| 24 | අභ්‍යන්තර විගණන අංශ කාර්ය මණ්ඩල පුහුණු වැඩමුළුව | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව | 01 |
| 25 | ගබඩා කළමනාකරණය හා මිල දී ගැනීමේ ක්‍රියා පටිපාටිය පිළිබඳ පුහුණු. | SDFL | 06 |
| 26 | බලශක්ති සංරක්ෂණය හා කාර්යක්ෂම භාවිතය පිළිබඳ ජාතික වැඩසටහන | | 01 |
| 27 | Practical Aspects of Bid Evolution | SDFL | 01 |
| 28 | ලීන් සංකල්පය පිළිබඳ පුහුණු වැඩමුළුව | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය | 02 |
| 29 | ඵලදායිතා සඳහා තොරතුරු තාක්ෂණය | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය | 03 |
| 30 | ඵලදායිතා මිනුම් හා විශ්ලේෂණ පිළිබඳ පුහුණුව | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය | 02 |


## 3.7. ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ සංචාරක පැමිණීම සහ ආදායම -2017

| මාසය | පැමිණීම | | | ආදායම (රු.මි.) | | | |
|---|---|---|---|---|---|---|---|
| | දේශීය | විදේශීය | එකතුව | දේශීය | විදේශීය | වෙනත් | එකතුව |
| ජනවාරි | 110,958 | 44,123 | 155,081 | 12.11 | 91.48 | 2.23 | 105.82 |
| පෙබරවාරි | 166,730 | 37,480 | 204,210 | 15.87 | 80.81 | 2.70 | 99.38 |
| මාර්තු | 201,452 | 33,932 | 235,384 | 15.00 | 73.66 | 2.58 | 91.25 |
| අප්‍රේල් | 188,308 | 28,586 | 216,894 | 18.61 | 59.65 | 2.76 | 81.02 |
| මැයි | 121,495 | 21,511 | 143,006 | 11.76 | 37.14 | 0.91 | 49.81 |
| ජූනි | 121,965 | 18,328 | 140,293 | 11.30 | 34.87 | 1.80 | 47.97 |
| ජූලි | 257,633 | 32,891 | 290,524 | 21.34 | 67.46 | 3.39 | 92.18 |
| අගෝස්තු | 478,673 | 35,345 | 514,018 | 42.67 | 72.18 | 2.77 | 117.62 |
| සැප්තැම්බර් | 295,305 | 25,126 | 320,431 | 28.76 | 47.00 | 2.40 | 78.16 |
| ඔක්තෝබර් | 214,328 | 28,130 | 242,458 | 20.91 | 49.18 | 3.53 | 73.61 |
| නොවැම්බර් | 108,484 | 24,587 | 133,071 | 11.32 | 49.23 | 2.53 | 63.08 |
| දෙසැම්බර් | 250,939 | 39,646 | 290,585 | 26.56 | 66.33 | 5.83 | 98.72 |
| **එකතුව** | **2,516,270** | **369,685** | **2,885,955** | **236.21** | **728.99** | **33.43** | **998.62** |

### 3.7.1. සංචාරකයින්ගේ පැමිණීම 2017




### 3.7.2. සංචාරකයින්ගෙන් ලද ආදායම 2017



## 3.7.3. 2016 සහ 2017 අතර සංචාරකයින්ගේ පැමිණීම සහ ආදායම සංසන්දනය

| මාසය | පැමිණීම | | ආදායම (රු.මි.) | |
|---|---|---|---|---|
| | 2016 | 2017 | 2016 | 2017 |
| ජනවාරි | 160,663 | 155,081 | 105.57 | 105.79 |
| පෙබරවාරි | 185,976 | 204,210 | 116.98 | 99.23 |
| මාර්තු | 224,993 | 235,384 | 104.57 | 91.03 |
| අප්‍රේල් | 218,794 | 216,894 | 76.20 | 80.82 |
| මැයි | 107,398 | 143,006 | 50.49 | 49.81 |
| ජූනි | 126,693 | 140,293 | 48.77 | 47.95 |
| ජූලි | 355,423 | 290,524 | 108.50 | 91.88 |
| අගෝස්තු | 552,892 | 514,018 | 134.36 | 117.53 |
| සැප්තැම්බර් | 324,162 | 320,431 | 91.23 | 78.02 |
| ඔක්තෝබර් | 247,200 | 242,458 | 79.52 | 73.61 |
| නොවැම්බර් | 128,179 | 133,071 | 74.26 | 63.08 |
| දෙසැම්බර් | 327,364 | 290,585 | 107.22 | 98.72 |
| **එකතුව** | **2,959,737** | **2,885,955** | **1097.66** | **998.62** |


## 3.7.4. ජාතික සත්වෝද්‍යාන සඳහා සංචාරක පැමිණීම සහ ආදායම - 2017

| උද්‍යානය | පැමිණීම | | | ආදායම (රු.මි.) | | | |
|---|---|---|---|---|---|---|---|
| | දේශීය | විදේශීය | එකතුව | දේශීය ප්‍රවේශ පත්‍ර | විදේශීය ප්‍රවේශ පත්‍ර | වෙනත් | එකතුව |
| දෙහිවල සත්වෝද්‍යානය | 1,360,566 | 27,626 | 1,388,192 | 108.12 | 42.20 | 17.745 | 168.067 |
| පින්නවල අලි අනාථාගාරය | 611,584 | 339,744 | 951,328 | 44.79 | 684.00 | 12.519 | 741.303 |
| පින්නවල සත්වෝද්‍යානය | 253,266 | 1,559 | 254,825 | 19.49 | 1.27 | 1.432 | 22.201 |
| හම්බන්තොට සෆාරි උද්‍යානය (2016.03.28 සිට) | 290,854 | 756 | 291,610 | 63.80 | 1.51 | 1.733 | 67.048 |
| **එකතුව** | **2,516,270** | **369,685** | **2,885,955** | **236.21** | **728.99** | **33.429** | **998.619** |


## 3.7.5. 2010 වසරේ සිට 2017 වසර දක්වා සංචාරක පැමිණීම සහ ආදායම

| වර්ෂය | පැමිණීම | ආදායම (රු.මි.) |
|---|---|---|
| 2010 | 2,324,360 | 587.74 |
| 2011 | 2,438,635 | 651.38 |
| 2012 | 2,196,704 | 645.29 |
| 2013 | 2,172,810 | 719.87 |
| 2014 | 2,042,887 | 906.50 |
| 2015 | 2,781,380 | 1,034.87 |
| 2016 | 2,959,737 | 1,097.66 |
| 2017 | 2,885,955 | 998.62 |

### 3.7.5.1. 2010 වසරේ සිට 2017 වසර දක්වා සංචාරක පැමිණීම




### 3.7.5.2. 2010 වසරේ සිට 2017 වසර දක්වා සංචාරක පැමිණීමෙන් ලද ආදායම




## 3.8. ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති

### 3.8.1. දෙහිවල ජාතික සත්වෝද්‍යානය සංවර්ධනය

නවීන සත්වෝද්‍යාන සංකල්ප වලට අනුව සත්වයින් සඳහා වැඩි ඉඩකඩ සහිත සත්ත්ව අරණ සහ නරඹන්නන් සඳහා නවීන පහසුකම් සපයමින් 2011 වර්ෂයේ සිට දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ නවීකරණ කටයුතු ආරම්භ කර ඇත.

**මූල්‍ය ප්‍රගතිය**

| | |
|---|---|
| 2017 ඒකාබද්ධ අරමුදලින් වෙන් කල ප්‍රතිපාදන | - රු.මි. 100.00 |
| 2017 සත්වෝද්‍යාන අරමුදලින් වෙන් කල ප්‍රතිපාදන | - රු.මි. 145.00 |
| ඒකාබද්ධ අරමුදලින් කල වියදම | - රු.මි. 99.36 |
| සත්වෝද්‍යාන අරමුදලින් කල වියදම | - රු.මි. 62.87 |
| මුළු වියදම | - රු.මි. 162.23 |
| 2011 වර්ෂයේ සිට සමුච්චිත වියදම - ඒකාබද්ධ අරමුදල | - රු.මි.527.08 |
| - සත්වෝද්‍යාන අරමුදල | - රු.මි. 223.43 |
| මුළු සමුච්චිත වියදම | - රු.මි. 750.50 |




මාර්ග අංක 08 සහ අවට පෙදෙස අලුත්වැඩියාව



චිම්පන්සි අරණ




ජගුවර් සහ සුදු ව්‍යාඝ්‍ර අරණ - අදියර- 2

| ප්‍රධාන ව්‍යාපෘතිය | උප ව්‍යාපෘති | වෙන් කරන ලද මුදල (රු.මි.) | සමුච්චිත සත්‍ය වියදම (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ සංවර්ධන කටයුතු | **රජයේ ඒකාබද්ධ අරමුදල** | **100.00** | **99.36** | |
| | • චිම්පන්සි අරණ | 19.00 | 20.98 | ඉදිකිරීම් අවසන්. |
| | • නිදහස් අලි අරණ - ඉතිරි වැඩ | 9.50 | 8.55 | ඉදිකිරීම් අවසන්. |
| | • මාර්ග අංක 08 සහ අවට පෙදෙස අලුත්වැඩියාව | 24.00 | 22.94 | ඉදිකිරීම් අවසන්. |
| | • මින් මැදුර අලුත්වැඩියාව | 2.30 | - | ඉදිකිරීම් අවසන්. |
| | • මායිම් තාප්පය-2 කොටස අලුත්වැඩියාව. | 4.80 | - | 29% ක් සම්පූර්ණ යි. NEMO ආයතනය වෙත ඉදිරි ඉදිකිරීම් කටයුතු භාරදී ඇත. |
| | • සත්ත්ව රෝහල - අදියර 1 | 22.00 | 22.06 | ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇත.ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී. |
| | • නිදහස් අලි අරණෙහි නරඹන්නන් සඳහා මාර්ගය | 3.00 | - | අවබෝධතා ගිවිසුම අත්සන් කර ඇත. |
| | • පෙර වර්ෂයේ නිම කරන ලද වැඩ සඳහා ගෙවීම. (සේවා සපයන මාර්ගය අදියර 1 සහ 2 , කාර්ය මණ්ඩලය සඳහා රථ ගාල සහ වැසිකිළිය, මායිම් තාප්පය-1කොටස අලුත්වැඩියාව) | 0.40 | 1.53 | - |
| | • කුඩා පරිමාණ සංවර්ධන කටයුතු | 15.00 | 23.31 | 2017 වර්ෂයට නියමිත සංවර්ධන කටයුතු අවසන්. |
| | **සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදල** | **145.00** | **62.87** | |
| | • ජගුවර් සහ සුදු ව්‍යාඝ්‍ර අරණ - අදියර-2 | 49.60 | 46.59 | ඉදිකිරීම් අවසන්. |
| | • ගෝනපොළ වැට අලුත්වැඩියා කිරීම | 3.90 | 1.47 | අලුත්වැඩියා කටයුතු අවසන්. |
| | • ළමා මුළුව අලුත්වැඩියා කිරීම - අදියර- 1 | 26.00 | - | 40% ක් සම්පූර්ණ යි. ඉදිකිරීම් ක්‍රියාත්මකයි. |
| | • ප්‍රවේශ ගොඩනැගිල්ල | 53.50 | 13.65 | 75 % ක් සම්පූර්ණ යි.ඉදිකිරීම ක්‍රියාත්මකයි. |
| | • ඔරන් උටං සතුන් සඳහා ගමන් මාර්ගය | 10.00 | - | BOQ ඇගයීම් කටයුතු සිදු කරමින් පවතී. |
| | • ප්‍රධාන කාර්යාලය ඉදිරිපිට රැහැන් එලීම. | 1.00 | 0.99 | ඉදිකිරීම් අවසන්. |
| | • පෙර වර්ෂයේ නිම කරන ලද වැඩ සඳහා ගෙවීම. | 1.00 | 0.16 | - |
| | **එකතුව** | **245.00** | **162.23** | |

## 3.8.2. පින්නවල අලි අනාථාගාරයේ ප්‍රධාන සංවර්ධන කාර්යයන්

පින්නවල අලි අනාථාගාරයේ සංවර්ධන වැඩ සඳහා 2017 වර්ෂය අවසන් වන විට රු.මි.63.47 ක් (රජයේ ඒකාබද්ධ අරමුදලින් රු.මි.23.20 ක් සහ සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදලින් රු.මි.40.27 ක්) වැය කර ඇත.

### මූල්‍ය ප්‍රගතිය

| | |
|---|---|
| 2017 ඒකාබද්ධ අරමුදලින් වෙන් කල ප්‍රතිපාදන | - රු.මි. 40.00 |
| 2017 සත්වෝද්‍යාන අරමුදලින් වෙන් කල ප්‍රතිපාදන | - රු.මි. 85.00 |
| ඒකාබද්ධ අරමුදලින් කල වියදම | - රු.මි. 23.20 |
| සත්වෝද්‍යාන අරමුදලින් කල වියදම | - රු.මි. 40.27 |
| මුළු වියදම | - රු.මි. 63.47 |

* ඇස්තමේන්තු මුදල සංශෝධනය වී ඇත.

### 2017 වසරේ සිදුකරන ලද සංවර්ධන කාර්යයන්


පවතින වැව පුළුල් කිරීම



සේවා සපයන මාර්ග අලුත්වැඩියා කිරීම



උද්‍යාන අංක VI සංවර්ධනය


නාරම්බැද්ද ප්‍රදේශයේ විවේක කාමරය


රාත්‍රී විවෘත කිරීමේ කටයුතු -වැට


තාප්පය සහ ආරක්ෂක කුටිය


තාප්පය සහ ආරක්ෂක කුටිය


අලි මඩු ඉදිකිරීම

| ප්‍රධාන ව්‍යාපෘතිය | උප ව්‍යාපෘති | වෙන් කරන ලද මුදල (රු.මි.) | සමුච්චිත සත්‍ය වියදම (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| පින්නවල අලි අනාථාගාරය | **රජයේ ඒකාබද්ධ අරමුදල** | **40.00** | **23.20** | |
| | • පවතින වැව පුළුල් කිරීම. | 14.50 | 6.76 | 70% ක් අවසන්. ඉදිකිරීම් ක්‍රියාත්මකයි. |
| | • සේවා සපයන මාර්ග අලුත්වැඩියා කිරීම | 3.00 | - | ඉදිකිරීම් අවසන්. |
| | • උද්‍යාන අංක VI සංවර්ධනය | 0.65 | - | ඉදිකිරීම් අවසන්. |
| | • නාරම්බැද්ද ප්‍රදේශයේ විවේක කාමරයක් ඉදිකිරීම | 2.00 | 1.96 | ඉදිකිරීම් අවසන්. |
| | • රාත්‍රී විවෘත කිරීම් කටයුතු. | | - | |
| | • වැට | 17.00 | 7.15 | 85% ක් සම්පූර්ණ යි.ඉදිකිරීම් ක්‍රියාත්මකයි. |
| | • කුඩා පරිමාණ සංවර්ධන කටයුතු | 2.85 | 7.32 | 2017ට නියමිත සංවර්ධන කටයුතු අවසන්. |
| | **සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදල** | **85.00** | **40.27** | |
| | • තාප්පය සහ ආරක්ෂක කුටිය අලුත්වැඩියාව. | 12.60 | 11.24 | ඉදිකිරීම් අවසන්. |
| | • අලි මඩු ඉදිකිරීම. | 13.00 | 4.70 | 70% ක් සම්පූර්ණ යි. ඉදිකිරීම් ක්‍රියාත්මකයි. |
| | • මාණ්ඩලික නිලධාරි නිලනිවාසය. | 15.00 | 8.07 | ඉදිකිරීම් අවසන්. |
| | • අකුණු සන්නායක. | 8.00 | 3.35 | 95% ක් සම්පූර්ණ යි. ඉදිකිරීම් ක්‍රියාත්මකයි. |
| | • රාත්‍රී විවෘත කිරීම් කටයුතු. | | | |
| | • සේවා සපයන මාර්ගය සහ ගමන් මාර්ගය - නිදහස් අලි පෙදෙස. | 25.50 | 10.43 | 20% ක් සම්පූර්ණ යි. ඉදිකිරීම් ක්‍රියාත්මකයි. |
| | • ආපනශාලා සහ වැසිකිළි පද්ධතිය. (උපදේශනසේවා සඳහා ගෙවීම.) | 2.00 | 2.48 | 90% ක් සම්පූර්ණ යි. ඉදිකිරීම් ක්‍රියාත්මකයි. |
| | • සූර්ය බල වීදි ලාම්පු සහ අනෙකුත් ඉදිකිරීම්. | 1.50 | - | 85% ක් සම්පූර්ණ යි. ඉදිකිරීම් ක්‍රියාත්මකයි. |
| | • කුඩා පරිමාණ සංවර්ධන කටයුතු. | 2.70 | | 2017ට නියමිත සංවර්ධන කටයුතු අවසන්.. |
| | • පෙර වර්ෂයේ නිම කරන ලද වැඩ සඳහා ගෙවීම. | 4.70 | | ගෙවීම් සිදු කරමින් පවතී. |
| | **එකතුව** | **125.00** | **63.47** | |

## 3.8.3. පින්නවල නව සත්වෝද්‍යානයේ ඉදිකිරීම් කටයුතු

### මූල්‍ය ප්‍රගතිය

| | | |
|---|---|---|
| 2017 ඒකාබද්ධ අරමුදලින් වෙන් කල ප්‍රතිපාදන | - රු.මි. | 53.80* |
| 2017 සත්වෝද්‍යාන අරමුදලින් වෙන් කල ප්‍රතිපාදන | - රු.මි. | 75.00 |
| ඒකාබද්ධ අරමුදලින් කල වියදම | - රු.මි. | 27.07 |
| සත්වෝද්‍යාන අරමුදලින් කල වියදම | - රු.මි. | 5.15 |
| මුළු වියදම | - රු.මි. | 32.23 |
| 2008 සිට සමුච්චිත වියදම - ඒකාබද්ධ අරමුදල | - රු.මි. | 654.95 |
| - සත්වෝද්‍යාන අරමුදල | - රු.මි | 444.41 |
| මුළු සමුච්චිත වියදම | - රු.මි. | 1099.36 |

* ඇස්තමේන්තු මුදල සංශෝධනය වී ඇත.

### 2017 වසරේ සිදුකරන ලද සංවර්ධන කාර්යයන්


සතුන් සඳහා ආහාර සකසන ගොඩනැගිල්ල



නරඹන්නන් සඳහා වැසිකිළි පද්ධතිය


පශු වෛද්‍ය අංශය සඳහා ගොඩනැගිල්ල


වඳුරු දූපත


සමනළ උයන


ජලජ පක්ෂි දූපත

| ප්‍රධාන ව්‍යාපෘතිය | උප ව්‍යාපෘති | වෙන් කරන ලද මුදල (රු.මි.) | සමුච්චිත සත්‍ය වියදම (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| පින්නවල සත්වෝද්‍යානයේ සංවර්ධන කටයුතු | **රජයේ ඒකාබද්ධ අරමුදල** | **53.80** | **27.07** | |
| | • පශු වෛද්‍ය අංශය සඳහා ගොඩනැගිල්ල | 32.40 | 19.53 | 33% ක් සම්පූර්ණ යි. ඉදිකිරීම් ක්‍රියාත්මකයි. |
| | • වඳුරු දූපත -I | 1.50 | - | ඉදිකිරීම් අවසන්. |
| | • සමනළ උයන | 8.00 | 2.08 | ඉදිකිරීම් ආයතනය වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇත. අත්තිකාරම් ගෙවා ඇත. |
| | • නරඹන්නන් සඳහා වැසිකිළි පද්ධතිය | 7.53 | 0.68 | 75% ක් සම්පූර්ණ යි. ඉදිකිරීම් ක්‍රියාත්මකයි. |
| | • පෙර වර්ෂයේ නිම කරන ලද වැඩ සඳහා ගෙවීම. (වලස් අරණ ) | 2.37 | 2.37 | |
| | • කුඩා පරිමාණ සංවර්ධන කටයුතු. | 2.00 | 2.41 | 2017ට නියමිත සංවර්ධන කටයුතු අවසන්. |
| | **සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදල** | **75.00** | **5.15** | |
| | • ජලජ පක්ෂි දූපත - අදියර I | 24.00 | 5.15 | 06% ක් සම්පූර්ණ යි. ඉදිකිරීම් ක්‍රියාත්මකයි. |
| | • ප්‍රවේශ ගොඩනැගිල්ලේ විවේක කාමරයේ වහලය. | 1.50 | - | 10% ක් සම්පූර්ණ යි. ඉදිකිරීම් ක්‍රියාත්මකයි. |
| | • උභය ජීවී සහ උරග උයන, අදියර-1 | 24.00 | - | ව්‍යුහාත්මක නිර්මාණ කටයුතු සිදු කරමින් පවතී. 95% ක් සම්පූර්ණ යි |
| | • මාර්ග පද්ධතිය අලුත්වැඩියාව. | 1.00 | - | ඉදිකිරීම් අවසන්. |
| | • සතුන් සඳහා ආහාර සකසන මූළුතැන්ගෙය | 7.50 | - | ඉදිකිරීම් අවසන්. |
| | • නිදහස් සත්ව පෙදෙස වටා වැට. | 9.50 | - | - |
| | • කුඩා පරිමාණ සංවර්ධන කටයුතු. | 7.50 | - | - |
| | **එකතුව** | **128.80** | **32.23** | |

## 3.8.4. හම්බන්තොට සෆාරි උද්‍යානයේ ඉදිකිරීම් කටයුතු

**මූල්‍ය ප්‍රගතිය**

| | |
|---|---|
| 2017 ඒකාබද්ධ අරමුදලින් වෙන් කල ප්‍රතිපාදන | - රු.මි. 276.70* |
| 2017 සත්වෝද්‍යාන අරමුදලින් වෙන් කල ප්‍රතිපාදන | - රු.මි. 175.00 |
| ඒකාබද්ධ අරමුදලින් කල වියදම | - රු.මි. 265.38 |
| සත්වෝද්‍යාන අරමුදලින් කල වියදම | - රු.මි. 49.52 |
| මුළු වියදම | - රු.මි. 314.90 |
| 2008 සිට සමුච්චිත වියදම - ඒකාබද්ධ අරමුදල | - රු.මි.1377.11 |
| සත්වෝද්‍යාන අරමුදල | - රු.මි. 868.07 |
| මුළු සමුච්චිත වියදම | - රු.මි. 2245.18 |

* ඇස්තමේන්තු මුදල සංශෝධනය වී ඇත.

**2017 වසරේ සිදුකරන ලද සංවර්ධන කාර්යයන්**


මාණ්ඩලික නිලධාරීන් සඳහා නිල නිවාස


මද කිපුණු අලි රැඳවුම - 01


අළෙවි කුටි ඉදිකිරීම


පා දෝවන සහ ප්‍රවේශ පෙදෙස


සෆාරි මාර්ගය- බෙංගාලි කොටි කලාපය


වැව - 02


වැව - 03


අඩි16 උස චේන් ලින්ක් වැට - බෙංගාලි කොටි කලාපය


ජලපොකුණු


අලි රැඳවුම් අගල


8' සහ 16' උස වැට


සතුන් රඳවා තබන පෙදෙස

| ප්‍රධාන ව්‍යාපෘති ය | උප ව්‍යාපෘති | වෙන් කරන ලද මුදල (රු.මි.) | සමුච්චිත සත්‍ය වියදම (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| සෆාරි උද්‍යාන ව්‍යාපෘති ය | **රජයේ ඒකාබද්ධ අරමුදල** | **276.70** | **265.38** | |
| | අලි අරණ සහිත ආසියානු කලාපය | | | |
| | වැව - 02 | 1.00 | - | ඉදිකිරීම් අවසන්. |
| | අගල | 1.00 | 0.91 | ඉදිකිරීම් අවසන්. |
| | අගල - 02 | 8.00 | 7.64 | ඉදිකිරීම් අවසන්. |
| | විදුලි වැට | 3.50 | - | සීමිත තරඟකාරී ලංසු කැඳවීමට කටයුතු කර ඇත. |
| | ගස් මත ඉදි කරන නිවාස (Tree Huts) | 9.50 | 6.59 | 60% ක් සම්පූර්ණ යි. ඉදිකිරීම් ක්‍රියාත්මකයි. |
| | 8' උස චේන් ලින්ක් වැට | 5.00 | - | ඉදිකිරීම් අවසන්. |
| | අලි මඩු | 8.80 | 5.66 | 85% ක් සම්පූර්ණ යි. ඉදිකිරීම් ක්‍රියාත්මකයි. |
| | බොරළු පාර | 18.80 | 1.51 | 97% ක් සම්පූර්ණ යි. ඉදිකිරීම් ක්‍රියාත්මකයි. |
| | ජල සැපයුම් ව්‍යාපෘතිය | 13.00 | 12.52 | ඉදිකිරීම් අවසන්. |
| | බෙංගාලි කොටි කලාපය | | | |
| | අප්‍රිකානු කලාපයට මායිම් ව ඇති 16' උස චේන් ලින්ක් වැට | 3.50 | 3.03 | ඉදිකිරීම් අවසන්. |
| | ආසියානු කලාපයට මායිම් ව ඇති 16' උස චේන් ලින්ක් වැට | 3.30 | 3.29 | ඉදිකිරීම් අවසන්. |
| | වලස් කලාපය සහ බෙංගාල කොටි කලාපය අතර ඇති 16' උස චේන් ලින්ක් වැට | 16.50 | 15.08 | ඉදිකිරීම් අවසන්. |
| | දිවි කලාපය සහ බෙංගාල කොටි කලාපය අතර ඇති 16' උස චේන් ලින්ක් වැට. | 6.20 | 6.02 | ඉදිකිරීම් අවසන්. |
| | සෆාරි මාර්ග පද්ධතිය (බොරළු) | 12.00 | 4.53 | ඉදිකිරීම් අවසන්. |
| | විදුලි වැට | 0.80 | - | සීමිත තරඟකාරී ලංසු කැඳවීමට කටයුතු කර ඇත. |
| | ගුහා (සත්ත්ව භාර කරුවන් සඳහා කාමර, සතුන් සඳහා ගුහා, පොකුණුආදී) | 23.00 | 23.90 | ඉදිකිරීම් අවසන්. |
| | ගේට්ටුව (Double Door Gates) | 6.00 | - | ටෙන්ඩර් ඇගයීම් කටයුතු සිදු කරමින් පවතී. |
| | වැව - අංක 03. | 6.80 | 6.62 | ඉදිකිරීම් අවසන්. |
| | මාණ්ඩලික නිලධාරීන් සඳහා නිල නිවාස | 36.00 | 32.44 | ඉදිකිරීම් අවසන්. |
| | සමරු හල හා ප්‍රවේශ පත්‍ර කවුළුව අතර අලංකරණය සහ ජල නල එලීම. | 7.00 | 9.14 | ඉදිකිරීම් අවසන්. |
| | කුඩා සත්ත්ව රාජධානිය -අදියර - 01. | - | 0.61 | |
| | සේවා සපයන මාර්ග. | 13.00 | 7.00 | 80% ක් සම්පූර්ණ යි. ඉදිකිරීම් ක්‍රියාත්මකයි. |
| | මාර්ග පද්ධතිය; නරඹන්නන් සහ බගී රථ සඳහා - අදියර - 01 | 28.50 | 41.56 | 70% ක් සම්පූර්ණ යි. ඉදිකිරීම් ක්‍රියාත්මකයි. |
| | වලස් කලාපය | | | |
| | ආසියානු අලි කලාපය අදියර - 02 සහ දිවි කලාපය අතර ඇති 16' උස චේන් ලින්ක් වැට. | 13.00 | 25.26 | 40% ක් සම්පූර්ණ යි. ඉදිකිරීම් ක්‍රියාත්මකයි. |
| | පෙර වර්ෂයේ නිම කරන ලද වැඩ සඳහා ගෙවීම. | 31.00 | 48.39 | |
| | කුඩා පරිමාණ සංවර්ධන කටයුතු. | 2.30 | 3.69 | 2017ට නියමිත සංවර්ධන කටයුතු අවසන්. |

| ප්‍රධාන ව්‍යාපෘතිය | උප ව්‍යාපෘති | වෙන් කරන ලද මුදල (රු.මි.) | සමුච්චිත සත්‍ය වියදම (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| සෆාරි උද්‍යාන ව්‍යාපෘතිය | **සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදල** | **175.00** | **49.52** | |
| | නරඹන්නන් සඳහා පහසුකම් වැඩිදියුණු කිරීම. | | | |
| | වැසිකිළි පද්ධතිය - 03 | 13.00 | 12.56 | ඉදිකිරීම් අවසන්. |
| | අළෙවි කුටි ඉදිකිරීම. | 7.00 | - | 40% ක් සම්පූර්ණ යි. ඉදිකිරීම් ක්‍රියාත්මකයි. |
| | ෆුට් බාත් (Foot Bath) | 3.00 | - | 70% ක් සම්පූර්ණ යි. ඉදිකිරීම් ක්‍රියාත්මකයි. |
| | ප්‍රවේශ පෙදෙස, අදියර - 02 | 31.00 | 12.29 | 25% ක් සම්පූර්ණ යි. ඉදිකිරීම් ක්‍රියාත්මකයි. |
| | නිල නිවාස සහ සේවා කලාපය සඳහා සේවා සැපයුම් මාර්ගය සහ විදුලි සැපයුම, අදියර -02 | 4.00 | - | නිර්මාණ කටයුතු සිදු කරමින් පවතී. |
| | ඕස්ට්‍රේලියානු කලාපය | | | |
| | කැලෑ එළි පෙහෙළි කිරීම්, මාර්ග පද්ධතිය(බොරළු),8' සහ16' උස වැට. | 43.00 | 14.38 | 84% ක් සම්පූර්ණ යි. ඉදිකිරීම් ක්‍රියාත්මකයි. |
| | විදුලි වැට | 7.00 | - | නිර්මාණ කටයුතු සිදු කරමින් පවතී. |
| | ගුහා | 2.00 | - | නිර්මාණ කටයුතු සිදු කරමින් පවතී. |
| | ගස් සිටුවීම/පිඩැලි ඇල්ලීම. | 2.00 | | නිර්මාණ කටයුතු සිදු කරමින් පවතී. |
| | කුඩා සත්ත්ව රාජධානිය -අදියර - 01. | | | - |
| | සුරතල් සත්ත්ව කලාපය. | 5.00 | | නිර්මාණ කටයුතු සිදු කරමින් පවතී. |
| | කුරුලු උයන | 8.50 | | නිර්මාණ කටයුතු සිදු කරමින් පවතී. |
| | සමනළ උයන | 2.00 | | ටෙන්ඩර් ඇගයීම් කටයුතු සිදු කරමින් පවතී. |
| | ශාක භක්ෂක සත්ත්ව කලාපය. | 10.00 | 6.34 | 5% ක් සම්පූර්ණ යි. ඉදිකිරීම් ක්‍රියාත්මකයි. |
| | අප්‍රිකානු කලාපය, අදියර- II | | | |
| | විදුලි වැට - ජිරාෆ් සත්ත්ව පෙදෙස. | 2.00 | - | සීමිත තරගකාරී ලංසු කැඳවීමට කටයුතු කර ඇත. |
| | සිංහ කලාපය. | | | |
| | අංක 03- සිංහ ගුහාව. | 11.00 | 3.75 | 75% ක් සම්පූර්ණ යි. ඉදිකිරීම් ක්‍රියාත්මකයි. |
| | මෙහෙයුම් පෙදෙසෙහි 3' උස චේන් ලින්ක් වැට සහ ගමන් මාර්ගය. | 3.00 | - | BOQ සකසා අවසන්. |
| | උරග උයන | 1.00 | - | නිර්මාණ කටයුතු අවසන්. |
| | අප්‍රිකානු අලි අරණ. | 13.00 | - | 25% ක් සම්පූර්ණ යි. ඉදිකිරීම් ක්‍රියාත්මකයි. |
| | පෙර වර්ෂයේ නිම කරන ලද වැඩ සඳහා ගෙවීම. | 3.00 | 0.22 | |
| | කුඩා පරිමාණ සංවර්ධන කටයුතු. | 4.50 | - | |
| | **එකතුව** | **451.70** | **314.90** | |

# 3.9. මූල්‍ය ප්‍රගතිය

## 3.9.1. රජයේ ඒකාබද්ධ අරමුදල

2017 වර්ෂය අවසන් වන විට රජයේ ඒකාබද්ධ අරමුදලින් දරණ ලද වියදම රු.මි. 827.172 වේ. එය ප්‍රාග්ධන වියදම් ලෙස රු.මි. 451.872 ක් සහ පුනරාවර්තන වියදම ලෙස රු.මි. 375.899 ලෙස උපයෝජනය කොට ඇත.

| වැය අංකය | වර්ගීකරණය / වැය ශීර්ෂය | 2016 | | 2017 | |
|---|---|---|---|---|---|
| | | සංශෝධිත ඇස්තමේන්තුව (රු.) | සත්‍ය වියදම (රු.) | ඇස්තමේන්තුව (රු.) | සත්‍ය වියදම (රු.) |
| | **පුනරාවර්තන වියදම** | **345,213** | **344,209** | **379,160** | **375,899** |
| | **පුද්ගල වේතන** | **312,923** | **312,689** | **342,846** | **340,217** |
| 1001 | වැටුප් සහ වේතන | 126,509 | 126,497 | 162,500 | 160,360 |
| 1002 | අතිකාල හා නිවාඩු දින ගෙවීම් | 47,075 | 47,074 | 57,000 | 56,658 |
| 1003 | වෙනත් දීමනා | 139,339 | 139,117 | 123,346 | 123,199 |
| | **ගමන් වියදම්** | **1,640** | **1,621** | **1,671** | **1,671** |
| 1101 | දේශීය | 1,550 | 1,544 | 1,671 | 1,671 |
| 1102 | විදේශීය | 90 | 77 | - | - |
| | **සැපයුම්** | **13,640** | **13,504** | **18,519** | **18,411** |
| 1201 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 2,920 | 2,916 | 2,785 | 2,772 |
| 1202 | ඉන්ධන | 6,600 | 6,478 | 12,584 | 12,558 |
| 1203 | ආහාර සහ නිල ඇඳුම් | 4,120 | 4,110 | 3,150 | 3,081 |
| | **නඩත්තු වියදම්** | **5,290** | **5,202** | **4,599** | **4,374** |
| 1301 | වාහන | 3,250 | 3,230 | 2,524 | 2,516 |
| 1302 | යන්ත්‍රෝපකරණ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 1,040 | 1,033 | 1,075 | 998 |
| 1303 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1,000 | 939 | 1,000 | 860 |
| | **සේවා** | **9,840** | **9,330** | **9,524** | **9,310** |
| 1402 | තැපැල් සහ සන්නිවේදන | 2,000 | 1,879 | 2,200 | 2,200 |
| 1403 | විදුලිය සහ ජලය | 2,540 | 2,529 | 1,500 | 1,469 |
| 1404 | කුලී සහ දේශීය බදු | 800 | 785 | 824 | 822 |
| 1409 | වෙනත් | 4,500 | 4,137 | 5,000 | 4,819 |
| | **පැවරුම්** | **1,880** | **1,864** | **2,000** | **1,916** |
| 1506 | දේපළ ණය පොලිය | 1,880 | 1,864 | 2,000 | 1,916 |
| | **ප්‍රාග්ධන වියදම්** | **539,700** | **453,400** | **508,700** | **451,872** |
| | **ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව සහ වැඩිදියුණු කිරීම** | **145,830** | **95,683** | **106,800** | **105,617** |
| 2001 | **ගොඩනැගිලි සහ ඉදිකිරීම්** | 140,000 | 90,314 | 100,000 | 99,362 |
| 2002 | යන්ත්‍රෝපකරණ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 3,230 | 3,223 | 3,000 | 2,548 |
| 2003 | වාහන | 2,600 | 2,146 | 3,800 | 3,707 |
| | **ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම** | **392,880** | **357,258** | **401,500** | **345,859** |
| 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 1,500 | 1,492 | 3,200 | 2,889 |
| 2103 | යන්ත්‍රෝපකරණ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 3,450 | 3,443 | 27,800 | 27,319 |
| 2104 | **ගොඩනැගිලි සහ ඉදිකිරීම්** | **387,930** | **352,322** | **370,500** | **315,652** |
| | අලි අනාථාගාරය | 23,400 | 23,356 | 40,000 | 23,197 |
| | පින්නවල නව සත්වෝද්‍යානය | 98,930 | 63,822 | 53,800 | 27,074 |
| | රිදියගම සෆාරි උද්‍යානය | 265,600 | 265,144 | 276,700 | 265,381 |
| | **මානව සම්පත් සංවර්ධනය** | **490** | **459** | 400 | 395 |
| 2401 | කාර්ය මණ්ඩල පුහුණුව | 490 | 459 | 400 | 395 |
| | **මුළු වියදම** | **884,913** | **797,609** | 887,860 | 827,772 |

## 3.9.2. සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදල

1982 අංක 41 දරණ ජාතික සත්ත්ව උද්‍යාන පනතේ විධිවිධාන වලට අනුව සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදල පිහිටුවා ඇත.සත්වෝද්‍යාන ප්‍රවේශපත්‍ර අදායම්, සත්වෝද්‍යාන නිෂ්පාදන විකිණීමෙන් ලැබෙන සියලු මුදල්, පරිත්‍යාග, දඩ මුදල් හෝ ආදායමක් වශයෙන් කවර ප්‍රභවයකින් හෝ ලැබූ මුදල් මෙම අරමුදලට බැර කරනු ලැබේ.

2017 වර්ෂය අවසන් වන විට සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදලේ වියදම රු.මි. 641.368 ක් වේ. එය ප්‍රාග්ධන වියදම් ලෙස රු.මි. 187.170 ක් සහ පුනරාවර්තන වියදම ලෙස රු.මි. 454.198 ක් ලෙස උපයෝජනය කොට ඇත.

('000)

| වැය අංකය | වර්ගීකරණය / වැය ශීර්ෂය | 2016 | | 2017 | |
|---|---|---|---|---|---|
| | | සංශෝධිත ඇස්තමේන්තුව (රු.) | සත්‍ය වියදම (රු.) | ඇස්තමේන්තුව (රු.) | සත්‍ය වියදම (රු.) |
| | පුනරාවර්තන වියදම | | | | |
| Re.01 | සත්ත්ව ආහාර | 265,000 | 264,242 | 300,000 | 264,185 |
| Re.02 | ප්‍රවේශ පත්‍ර මුද්‍රණය | 6,000 | 5,842 | 6,000 | 3,243 |
| Re.03 | දිරි දීමනා ගෙවීම | 25,000 | 24,546 | 28,000 | 25,269 |
| Re.04 | පාරිභෝජන සේවා | 40,000 | 35,612 | 45,000 | 35,870 |
| Re.05 | වෛද්‍ය සැපයීම් | 10,000 | 8,042 | 10,000 | 8,254 |
| Re.06 | බදු ගෙවීම | 80,000 | 73,482 | 100,000 | 58,120 |
| Re.07 | සමරු භාණ්ඩ තොග වෙනස් වීම | 1,000 | 130 | 1,000 | - |
| Re.08 | අලෙවි ප්‍රවර්ධනය සහ ප්‍රචාරණය | 1,000 | - | 1,000 | 241 |
| Re.09 | විවිධ වියදම් | 53,000 | 45,375 | 55,000 | 35,901 |
| Re.10 | විදේශීය පුහුණු වීම් | 1,500 | 828 | 1,500 | 1,345 |
| Re.11 | දේශීය පුහුණු වීම් | - | - | 600 | 51 |
| Re.13 | අධ්‍යාපනය සහ පර්යේෂණ | 1,500 | - | 1,500 | - |
| Re.14 | සේවක සුබසාධනය | 2,500 | 52 | 2,500 | 325 |
| Re.15 | සත්ත්ව හුවමාරු වැඩසටහන සහ සත්ත්ව අභිජනනය | 4,000 | 2,557 | 14,000 | - |
| Re.16 | සෆාරි උද්‍යානයේ ප්‍රවාහන වියදම් | 20,000 | 12,608 | 20,000 | 19,551 |
| Re.17 | ප්‍රධාන කාර්යාලය සඳහා කුළී ගාස්තු | - | - | 12,000 | 1,843 |
| | මුළු පුනරාවර්තන වියදම | 510,500 | 473,316 | 598,100 | 454,198 |
| | ප්‍රාග්ධන වියදම | | | | |
| C.25 | දෙහිවල සත්වෝද්‍යානයේ නව ඉදිකිරීම් | 100,000 | 17,318 | 145,000 | 62,868 |
| C.26 | රිදියගම සෆාරි උද්‍යානය | 230,000 | 27,270 | 175,000 | 49,519 |
| C.27 | පින්නවල නව සත්වෝද්‍යානය | 100,000 | 17,733 | 75,000 | 5,155 |
| C.28 | අලි අනාථාගාරය | 50,000 | 8,731 | 85,000 | 40,271 |
| C.29 | නව ඉදිකිරීම් සඳහා උපකරණ අත්පත් කර ගැනීම | 30,000 | 112 | 50,000 | 329 |
| C.30 | වාහන අත්පත් කර ගැනීම | 50,000 | 42,046 | 50,000 | 29,028 |
| | **මුළු ප්‍රාග්ධන වියදම** | **560,000** | **113,210** | **580,000** | **187,170** |
| | **මුළු වියදම** | **1,070** | **586,526** | **1,178,100** | **641,368** |

## 3.9.3. වියදම් තොරතුරු සාරාංශය 2017

| අරමුදල් මූලාශ්‍රය | ප්‍රාග්ධන වියදම (රු.මි) | | පුනරාවර්තන වියදම (රු.මි) | | මුළු වියදම (රු.මි) | | |
|---|---|---|---|---|---|---|---|
| | සංශෝධිත ඇස්තමේන්තුව | සත්‍ය වියදම | සංශෝධිත ඇස්තමේන්තුව | සත්‍ය වියදම | ඇස්තමේන්තුව | සත්‍ය වියදම | ප්‍රගතිය % |
| රජයේ ඒකාබද්ධ අරමුදල | 508.700 | 451.872 | 379.160 | 375.899 | 887.860 | 827.772 | 93 |
| සත්වෝද්‍යාන සංවර්ධන හා සුබසාධන අරමුදල | 580.000 | 187.170 | 598.100 | 454.198 | 1,178.100 | 641.368 | 54 |
| **එකතුව** | 1,088.700 | 639.042 | 977.260 | 830.097 | 2,065.960 | 1,469.140 | **71** |

## 3.9.4. 2017 සංවර්ධන අරමුදල සහ රජයේ ඇස්තමේන්තුවේ ආදායම් හා වියදම් විශ්ලේශනය

| විස්තරය | වටිනාකම (රු) | |
|---|---|---|
| සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදලේ මුළු ආදායම | | 998,619,404 |
| භාණ්ඩාගාරයෙන් ලැබූ මුළු අක්මුදල් | 482,556,000 | |
| භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන ව්‍යාපෘති වෙනුවෙන් ලද අක් මුදල් | (157,000,000) | |
| (+) පුනරාවර්තන වියදම් වෙනුවෙන් ලද අක් මුදල් | | 325,556,000 |
| (-) භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන ලද අක්මුදල් | | |
| සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදල මඟින් | 100,000,000 | |
| | | |
| සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදල මඟින් 2017/12/31 | 132,561 | |
| රජයේ ඇස්තමේන්තුව 2017/12/31 | 985,424 | (101,117,985) |
| ශුද්ධ ලැබීම් | | 1,223,057,419 |
| සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදලේ පුනරාවර්තන වියදම් | 454,198,403 | |
| රජයේ ඇස්තමේන්තුවේ පුනරාවර්තන වියදම් | 375,899,771 | |
| | | |
| (-) මුළු පුනරාවර්තන වියදම් | | (830,098,174) |
| ලාභය | | 392,959,245 |
| සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදලේ ප්‍රාග්ධන වියදම් | 187,170,373 | |
| රජයේ ඇස්තමේන්තුවේ ප්‍රාග්ධන වියදම් | 451,872,418 | |
| **මුළු ප්‍රාග්ධන වියදම්** | | **639,042,791** |

# 4. ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

## දැක්ම

උද්භිද විද්‍යාත්මක හා සෞන්දර්යාත්මක කටයුතු උසස් මට්ටමකින් පවත්වාගනිමින් නිවර්තන කලාපීය හොඳම උද්භිද උද්‍යාන බවට පත් වීම.

## මෙහෙවර

ස්වාභාවික සහ නිර්මිත පරිසරයන් තුල ඇති ශාක සම්පත් අධ්‍යයනය, තිරසාර සංරක්ෂණය, අගය කිරීම තුලින් ශාක සම්පත ජනතාවට සමීප කරවීම.

## කාර්යභාරය

1. ශ්‍රී ලංකාවේ ශාක විවිධත්වය සංරක්ෂණය කිරීමෙහිලා පරිබාහිර සංරක්ෂණ ක්‍රමවේද ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය සැළසුම් සකස් කිරීම හා ක්‍රියාවට නැංවීම.
2. අධ්‍යාපන හා සන්නිවේදන ක්‍රමවේද උපයෝගි කරගනිමින් ශ්‍රී ලංකාවේ ශාක සම්පත පිළිබඳව හා ශාක සම්පත සමඟ බැඳී පවත්නා විවිධ වූ කර්මාන්ත සඳහා අවශ්‍ය වන්නා වූ නිවැරදි තොරතුරු හා ශිල්පීය ඥානය ලබා දීමට වැඩසටහන් ක්‍රියාවට නැංවීම.
3. ශ්‍රී ලංකාවේ මල්වගා ව්‍යාපාර සංවර්ධනය කිරීම සඳහා අවශ්‍යවන්නාවූ විවිධ පර්යේෂණ හා තාක්ෂණ ක්‍රමවේද අත් හදා බැලීම හා ක්‍රියාවට නැංවීම.
4. ශ්‍රී ලංකාවේ ජාතික උද්භිද උද්‍යාන උසස් මට්ටමකින් පවත්වා ගෙන යාම.
5. සුදුසු ස්ථාන වල නව උද්භිද උද්‍යාන පිහිටුවීම සඳහා අවශ්‍ය වන්නා වූ සංවර්ධන වැඩසටහන් සැළසුම් කිරීම.
6. අලංකරණ උද්‍යාන විද්‍යාව(Amenity Horticulture) ශ්‍රී ලංකාවේ ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ හා තාක්ෂණ වැඩසටහන් ක්‍රියාවට නැංවීම.
7. ශ්‍රී ලංකාවේ හඳුනාගත් ඓතිහාසික වටිනාකමකින් යුත් වෘක්ෂලතා සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා දීම.
8. අනුරාධපුර ජයසිරි මහබෝධින් වහන්සේගේ සෞඛ්‍ය ආරක්ෂාව යහපත්ව පවත්වාගෙන යාම.

# 4. ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

## 4.1. හැඳින්වීම

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, උද්භිද විද්‍යාත්මක කටයුතු සම්බන්ධව ශ්‍රී ලංකාවේ ප්‍රධාන පුරෝගාමී ආයතනය වේ. ශාක විතැන් සංරක්ෂණය සහ ශාක පිළිබඳ අධ්‍යයන කටයුතු, ශ්‍රී ලංකාවේ උද්‍යාන අලංකරණ විද්‍යාව ප්‍රවර්ධනය සඳහා පර්යේෂණාත්මක සහ තාක්ෂණික වැඩසටහන්, මල්වගා පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව විශාල දායකත්වයක් ලබාදෙන අතර දෙස් විදෙස් සංචාරකයින් ආකර්ශනය දිනාගත් ස්ථානයක් ද වේ.

ප්‍රධාන උද්භිද උද්‍යානයන් වන පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය (1821), හක්ගල උද්භිද උද්‍යානය (1861), ගම්පහ හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය (1876) සහ ගනේවත්ත වන ඖෂධ උද්‍යානයට අමතරව මෑත කාලයේදී පිළිවෙලින් 2013 සහ 2015 වර්ෂයන් හි හම්බන්තොට මිරිජ්ජවිල වියළි කළාපීය උද්භිද උද්‍යානය සහ අවිස්සාවේල්ල සීතාවක තෙත් කළාපීය උද්භිද උද්‍යානය මහජනතාවට විවෘත කරන ලදී.

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ නඩත්තු වන උද්භිද උද්‍යාන තුල ශාක විශේෂ 4500 කට අධික ප්‍රමාණයක් සංරක්ෂණය වී ඇති අතර දුර්ලභ ශාක, වනාන්තර තුලින් වඳ වී ගොස් ඇති ශාක, ශ්‍රී ලංකාවට පමණක් ආවේනික ශාක, වඳ වීමේ තර්ජනයට ලක් වී ඇති ශාක විශේෂ රාශියක් මෙම සංරක්ෂිත ශාක අතරට ඇතුලත් ය. මෙම උද්භිද උද්‍යානවලට අමතරව ගනේවත්ත වන ඖෂධ උද්‍යානය ශ්‍රී ලංකාවේ ඖෂධ ශාක සංරක්ෂණය හා ප්‍රවර්ධනය කිරීම පිණිස දායක වේ.


උද්භිද විද්‍යාත්මක සහ ශාක වර්ගීකරණ පර්යේෂණ වැඩසටහන් සහ ක්‍රියාකාරකම් මෙන්ම ශාක පිළිබඳ විවිධ නිගමනයන් සහ සත්‍යබව තහවුරු කිරීමේ කාර්යයන් කරනු ලබන්නේ ජාතික ශාකාගාරයෙනි. මල්වගා සංවර්ධන සහ පර්යේෂණ අංශය විසින් මල්වගා පර්යේෂණ කටයුතු සහ විවිධ වැඩසටහන් මගින් මල්වගා සංවර්ධන කටයුතු සිදුකරමින් ඒ හරහා රට තුල මල්වගා ක්ෂේත්‍රය ප්‍රවර්ධනය සිදුකෙරේ. කෙටිකාලීන පුහුණු පාඨමාලා, එක් අවුරුදු සහ දෑ අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවන් සහ අනෙකුත් අධ්‍යාපන සහ පුහුණු වැඩසටහන් අධ්‍යාපන සහ පුහුණු මධ්‍යස්ථානය මගින් සිදුකරනු ලබයි.

මහජනතාවට විනෝදාස්වාදය ලබා දීම, ලොව පුරා ශාක වල විවිධත්වය සහ ශාක රාජධානියේ සුන්දරත්වය රස විඳීමට ඉඩ ප්‍රස්ථා ලබා දීම, ශාක පිළිබඳ දැනුම ලබා දීම හරහා ශාක ප්‍රජාව වෙත ඔවුන් සමීප කරවීම ද ජාතික උද්භිද උද්‍යාන තුලින් සිදුවන මහඟු කාර්යයකි.

## 4.2. කාර්ය මණ්ඩල තොරතුරු

| කාණ්ඩය | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්ය මණ්ඩලය |
|---|---|---|
| ජ්‍යේෂ්ඨ මට්ටම | 34 | 16 |
| තෘතීය මට්ටම | 10 | 04 |
| ද්විතීය මට්ටම | 189 | 130 |
| ප්‍රාථමික මට්ටම | 741 | 480 |
| **එකතුව** | 974 | 630 |

## 4.3. සංවිධාන සැලැස්ම




** රා.උ.උ. - රාජකීය උද්භිද උද්‍යානය

ස.අ. කාර්යාලය - සහකාර අධ්‍යක්ෂ කාර්යාලය

තෙ.ක.උ.උ. - තෙත් කලාපීය උද්භිද උද්‍යානය

වියලි ක.උ.උ.- වියලි කලාපීය උද්භිද උද්‍යානය

## 4.4. දෙපාර්තමේන්තුව යටතේ ඇති ආයතන සහ ඒකක

### 4.4.1. පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය

1821 දී ස්ථාපිත පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය, ශ්‍රී ලංකාවේ ආර්ථික සහ පාරිසරික සංවර්ධනය සඳහා දායකත්වය ලබා දෙමින් ශාක පිළිබඳ අධ්‍යාපනයට හා සංරක්ෂණයට දායකත්වයක් ලබා දෙයි.

හෙක්ටයාර 61.25ක් වූ උද්‍යානය මහනුවර නගරය සමීපයෙහි පිහිටා ඇති අතර, ශාක අධ්‍යයනයන්ට, උද්භිද හා පරිසර විද්‍යාත්මක පර්යේෂණයන්ට, උද්‍යාන බෝග වගා ප්‍රදර්ශනයට මෙන්ම විනෝදාස්වාදය ලබා දීමට දායක වන ස්ථානයක් ලෙස ප්‍රචලිත ය.

### 4.4.2. ජාතික ශාකාගාරය

ජාතික ශාකාගාරය ශ්‍රී ලංකාවේ ශාකවල වියළි ශාකාගාර නිදර්ශක එක්රැස් කර ඇති ස්ථානයකි. වෙනත් බොහෝ විදේශික ශාක සහ අනෙකුත් වගා කරන ශාකවල නිදර්ශක 160,000 ආසන්න ප්‍රමාණයක් යෝග්‍ය තත්ත්වයන් යටතේ ක්‍රමානුකූල අධ්‍යයනය සහ විමර්ශන කාර්යය සඳහා සංරක්ෂණය කරමින් තබා ඇත. 3,500 පමණ ග්‍රන්ථ සහ සෙසු ශාක හා සම්බන්ධවූ පොත් පත්, සඟරා ද ශාකාගාරයේදී සොයාගත හැක.

ශාකාගාරයේ තැන්පත් කර ඇති නිදර්ශක ශාක වර්ගීකරණ පර්යේෂණ සඳහා මෙන්ම ජෛව විවිධත්ව දත්ත බැංකුවක් ලෙස ශාක හඳුනා ගැනීමේ කාර්යයන් සඳහා යොදා ගනී.

### 4.4.3. හක්ගල උද්භිද උද්‍යානය

හක්ගල උද්භිද උද්‍යානය වර්ෂ 1861 දි ආරම්භ කළ අතර උද්‍යානයට අයත් බොහෝ ශාක සෞම්‍ය කලාපීය ශාක වේ. මෙම ශාක එකතුව ශ්‍රී ලංකාවට ආවේණික ශාකවල මෙන්ම වෙනත් රටවලින් හඳුන්වාදුන් කඳුකර ශාක වල එකතුවකි. මේවා උද්‍යානයේ විවිධ අංශවල ක්‍රමානුකූලව පැළ කර ඇත.

### 4.4.4. හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය

ශ්‍රී ලංකාවේ රබර් වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය 1876 දී ස්ථාපිත කරන ලදී. ඉතා පැරණි ඉතිහාසයක් ඇති එය උද්භිද විද්‍යාත්මකව හා උද්‍යාන විද්‍යාත්මක වශයෙන් ආකර්ෂණීය ස්ථානයකි. එය ගම්පහ පිහිටා ඇති අතර, වපසරිය හෙක්ටයාර 17.4 කි. ශ්‍රී ලංකාවේ සහ සෙසු රටවල ශාක විශේෂයන් 2000 ක පමණ සංකලනයකින් මෙම උද්‍යානය සමන්විත වේ.

## 4.4.5. මල්වගා පර්යේෂණ හා සංවර්ධන ඒකකය, පේරාදෙණිය

මල්වගා පර්යේෂණ සහ සංවර්ධන ඒකකය, මල්වගා ක්ෂේත්‍රය සම්බන්ධ පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම සහ ශ්‍රී ලංකාවේ මල්වගා ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා කැපවී සිටී.

වගාකරුවන් සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන්, ක්ෂේත්‍රයේ උපදේශණ සේවා හා ආයෝජන අවස්ථා පිළිබඳව තොරතුරු, උපකරණ සහ තත්වයෙන් උසස් රෝපණ ද්‍රව්‍ය ලබා දීම සඳහා ඒකකය ක්‍රියාකාරීව දායක වේ.

## 4.4.6. ගනේවත්ත වන ඖෂධ පැළෑටි උද්‍යානය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගනේවත්ත වන ඖෂධ උද්‍යානය පිහිටා ඇත. උද්‍යානය හෙක්ටයාර 21.04 ක වපසරියකින් යුක්ත වන අතර, ඖෂධ පැළෑටි සංකලනයක් විශාල පරාසයක පැතිරී ඇත. ගනේවත්ත වන ඖෂධ උද්‍යානය පහසුවෙන් සොයා ගත නොහැකි දුර්ලභ ඖෂධීය පැළෑටි වර්ග සංරක්ෂණය කිරීම, ඖෂධ පැළෑටි පිළිබඳ ක්‍රමවත් වගා කිරීම සහ පැළෑටි එකතු කිරීමේ ක්‍රම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමෙහි නිරත වී සිටියි.

## 4.4.7. මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය

දේශිය විශේෂඥයින් විසින් අවුරුදු 130 කට පසු සැළසුම් කොට බිහි වූ ශ්‍රී ලංකාවේ ප්‍රථම උද්භිද උද්‍යානය වනුයේ මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානයයි. මෙම උද්‍යානය දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටා ඇති අතර, සංවර්ධන වැඩ කටයුතු 2006 වර්ෂයේ ආරම්භ කෙර 2013 වර්ෂයේ දි මහජනතාවට විවෘත කරන ලදී .

වියළි සහ ශුෂ්ක කලාපීය ශාකවල විතැන් සංරක්ෂණ සහ ප්‍රාදේශිය ආර්ථිකය සංවර්ධනයට දායක වීම මෙම උද්‍යානයේ ප්‍රධාන අරමුණ වේ.

## 4.4.8. සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය

අවිස්සාවේල්ල ප්‍රදේශය සමීපයෙහි මෙම උද්‍යානය පිහිටා ඇති අතර, සංවර්ධන කටයුතු 2008 වසරේදී ආරම්භ කරන ලද අතර 2015 දී මහජනතාවට විවෘත කරන ලදී. උද්භිද උද්‍යානය හෙක්ටයාර 42.49 වපසරියකින් යුක්ත ය.

පහතරට තෙත් කලාපීය ශාකවල විතැන් සංරක්ෂණය කිරීම මෙම උද්‍යානයේ ප්‍රධාන අරමුණ වී ඇත. විවිධ ශාක විශේෂවල ආර්ථික, සෞන්දර්යාත්මක සහ පරිසර විද්‍යාත්මක අගයෙන් යුත් පුද්ගලයන් සඳහා විනෝස්වාදය ගෙනදෙන ප්‍රදේශයක් ලෙස මෙම උද්‍යානය එහි කාර්යයන් සිදු කරනු ඇත.

## 4.4.9. සුවහස් මල් සෙවන, කොළඹ

දිවයිනේ විවිධ ප්‍රදේශවල පිහිටි " සුවහස් මල්" මල්වගා කරුවන්ගේ සංගම්වල මල්වගා නිෂ්පාදන අලෙවිය, දෙපාර්තමේන්තුවේ ඒකකයක් වන නාරාහේන්පිට පිහිටි" සුවහස් මල් "ඒකකයෙන් සිදු කරනු ලබයි.

## 4.4.10. අතිගරු ජනාධිපතිතුමාගේ සහ ගරු අගමැතිතුමාගේ නිල නිවාස උද්‍යාන

අතිගරු ජනාධිපතිතුමාගේ කොළඹ, මහනුවර, නුවරඑළිය, අනුරාධපුර පිහිටි නිල නිවාස උද්‍යාන සහ ගරු අගමැතිතුමාගේ කොළඹ සහ නුවරඑළිය ප්‍රදේශයේ පිහිටි නිලනිවාස උද්‍යාන දෙපාර්තමේන්තුව මගින් නඩත්තු කටයුතු සිදු කරනු ලබයි.

## 4.4.11. පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන්

පළමු සහ දෙවන ලෝක යුද්ධයේදී පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ හමුදා සේවයට අයත් නිලධාරීන් සිහිවීම සඳහා පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් ඒකක මහනුවර, ජාවත්ත, බොරැල්ල සහ ත්‍රිකුණාමල ප්‍රදේශවල පවත්වා ගෙන යන අතර දෙපාර්තමේන්තුව මගින් යුධ සොහොන් ඒකක උද්‍යානවල කළමනාකරණ කටයුතු සිදු කරනු ලබයි.

## 4.4.12. හරිත පියස, මීගලෑව


වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කි.මී. 96.56 දුරකින් මීගලෑව හරිත පියස පිහිටා ඇත. හරිත පියසෙහි වර්තමාන වපසරිය හෙක්ටයාර 2.43 කි. එය සංවර්ධනය වෙමින් පවතී. මල් වගාව පිළිබඳව පාඨමාලා අභ්‍යන්තර කාර්ය මණ්ඩලයට සහ දේශීය ජනතාවට පවත්වාගෙන යන අතර ශාක ප්‍රචාරණය සිදුකරන මධ්‍යස්ථානයක් ද ලෙස ඉදිරියේදී කටයුතු කරනු ඇත.

## 4.5. උද්භිද උද්‍යාන කරා පැමිණි සංචාරකයින් සංඛ්‍යාව සහ ආදායම පිළිබඳ තොරතුරු - 2017


### 4.5.1. සංචාරකයින් ගේ පැමිණීම සහ ආදායම

| මාසය | පැමිණීම | | | ආදායම (රු.මි.) | | |
|---|---|---|---|---|---|---|
| | දේශීය | විදේශීය | එකතුව | දේශීය | විදේශීය | එකතුව |
| ජනවාරි | 128,453 | 53,203 | 181,656 | 6.88 | 77.70 | 84.57 |
| පෙබරවාරි | 192,928 | 54,305 | 247,233 | 8.67 | 79.53 | 88.20 |
| මාර්තු | 236,146 | 46,560 | 282,706 | 8.45 | 68.95 | 77.40 |
| අප්‍රේල් | 268,009 | 33,995 | 302,004 | 12.69 | 49.42 | 62.12 |
| මැයි | 177,300 | 19,628 | 196,928 | 8.38 | 28.81 | 37.19 |
| ජූනි | 141,737 | 15,436 | 157,173 | 6.52 | 22.47 | 28.99 |
| ජූලි | 199,852 | 40,948 | 240,800 | 8.90 | 57.38 | 66.29 |
| අගෝස්තු | 315,865 | 47,047 | 362,912 | 15.09 | 66.40 | 81.50 |
| සැප්තැම්බර් | 218,414 | 27,633 | 246,047 | 10.96 | 40.56 | 51.52 |
| ඔක්තෝම්බර් | 168,155 | 30,394 | 198,549 | 8.29 | 44.59 | 52.88 |
| නොවැම්බර් | 115,126 | 30,501 | 145,627 | 6.04 | 45.41 | 51.45 |
| දෙසැම්බර් | 235,362 | 40,557 | 275,919 | 12.09 | 58.82 | 70.90 |
| **එකතුව** | **2,397,347** | **440,207** | **2,837,554** | **112.96** | **640.04** | **753.00** |

### 4.5.2. 2017 වසරේ සංචාරකයින්ගේ පැමිණීම



## 4.5.3. 2017 වසරේ සංචාරකයින්ගෙන් ලද ආදායම




## 4.5.4. 2016 සහ 2017 වසරවල සංචාරකයින්ගේ පැමිණීම සහ ආදායම

| මාසය | පැමිණීම | | ආදායම (රු.මි.) | |
|---|---|---|---|---|
| | 2016 | 2017 | 2016 | 2017 |
| ජනවාරි | 195,428 | 181,656 | 62.46 | 84.57 |
| පෙබරවාරි | 252,551 | 247,233 | 69.37 | 88.19 |
| මාර්තු | 321,085 | 282,706 | 62.67 | 77.40 |
| අප්‍රේල් | 329,736 | 302,004 | 43.71 | 62.12 |
| මැයි | 149,115 | 196,928 | 27.87 | 37.19 |
| ජූනි | 138,261 | 157,173 | 29.24 | 28.99 |
| ජූලි | 272,913 | 240,800 | 71.59 | 66.29 |
| අගෝස්තු | 382,386 | 362,912 | 90.26 | 81.50 |
| සැප්තැම්බර් | 285,434 | 246,047 | 60.62 | 51.52 |
| ඔක්තෝම්බර් | 247,982 | 198,549 | **55.29** | 52.88 |
| නොවැම්බර් | 155,022 | 145,627 | **62.86** | 51.45 |
| දෙසැම්බර් | 328,744 | 275,919 | **73.78** | 70.90 |
| **එකතුව** | **3,058,657** | **2,837,554** | **709.70** | **753.00** |

## 4.5.5. එක් එක් ජාතික උද්භිද උද්‍යාන සඳහා සංචාරක පැමිණීම හා ආදායම - 2017


| උද්‍යානය | පැමිණීම | | | ආදායම (රු.මි.) | | |
|---|---|---|---|---|---|---|
| | දේශීය | විදේශීය | එකතුව | දේශීය | විදේශීය | එකතුව |
| රාජකීය උද්භිද උද්‍යානය | 1,112,496 | 412,660 | 1,525,156 | 52.31 | 600.74 | 653.05 |
| හක්ගල උද්භිද උද්‍යානය | 816,801 | 26,858 | 843,659 | 37.09 | 38.30 | 75.39 |
| ගම්පහ උද්භිද උද්‍යානය | 192,934 | 333 | 193,267 | 10.56 | 0.49 | 11.05 |
| තෙත් කලාපීය උද්භිද උද්‍යානය | 201,413 | 203 | 201,616 | 2.81 | 0.29 | 10.41 |
| වියළි කලාපීය උද්භිද උද්‍යානය | 73,703 | 153 | 73,856 | 10.19 | 0.22 | 3.10 |
| **එකතුව** | **2,397,347** | **440,207** | **2,837,554** | **112.96** | **640.04** | **753.00** |


### 4.5.6. 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා උද්භිද උද්‍යාන වෙත පැමිණි සංචාරකයින්ගේ තොරතුරු

| විස්තරය | වර්ෂය | | | | |
|---|---|---|---|---|---|
| | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
| දේශීය සංචාරකයින් සංඛ්‍යාව | 1,783,069 | 1,893,522 | 2,215,702 | 2,593,252 | 2,397,347 |
| විදේශීය සංචාරකයින් සංඛ්‍යාව | 293,454 | 345,468 | 407,553 | 465,405 | 440,207 |
| **එකතුව** | **2,076,523** | **2,238,990** | **2,623,255** | **3,058,657** | **2,837,554** |

### 4.5.7. 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට සංචාරකයින්ගේ පැමිණීමෙන් පමණක් ලැබුණු ආදායම

| විස්තරය | වර්ෂය | | | | |
|---|---|---|---|---|---|
| | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
| දේශීය සංචාරකයින්ගෙන් ලැබුණු ආදායම (රු.මි) | 73.0 | 75.9 | 88.5 | 115.4 | 113.0 |
| විදේශීය සංචාරකයින්ගෙන් ලැබුණු ආදායම(රු.මි) | 314.9 | 369.8 | 435.1 | 594.3 | 640.0 |
| **එකතුව** | **387.9** | **445.7** | **523.6** | **709.7** | **753.0** |



## 4.6. 2017 වර්ෂයේ උද්භිද උද්‍යානයන් හි සිදු වූ සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය

සියළුම උද්‍යානයන්හි භූමි අලංකරණ කටයුතු නිසි පරිදි සිදුකිරීම තුලින් ද නව සංවර්ධිත ප්‍රදේශ, අඩිපාරවල්, වීදි, උද්‍යාන කාර්යක්ෂමව නඩත්තු කිරීම තුලින් ද උද්‍යානයන් හි අලංකරණය හා තත්ත්වය උසස් මට්ටමකින් පවත්වාගෙන යන ලදී.

### 4.6.1. රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය

**මූල්‍ය ප්‍රගතිය**

අනුමත ප්‍රතිපාදන - ඒකාබද්ධ අරමුදලින් රු. මි. 2.529*

උද්භිද උද්‍යාන භාරකාර අරමුදලින් රු.මි. 28.310 *

2017 වර්ෂයේ වියදම - රු.මි. 30.775

*අනුමත ප්‍රතිපාදන සංශෝධනය වී ඇත.

**භෞතික ප්‍රගතිය**



අභ්‍යන්තර නිර්මාණ කටයුතු සිදුකරමින් පවතින ශාක සංරක්ෂණාගාරය

- වැඩ අවසන් කරන ලද ශාක සංරක්ෂණාගාරයේ අභ්‍යන්තර සැලසුම් නිර්මාණ කටයුතු සහ පැළැටි ස්ථාපිත කිරීමේ කටයුතු සිදුවෙමින් පවතින අතර 2018 වර්ෂයේ අප්‍රේල් මස දී මහජනතාවට විවෘත කිරීමට බලාපොරොත්තු වේ.



උද්‍යානයේ මාර්ග සංවර්ධන කටයුතු

- උද්‍යානයේ අභ්‍යන්තර මාර්ග පද්ධති, බෝක්කු හා ජලාපවහන පද්ධති වැඩි දියුණු කිරීම් කටයුතු සිදුකරන ලද අතර ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම මඟින් උද්‍යානයට නව පෙනුමක් ද ලබා දීමට කටයුතු කරන ලදී.
- උද්‍යානයේ ප්‍රධාන මාර්ග වල තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා කාපට් ඇතිරීම සිදු කරන ලදී.



කසල කලමණාකරණය සඳහා උද්‍යානය තුල ස්ථාපිත කසල බඳුන්

- උද්‍යානයේ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අවශ්‍ය යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමේ කටයුතු සිදුකරමින් පවතින අතර එයට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම්, ආකෘති ස්ථාපිත කිරීම් කටයුතු සිදු කරන ලදී.
- අළුතින් නිල නිවාසයක ඉදිකිරීම් කටයුතු නිමකරන ලද අතර උද්‍යානයේ නිලධාරී නිලනිවාස ද අලුත්වැඩියා කරන ලදී.
- උද්‍යානයේ සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් ශාක එකතුව ශක්තිමත් කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. උද්‍යානයේ පැළ නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර 142,127 පැළ ප්‍රමාණයක් නිපදවන ලදී.

- උද්‍යානයේ ශාක එකතුවට අදාල ශාක නාම පුවරු සවි කිරීම සිදුකරන ලද අතර විශේෂ ශාක පිළිබඳ සවිස්තරාත්මක පුවරු, උද්‍යානය තුල මාර්ග සංඥා පුවරු සහ සිහිවටන ශාක එකතුවේ ශාක නාම පුවරු ස්ථාපිත කිරීමද සිදු කරන ලදී.
- උද්‍යානයේ ශාක අංශ 4 ක් (O,P,H සහ B) ක ප්‍රතිශෝධන කටයුතු සිදුකරමින් පවතී.කුරුල්ලන් සහ සමනලුන් වඩා ආකර්ෂණය වන ශාක එකතුන් උද්‍යානයේ ස්ථාපිත කිරීමට ස්ථාපිත කිරීමට ද කටයුතු සිදුකරන ලදී.



උද්‍යානය තුල සවිකරන ලද මාර්ග සංඥා පුවරු

- නරඹන්නන් සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගත හැකි තොරතුරු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ඇතුලත් පත්‍රිකා, පුවරු සකස් කරමින් පවතී. පැමිණෙන නරඹන්නන් හට උද්‍යානය පිළිබඳ තොරතුරු ලබා දීමට උද්‍යානය තුල සංචාරය සඳහා මගපෙන්වීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කල අතර වැඩසටහන් 40 ක් පවත්වා නරඹන්නන් 1733 දෙනෙකු සඳහා එම සේවාව සපයා ඇත.

## 4.6.2. හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය, ගම්පහ

### මූල්‍ය ප්‍රගතිය

| | |
|---|---|
| අනුමත ප්‍රතිපාදන | - ඒකාබද්ධ අරමුදලින් රු. මි 16.55 |
| | උද්භිද උද්‍යාන භාරකාර අරමුදලින් රු.මි. 17.25* |
| 2017 වර්ෂයේ වියදම | - රු.මි. 32.556 |

*අනුමත ප්‍රතිපාදන සංශෝධනය වී ඇත.

### භෞතික ප්‍රගතිය



ඉදිවෙමින් පවතින ඕකිඩ් ගෘහය

- උද්‍යානයේ බාහිර පෙනුම වර්ධනය කිරීමේ අරමුණින් උද්‍යානයේ පිහිටි ගොඩනැගිලි, නිලනිවාස, පැල ගෘහ, උද්‍යානය වටා තාප්පය, ගිම්හාන කුටි සහ සෙවන ගෘහයෙහි අළුත්වැඩියා කටයුතු සිදුකරන ලද අතර උද්‍යානයේ තත්ත්වය ඉහල මට්ටමකට නඟා සිටුවීම සඳහා භූමි සංවර්ධන කටයුතු සහ සෙසු නඩත්තු කටයුතු සිදු කරන ලදී.
- උද්‍යානයට අවශ්‍ය නව ගරාජයක ඉදිකිරීම් කටයුතු සිදු කරන ලදි.
- උද්‍යානයේ කාර්යාලය ඉදිරිපිට වටරවුම් පාර පිළිසකර කර නිම කරන ලදී.
- උද්‍යානයේ ප්‍රධාන නිල නිවස අළුත්වැඩියා කරන ලද අතර ආරක්ෂිත බැම්මෙහි කොටසක් පිළිසකර කරන ලදී.
- නරඹන්නන් ගේ භාවිතය සඳහා නව වැසිකිළි පද්ධතියක ඉදිකිරීම් කටයුතු ආරම්භ කර වැඩ අවසන් කර ඇත.



ප්‍රතිසංස්කරණය කරන ලද ආරක්ෂිත තාප්පය

- උද්‍යානයේ සේවකයින් සඳහා අවශ්‍ය දෙමහල් ගොඩනැගිල්ලක පළමු අදියරේ ඉදිකිරීම් කටයුතු නිම කරන ලදී.

- උද්‍යානයේ සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් ශාක එකතුව ශක්තිමත් කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. උද්‍යානයේ පැළ නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර 58,875 පැළ ප්‍රමාණයක් නිපදවන ලදී. උද්‍යානයේ ශාක එකතුවට අදාල ශාක නාම පුවරු ද සවි කිරීම සිදුකරන ලදී.

- නරඹන්නන් සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගත හැකි තොරතුරු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ඇතුලත් පත්‍රිකා, පුවරු සකස් කරන ලදී.



උද්‍යානයේ ස්ථාපිත කරන ලද මල් ආකෘති

- උද්‍යානය වෙත නරඹන්නන් පැමිණෙන ප්‍රමාණය වර්ධනය කිරීමේ අරමුණින් මහජන ප්‍රදර්ශනය සඳහා ඕකිඩ් ශාක ගෘහයක් ඉදිකිරීම් කටයුතු සිදුකරන ලද අතර 90% ක වැඩ දැනට අවසන් වී ඇත. මීට අමතරව බොන්සායි ශාක එකතුවක් ද මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත කිරීමට කටයුතු කරන ලදී.

- උද්‍යානය පිහිටි ඉඩම අසලින් ගලා යන අත්තනගළු ඔයේ ඉවුරු ඛාදනය අධික බැවින් උද්‍යානය පිහිටි ඉඩම ඔයට සේදීමේ තර්ජනයට ලක්ව ඇත. ඉවුරු ඛාදනය අවම කිරීම සඳහා ඉවුරෙහි සංරක්ෂණ කටයුතු සිදුකරමින් පවතී.

## 4.6.3. හක්ගල උද්භිද උද්‍යානය

### මූල්‍ය ප්‍රගතිය

| | |
|---|---|
| අනුමත ප්‍රතිපාදන | -ඒකාබද්ධ අරමුදලින් රු. මි. 3.914 |
| | උද්භිද උද්‍යාන භාරකාර අරමුදලෙන් රු.මි. 35.911* |
| 2017 වර්ෂයේ වියදම | - රු.මි. 39.819 |

*අනුමත ප්‍රතිපාදන සංශෝධනය වී ඇත.

### භෞතික ප්‍රගතිය

- උද්‍යානයේ බාහිර පෙනුම වර්ධනය කිරීමේ අරමුණින් උද්‍යානයේ පිහිටි ගොඩනැගිලි, නිලනිවාස, පැල ගෘහ, ගිම්හාන කුටි, සංචාරක බංගලාවෙහි හා වෙනත් ආකෘති වල තීන්ත ආලේප කර අළුත්වැඩියා කටයුතු සිදුකරන ලදී.

- කාර්ය මණ්ඩල නිලනිවාස වලට අමතරව අළුතින් නිලනිවාස 4 ක් සහිත නිවාස සංකීර්ණයක පළමු අදියරේ ඉදි කිරීම් කටයුතු නිමකරන ලදී.



සංවර්ධන කටයුතු සිදු කරන ලද උද්‍යානයේ නව පිවිසුම් මාර්ගය

- නව වැසිකිළි පද්ධතියක ඉදිකිරීම් කටයුතු නිමකරන ලද අතර උද්‍යානයේ වැසිකිළි පද්ධතින්හි නඩත්තු කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විශේෂඥ කණ්ඩායමකගේ උපදෙස් ඇතිව පල්දොරු වලවල් 02 ක් අළුතින් ස්ථාපනය කරන ලදී.



ඉදිකෙරෙණු කසල කලමනාකරණ මධ්‍යස්ථානය

- උද්‍යානය වටා ආරක්ෂිත වැටෙහි කොටසක් ස්ථාපිත කිරීම සිදු කරන ලදී.

- උද්‍යාන අපද්‍රව්‍ය කළමණාකරණ ක්‍රියාවලිය සවිමත් කිරීම සඳහා අවශ්‍ය මධ්‍යස්ථානයක්, බැහැර කරන කසල එකතු කිරීමට, වෙන් කිරීමට හා ගබඩා කිරීමට ඉදිකරන ලදී.

- උද්‍යානයේ සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් ශාක එකතුව ශක්තිමත් කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. උද්‍යානයේ පැළ නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර 128,789 පැළ ප්‍රමාණයක් නිපදවන ලදී. අවශ්‍ය නාම පුවරු ද සවි කරන ලදී.

- නරඹන්නන් සඳහා අවශ්‍ය තොරතුරු ලබා දිය හැකි තොරතුරු ඇතුලත් පත්‍රිකා, පුවරු සකසා මුද්‍රණය වෙමින් පවති.



උද්‍යානයේ සිදුකරන ලද භූමි සංවර්ධන කටයුතු

- උද්‍යානයේ නව පිවිසුම් දොරටුව අසල රථගාලක් සංවර්ධනය කිරීමේ කටයුතු අරම්භ කරන ලදී. එහි පස සම්බන්ධව තාක්ෂණික ගැටළුවක් පැන නැගීම හේතුවෙන් එය නවතා දැමීමට සිදු වූ අතර අවශ්‍ය තාක්ෂණික උපදෙස් රැගෙන නැවත ඊලඟ වර්ෂයේදී ඉදිකිරීම කටයුතු කිරීමට බලාපොරොත්තු වේ.

- උද්‍යානයේ තත්ත්වය ඉහළ මට්ටමකට නඟා සිටුවීම සඳහා භූමි සංවර්ධන කටයුතු සහ සෙසු නඩත්තු කටයුතු ක්‍රියාත්මක කරන ලදී.

- උද්‍යානයේ මාර්ග වල තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ගල් ඇතිරීමේ කටයුතු සිදුකරන ලද අතර නව පිවිසුම් මාර්ගයේ ඇතුල් කොටස සකස් කරන ලදී.

- උද්‍යානයේ නව ප්‍රවේශ පත්‍ර කවුළුවේ ආරක්ෂාව සඳහා චේන් ලින්ක් වැටක් ස්ථාපිත කරන ලදී.

## 4.6.4. ගනේවත්ත වන ඖෂධ උද්‍යානය සංවර්ධනය

### මූල්‍ය ප්‍රගතිය

| | |
|---|---|
| අනුමත ප්‍රතිපාදන | - ඒකාබද්ධ අරමුදල් වලින් රු. මි. 9.25 |
| | උද්භිද උද්‍යාන භාරකාර අරමුදලෙන් රු.මි. 0.71 * |
| 2017 වසරේ වියදම | - රු.මි. 9.943 |

### භෞතික ප්‍රගතිය



ජලජ ඖෂධීය පැලෑටි එකතුවක් ස්ථාපනය කිරීම සඳහා තැනුන පොකුණ

- උද්‍යානයේ බාහිර පෙනුම වැඩිදියුණු කිරීම සඳහා ගොඩනැගිලි සහ අනෙකුත් ව්‍යුහයන් හි නඩත්තු කටයුතු සිදුකිරීම තුලින් උද්‍යානය උසස් තත්ත්වයකින් පවත්වා ගැනීමට කටයුතු සිදුකරන ලදී.

- උද්‍යානයේ රෝපණ වැඩසටහන ක්‍රියාත්මක වූ අතර පැළ 27,318 කට කට අධික ප්‍රමාණයක් නිපදවන ලදී. අධික නියං කාලයක් වර්ෂය මුල සිට මේ දක්වා පැවති හෙයින් ශාක එකතුන් අළුතින් ඇතිකිරීම අපහසු වූ නමුත් පවතින ශාක එකතුන් වැඩිදියුණු කිරීමට කටයුතු

- නරඹන්නන් සඳහා වන පහසුකම් ඉහල නැංවීම සඳහා අවශ්‍ය පානීය ජල කරාම සහ බංකු ස්ථාපිත කරන ලදී.
- පැල බඳුන් ගත කරන ස්ථාන දෙකක් ස්ථාපිත කිරීමට කටයුතු සිදුකල අතර ස්ථාපිත කිරීම සිදුකරන ලදි.
- ශාකාගාර කොටසෙහි සිවිලිම අළුත්වැඩියා කරන ලද අතර පැල ගෘහයේ නවීකරණ කටයුතු සිදු කරන ලදී.
- අළුතෙන් ඉදි කරන ලද දේශීය ඖෂධ අගයන්ගෙන් යුත් ආහාර පාන සහිත ආපනශාලාව මහජනතාවට විවෘත කරන ලදී.
- ඖෂධ ශාක පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන යටතේ පුද්ගලයින් 2,416 දෙනෙකු ඖෂධ ශාක භාවිතය, ඒවායෙහි වටිනාකම සහ සංරක්ෂණය පිළිබඳ දේශන පවත්වා දැනුවත් කරන ලදී. ඖෂධීය ශාක පිලිබඳ තොරතුරු පත්‍රිකා 15 ක් විස්තරාත්මක ශාක පුවරු 25 ක් සඳහා අවශ්‍ය තොරතුරු රැස් කර ඒවා සකස් කර මුද්‍රණයට භාර දී ඇත.
- නියං කාලයේදී ප්‍රයෝජනයට ගැනීම සඳහා වර්ෂා ජලය එක් රැස් කරන ස්ථානයක් ස්ථාපිත කරන ලදී.
- උද්‍යානයේ සේවකයින් සඳහා ක්ෂේත්‍ර කාර්යාලයක් ඉදිකරමින් පවති.
- ජලජ ඖෂධ ශාක එකතුවක් ස්ථාපිත කිරීම සඳහා පොකුණක් ඉදිකරන ලද අතර ඉඩම් වැඩිදියුණු කිරීම් කටයුතු ද සිදුකරන ලදී.



අළුත්වැඩියා කෙරුණු පැල ගෘහය



උද්‍යානයේ ස්ථාපිත බංකු



ඖෂධ ශාක පිළිබද දැනුවත් කිරීම් දේශණ පවත්වමින්

*අනුමත ප්‍රතිපාදන සංශෝධනය වී ඇත.

## 4.6.5. ශාකාගාරය සහ ශාක වර්ගීකරණ පර්යේෂණ

### මූල්‍ය ප්‍රගතිය

| | |
|---|---|
| අනුමත ප්‍රතිපාදන | - උද්භිද උද්‍යාන භාරකාර අරමුදලෙන් රු.මි. 4.85* |
| 2017 වසරේ වියදම | - රු.මි. 4.841 |

*අනුමත ප්‍රතිපාදන සංශෝධනය වී ඇත.

### භෞතික ප්‍රගතිය

- ජෛව භූගෝල විද්‍යාව පිළිබඳ එක් දින වැඩමුළුවක් ජෛව විද්‍යා ආයතනය හා එක්ව රාජකීය උද්භිද උද්‍යාන අධ්‍යාපන පුහුණු මධ්‍යස්ථාන පරිශ්‍රයේ, ජාතික ශාකාගාරය මඟින් සංවිධානය කර පවත්වන ලදී. මෙහිදී ජෛව භූගෝල විද්‍යාව පිළිබඳ හා එයට අදාල ප්‍රායෝගික විධි පිළිබඳ වැඩමුළුවට සහභාගි වුවන් දැනුවත් කරන ලදී. ප්‍රධාන වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රජාව සහ අනෙකුත් අදාල අංශ මේ හරහා දනුවත් කරන ලදී. මේ සඳහා ෆ්ලෝරිඩා විශ්ව විද්‍යාලයේ ජෛව විද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රාණි විද්‍යාව පිළිබඳ කෞතුකාගාරයේ ආචාර්ය නිකෝ සෙලිනස් (Dr. Nico Cellines), දකුණු අප්‍රිකාවේ ක්වාසුලු-නටාල් විශ්ව විද්‍යාලයේ (Kwazulu-Natal University) ජ්‍යෙෂ්ඨ පර්යේෂකයෙකු වන ආචාර්ය රොබට් ඩග්ලස් ස්ටෝන් (Dr. Robert Dauglas Stone) සහ ෆ්ලෝරිඩා විශ්ව විද්‍යාලයේ ජෛව විද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රාණි විද්‍යාව පිළිබඳ කෞතුකාගාරයේ ප්‍රභා අමරසිංහ මිය සම්පත් දායකත්වය ලබා දෙන ලදී.



ජාතික ශාකාගාරය මඟින් සංවිධානය කර පවත්වන ලද ජෛව භූගෝල විද්‍යාව පිළිබඳ එක් දින වැඩමුළුවේ අවස්ථාවක්


ජාතික ශාකාගාරය මගින් ජාතික රතු දත්ත නාමාවලි ග්‍රන්ථය සැකසීමේ ව්‍යාපෘතියේ රැස්වීම් අවස්ථාවක්

- ජෛව විවිධත්වය සංරක්ෂණය සහ ශාකාගාර තාක්ෂණික ක්‍රම හා කළමනාකරණය පිළිබද වැඩමුළු හා දැනුවත් කිරීමේ වැඩසටහන් 18 ක් පාසල් සිසුන් 318 ක්, විශ්වවිද්‍යාල සිසුන් 448 ක් ද, රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ නිලධාරීන් 143 ක් සඳහා පවත්වන ලදී. මෙහිදී ජෛව විවිධත්වය යනු කුමක්ද යන්න සහ ජෛව විවිධත්ව සංරක්ෂණයෙහි වැදගත්කම සහ ශාකාගාරයෙහි දායකත්වය පිළිබද පාසල් සිසුන් දැනුවත් කෙරිණි. මීට අමතරව ෆ්ලොරිඩා විශ්වවිද්‍යාලීය සිසුන් 25 දෙනෙකුට ශාකගාරයේ ඉතිහාසය හා එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ දේශනයක් ද පවත්වන ලදී.


ජෛව විවිධත්වය සංරක්ෂණය පිළිබද පාසල් සිසුන් දැනුවත්කළ අවස්ථාවක්

- උද්භිද විද්‍යාත්මක ශාක ගවේෂණ වැඩසටහන යටතේ ප්‍රධාන වශයෙන් වියළි සහ තෙත් කලාපීය තර්ජනයට ලක්වූ ශාක ඉලක්ක කරගනිමින් ශාක ගවේෂණ කටයුතු මෙම වසරේ දී ද සිදු කරන ලදී.

- උද්භිද විද්‍යාත්මක ශාක ගවේෂණ වැඩසටහන යටතේ ක්ෂේත්‍ර ගවේෂණ 24 ක් සිදු කරන ලද අතර සජීවී සපුෂ්ප ශාක නිදර්ශක 1,185 ක්, මීවන ශාක නිදර්ශක 106 ක් සහ පාසි ශාක නිදර්ශක 47 ක් එකතු කෙරිණි.



උද්භිද විද්‍යාත්මක ශාක ගවේෂණ වැඩසටහන යටතේ ක්ෂේත්‍ර ගවේෂණ සිදු කිරීමේ දී රුමස්සල කේෂත්‍ර ගවේෂණයේදී සොයා ගත් වඳ වී ගොස් ඇති 2012 රතු දත්ත පොතෙහි සදහන් *Rinorea bengalensis* ශාකය

- මෙම ශාක නිදර්ශක අතුරින් තර්ජනයට ලක්වූ ශාක හඳුනාගැනීම සිදුකල අතර, වඳ වී ගිය ශාක කාණ්ඩයේ එක් ශාක විශේෂයක්ද, දැඩි ලෙස වඳ වී යාමේ අවදානමට ලක්වූ ශාක 10 ක්ද, වඳ වී යාමේ අවදානමට ලක්වූ ශාක 80 ක් ද, අනාගතයේ දී අවදානමට ලක්විය හැකි ශාක 129 ක්ද, තර්ජනයට ලක්වීමට ආසන්න ශාක 79 ක් ද හඳුනා ගන්නා ලදී. ශාක විතැන් සංරක්ෂණ ක්‍රමවේද යොදා ගනිමින් අවශ්‍ය අවස්ථා වලදී ශාක සංරක්ෂණ කටයුතු ද සිදු කරන ලද අතර රැස් කර ගන්නා ලද නිදර්ශක ජාතික ශාකාගාරයේ අනාගත විමර්ශනය සඳහා තැන්පත් කිරීමට කටයුතු කර ඇත.
- මෙම උද්භිද විද්‍යාත්මක ශාක ගවේෂණ වැඩසටහන යටතේ ක්ෂේත්‍ර ගවේෂණ සිදු කිරීමේ දී රුමස්සල ක්ෂේත්‍ර ගවේෂණයේදී සොයා ගත් වඳ වී ගොස් ඇති 2012 රතු දත්ත පොතෙහි සඳහන් *Rinorea bengalensis* ශාකය සොයා ගැනින. උද්භිද විද්‍යාත්මක ශාක ගවේශණ වැඩසටහනට අමතරව දුර්ලභ ඖෂධීය පැලෑටි ගවේෂණය සඳහා ද වැඩසටහනක් පේරාදෙණිය උද්භිද උද්‍යානය සමඟ එක්ව ආරම්භ කරන ලදී.මෙහිදී දුර්ලභ ඖෂධීය පැලෑටි විශේෂ 42 ක් එකතු කරන ලද අතර සංරක්ෂණ කටයුතු සඳහා ගනේවත්ත වන ඖෂධ උද්‍යානයට භාර දෙන ලදී.මෙම වැඩසටහන මඟින් ගනේවත්ත පිහිටි වන ඖෂධ උද්‍යානය පැලෑටි එකතුව වැඩිදියුණු කිරීමද අරමුණු වේ.

- පාසි සංරක්ෂණ වැඩසටහනක් ද ශාකාගාරය මඟින් සිදුකරන ලද අතර කේෂත්‍ර ගවේෂණ වලදී එකතු කරගන්නා පාසි ශාක විශේෂ එකතුවක් රාජකීය උද්භිද උද්‍යානය තුල ස්ථාපිත කර පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී.

- ජාතික රතු දත්ත නාමාවලි ග්‍රන්ථය සැකසීමේ ව්‍යාපෘතිය සඳහා මහඟු දායකත්වයක් සපයන ලදී.මෙහිදී ශාක නිදර්ශක ඇගයීම්,තොරතුරු එක් රැස්කිරීම හා ශාක නාම තහවුරු කිරීම් කටයුතු සිදුකරන ලදී. මීට අමතරව බාහිර පුද්ගලයන් සඳහා ශාක වල උද්භිද විද්‍යාත්මක නාම තහවුරු කිරීම, ශාක හඳුනාගැනීම් කටයුතු සිදුකරන ලද අතර ශ්‍රී ලංකා පොලිසිය, උසාවි හා අනෙකුත් අවශ්‍ය ආයතන සඳහා මෙම සේවාවන් සපයන ලදී.

- "Common Wayside Trees of Sri Lanka" යන ග්‍රන්ථ සංග්‍රහයෙහි සංස්කරණ කටයුතු අවසන් කර මුද්‍රණය සඳහා භාර දී ඇත. එය මෙම වසර අගදී ප්‍රකාශයට පත් කිරීමට බලාපොරොත්තු වේ.එහි ඡායාරූප සහිත නිදර්ශක 200 කද විද්‍යාත්මක තොරතුරු/ පොදු නාම, සංරක්ෂණ තත්ත්වයන්, වාසස්ථානද අඩංගුය. මෙම ග්‍රන්ථ තොරතුරු දෙමළ සහ සිංහල භාෂාවන්ගෙන් යුක්ත වේ.

- ශ්‍රී ලංකාවේ තර්ජනයට ලක්වූ ශාක, ආක්‍රමණික ශාක, පර්ණාංග සහ කේෂත්‍ර ගවේෂණ හරහා එකතු කර ගන්නා ලද තර්ජනයට ලක් වූ පිළිබඳ අත් පත්‍රිකා, පෝස්ටර් මුද්‍රණය කර ප්‍රකාශයට සකස් කර නිම කරන ලදි. මීට අමතරව ඓතිහාසික,ලෝක ප්‍රසිද්ධියට පත් හරමානිස් ඩී. අල්විස් ශාක රූපසටහන් (චිත්‍ර) එකතුව ප්‍රකාශනය සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින අතර ලබන වසර මුල ප්‍රකාශයට පත්කිරිමට කටයුතු යොදා ඇත.

- මධ්‍යම පළාත තුල තෝරාගත් ප්‍රදේශවල පාසි ශාකවල විවිධත්වය පිලිබිඹු කෙරෙනා විද්‍යාත්මක පෝස්ටර් පත්‍රිකාවක් නිර්මාණය කර එය ජාත්‍යන්තර සම්මන්ත්‍රණයක (27 වැනි ආසියා පැසිපික් වනාන්තර විද්‍යා කොමිසම) ප්‍රදර්ශනය කරන ලදි.
- ජාතික ශාකාගාරයේ තැන්පත් රූප සටහන් සහ නිදර්ශක සංඛ්‍යාව නිර්ණයට සහ අධ්‍යයනය පහසු කිරීමේ අරමුණින් එම නිදර්ශක වලට ප්‍රවේශ අංකයන් (Accession number) ලබා දී ඒවා දත්ත පද්ධතියකට ඇතුලත් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.
- ජාතික ශාකාගාරයේ වහලයෙහි අළුත්වැඩියා කටයුතු සිදුකල අතර ජාතික ශාකගාරය තුල තැන්පත් කර ඇති නිදර්ශක නිසියාකාරව නඩත්තු කර පවත්වාගෙනයාමට කටයුතු ද සිදු කරන ලදී.

## 4.6.6. ජාතික මල්වගා සංවර්ධන වැඩසටහන

### මූල්‍ය ප්‍රගතිය

| | |
|---|---|
| අනුමත ප්‍රතිපාදන | - ඒකාබද්ධ අරමුදල් වලින් රු. මි. 10.00 |
| | උද්භිද උද්‍යාන භාරකාර අරමුදලෙන් රු.මි. 24.626 * |
| 2017 වසරේ වියදම | - රු.මි. 34.597 |

*අනුමත ප්‍රතිපාදන සංශෝධනය වී ඇත.

### භෞතික ප්‍රගතිය

- පහළ සහ මධ්‍ය ප්‍රමාණයේ මල්වගාකරුවන් සවිබල ගැන්වීම සහ ඔවුන්ගේ ආර්ථික තත්ත්වය නඟා සිටුවීමට මල්වගා සංවර්ධන වැඩසටහන මෙම වසරේදී ද ක්‍රියාත්මක කරන ලදි.
- දිවයින පුරා මල්වගා ව්‍යාප්තිය සඳහා මල්වගා ගොවි සංගම් ප්‍රමාණය 185 ක් ක්‍රියාත්මක වන අතර ඒ හරහා සාමාජිකයින් 7,000 ක් ප්‍රතිලාභ ලබයි. ඇන්තූරියම්, ඕකිඩ්, රෝස, ජර්බෙරා, කැපු පත්‍ර සහ පටක රෝපණය පිළිබඳ පුද්ගලයින් 21,724 ක් පුහුණු කර ඇත.



වගාකරුවන් දැනුවත් කරමින්

- මල්වගා කරුවන්ගේ කාර්මික සහ සෙසු නිපුණතා වැඩිදියුණු කිරීම සඳහා වැඩමුළු 14 ක් පවත්වන ලද අතර වගා කරුවන් 1,050 ක් පුහුණු කරන ලදී.
- මල්වගා කරුවන්ගේ මල් වගාවන් අලෙවිකරණය ඉහල නැංවීම සඳහා සුළු පරිමාණ ප්‍රදර්ශන 322 ක් සහ දිස්ත්‍රික් මට්ටමේ විශාල ප්‍රදර්ශන 20 ක් පවත්වන ලදි. මල්වගා කරුවන්ගේ පැළ තවාන් 1,514 කට ගොස් ඔවුන්ගේ ක්ෂේත්‍ර ගැටළු සඳහා උපදෙස් ලබාදෙන ලදී.



අළුත්වැඩියා කල බිගෝනියා පැල ගෘහය

- ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාව සහයෝගීත්වයෙන් 2017 වසරේ ඔක්තෝබර් 30 වැනි දින මල් වගා පර්යේෂණ පිළිබඳ ජාතික සමුළුව පවත්වන ලදි. මෙහිදි මල්වගා ක්ෂේත්‍රයේ පවතින ගැටළු පිළිබඳ, සංවර්ධනය උදෙසා වන පර්යේෂණ පත්‍රිකා 22ක් ඉදිරිපත් කරන ලදි.

- රටෙහි මල්වගා කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා වර්තමාන හා අනාගත ක්ෂේත්‍ර අවශ්‍යතාවයන්ට සරිලන පර්යේෂණ කටයුතු සිදුකරන ලද අතර වර්තමානයේ වගා කරුවන් මුහුණ දෙන ගැටළු විසඳීම සඳහා පර්යේෂණ කිහිපයක් ද ක්‍රියාත්මක කරන ලදි. මීට අමතරව වාණිජමය මල්වගාව,තවාන් පාලනය,පලිබෝධ සහ රෝග කළමනාකරණය ආශ්‍රිතව පැන නගින ගැටළු සම්බන්ධව පුද්ගලයින් සහ ආයතන සඳහා අය කිරීමකින් තොරව උපදේශන කටයුතු සිදු කරන ලදී.



මල්වගා ප්‍රදර්ශණයක් පවත්වමින්

- ක්ෂේත්‍රයේ දී සහ රසායනාගාර පහසුකම් යටතේ ඕකිඩ් දෙමුහුන් වර්ග සහ ඇන්තූරියම් වර්ග සැකසීම සඳහා පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවති.
- සියලුම උද්‍යානයන් හි මල්වගා අංශ වල පැළ තවාන් උසස් මට්ටමකින් නඩත්තු කල අතර වැඩිදියුණු කිරීම සහ සංවර්ධනය සඳහා අවශ්‍ය රෝපණ ද්‍රව්‍ය මිලදී ගැනීම් සිදු කරන ලදී. පේරාදෙණිය උද්‍යානයෙහි බිගෝනියා පැළ ගෘහයෙහි තත්ත්වය ඉහල නැංවීමේ අරමුණින් අළුත්වැඩියා කටයුතු සිදු කරන ලදී. පේරාදෙණිය මල්වගා අංශයෙහි විද්‍යාගාරයද අළුත්වැඩියා කරන ලදී.



වගාකරුවන් දිරිමත් කිරීමේ අරමුණින් රෝපණ ද්‍රව්‍ය ලබා දෙමින්

- මල්වගා ක්ෂේත්‍රය, ශාක සම්බන්ධ තොරතුරු කොළඹ ප්‍රදේශයේ ජනතාවට ලබාදීම සඳහා තොරතුරු මධ්‍යස්ථානයක් ලෙස වැඩිදියුණු කරන ලද නාරාහේන්පිට පිහිටි සහකාර අධ්‍යක්ෂ කාර්යාලයෙහි පිහිටි ශ්‍රවණාගාරයේ මල්වගා ක්ෂේත්‍රය, ශාක සම්බන්ධ උපදේශන කටයුතු සිදුකිරීම, පුහුණු පන්ති පැවැත්වීම වැනි මල්වගා ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයට සහ සංවර්ධනයට කටයුතු සිදු කරනු ලබයි. මෙහිදී පුද්ගලයන් 488 කට අවශ්‍ය පුහුණුව හා දැනුම ලබා දෙන ලදී.
- මල්වගා ක්ෂේත්‍රයේ නියැලෙන මල්වගා ගොවි සංගම්වල සාමාජිකයින් හට පහසුකම් සැලසීමේ අරමුණින් සෙවන දැල්, පොලිතින් හා ප්ලාස්ටික් පෝච්චි මිලදිගෙන ඔවුන් අතර බෙදා දීමට කටයුතු කරන ලදි.

## 4.6.7. අධ්‍යාපනය සහ පුහුණුව

### මූල්‍ය ප්‍රගතිය

| | |
|---|---|
| අනුමත ප්‍රතිපාදන | - ඒකාබද්ධ අරමුදල් වලින් රු.මි. 0.50 |
| | උද්භිද උද්‍යාන භාර අරමුදලෙන් රු.මි. 2.25* |
| 2017 වර්ෂයේ වියදම | - රු.මි. 2.743 |

*අනුමත ප්‍රතිපාදන සංශෝධනය වී ඇත.



එක් දින ඕකිඩ් වගාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වමින්

### භෞතික ප්‍රගතිය

- පේරාදෙණිය උද්භිද උද්‍යානයේ පිහිටි අධ්‍යාපන හා පුහුණු මධ්‍යස්ථානයේ පහසුකම් වැඩි දියුණු කරන ලද අතර අළුත්වැඩියා කටයුතු සිදු කරන ලදී.

- තරුණයින් 120 ක් නවීන මල් වගා ක්‍රමවේද, භූ අලංකරණ ක්‍රමවේද පිළිබඳව ත්‍රෛමාසික සහතික පත්‍ර පාඨමාලාව හරහා පුහුණු කරන ලදී.

- භූ දර්ශණ සංවර්ධන සහකාර ලෙස ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය - මට්ටම 4 (NVQ- level 4) ලබා දෙන එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගැනීම් සිදුකරන ලද අතර 7 දෙනෙකු ලියාපදිංචි වී පාඨමාලාව හදාරයි.



දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා ශාකාගාර තාක්ෂණික ක්‍රම හා කළමනාකරණය පිළිබද වැඩසටහනක් පවත්වමින්

- රෝස වගාව, තවාන් කළමනාකරණය, ශාක හඳුනාගැනීම, ශාක ශල්‍යකර්මයන්, මල් සැකසුම්, පශ්චාත් අස්වනු තාක්ෂණය, භූමි අලංකරණය සහ සෙසු ආශ්‍රිත විෂයයන් පිළිබඳව ප්‍රතිලාභීන් 12,709 ක් පුහුණු කරන ලදී. මීට අමතරව ජෛව විවිධත්වය හා එහි සංරක්ෂණය පිළිබඳ පාසල් සිසුන් ඇතුළුව පුද්ගලයින් 220 ක් දැනුවත් කරන ලදී.

- දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලද අතර අවශ්‍ය අවස්ථා වලදී දෙපාර්තමේන්තුවට පරිබාහිර ස්ථාන වලදී පුහුණුව දීමට කටයුතු කරන ලදී.

- කුඩා ළමුන් සඳහා වැඩසටහනක් ලෝක ළමා දිනය වෙනුවෙන් ඔක්.01 දා ස්වාධීන රූපවාහිනී සේවය සමඟ පවත්වන ලදී.

## 4.6.8. මීගලෑව හරිත පියස පුහුණු මධ්‍යස්ථානය

### මූල්‍ය ප්‍රගතිය

| | |
|---|---|
| අනුමත ප්‍රතිපාදන | - ඒකාබද්ධ අරමුදල් වලින් රු.මි. 6.00* |
| 2017 වර්ෂයේ වියදම | - රු.මි. 5.982 |

*අනුමත ප්‍රතිපාදන සංශෝධනය වී ඇත.

### භෞතික ප්‍රගතිය

- ක්ෂේත්‍ර කාර්යාල ගොඩනැගිල්ල අංක. 05 හි අළුත්වැඩියා කටයුතු සිදු කෙරුණු අතර එහි කටයුතු නිම කරන ලදී.

- පැළ රෝපණ වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර පැළ 37,970 ක ප්‍රමාණයක් නිපදවන ලදී.

- මීට අමතරව ක්ෂේත්‍ර කටයුතු සඳහා අවශ්‍ය යන්ත්‍රසූත්‍ර, කාර්යාලීය ලී බඩු හා වෙනත් අවශ්‍ය මෙවලම් මිලදී ගන්නා ලදී.



ක්‍රියාත්මක පැළ රෝපණ වැඩසටහන

## 4.6.9. මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය, හම්බන්තොට

### මූල්‍ය ප්‍රගතිය

| | |
|---|---|
| අනුමත ප්‍රතිපාදන | -ඒකාබද්ධ අරමුදලින් රු.මි. 74.20* |
| 2017 වර්ෂයේ වියදම | - රු.මි. 73.205 |

*අනුමත ප්‍රතිපාදන සංශෝධනය වී ඇත.

## භෞතික ප්‍රගතිය




දකුණු නව පිවිසුම් මාර්ගය අසල ඉදිකෙරුණු ගිම්හාන කුටියක්

- උද්භිද උද්‍යානයේ යටිතල හා මහජන පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණින් සංවර්ධන වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කෙරුණි.

- දැනට පවතින කාර්ය මණ්ඩල නිල නිවාස 03 ට අමතරව අලුතින් නිල නිවාස 04 ක් සහිත සංකීර්ණයක් ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පවතී. එහි පළමු අදියරේ ඉදිකිරීම් කටයුතු අවසන් කරන ලදි.

- උද්‍යානයේ සහ ප්‍රදේශයේ මල්වගා සංවර්ධන කටයුතු වැඩිදියුණු කිරීම සඳහා මල්වගා ප්‍රදර්ශන පැවැත්වීම සඳහා මල් ප්‍රදර්ශණ මධ්‍යස්ථානයක් ඉදි කරන ලදී .පලමු අදියරෙහි ඉදිකිරීම් කටයුතු නිම කරන ලදී. දෙවන අදියර ඊළඟ වර්ෂයේ නිම කිරීමට බලාපොරොත්තු වේ.



නව කාර්යාල ගොඩනැගිල්ල හා තොරතුරු මධ්‍යස්ථානය

- උද්‍යානයේ ශාක ප්‍රචාරණ කටයුතු සඳහා අවශ්‍ය බීජ ගබඩා කිරීම සඳහා කාමරයක් ස්ථාපිත කිරීම් කටයුතු සිදුකරන අතර දැනට අවසන් වී ඇත.

- මව් ශාක එකතුවක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය සෙවන ගෘහයක් සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගත් අතර ඉදිකිරීම් කටයුතු සිදුකරන ලදි.

- නරඹන්නන් ගේ භාවිතය සඳහා නව භෝජනාගාරයක් ස්ථාපිත කිරීමේ කටයුතු හා නිලනිවාසයක ඉදිකිරීම් කටයුතු මෙම වසරේදී අවසන් කරන ලදී.




ඉදිකෙරෙමින් පවතින මල්වගා ප්‍රදර්ශණ මධ්‍යස්ථානය

- උද්‍යානයේ මාර්ග වල තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා කාපට් කිරීම සිදු කරන ලදී.

- අළුතින් ඉදිකරන ලද උද්‍යානයට ඇතුළුවීමේ නව ප්‍රවේශය ආශිතව ගිම්හාන කුටි 02 ක් ස්ථාපිත කරන ලද අතර විධිමත් උද්‍යානයේ ගිම්හාන කුටි 04 ක් ඉදිකරන ලදී.

- උද්‍යානයේ භූ දර්ශනීය ලක්ෂණ වැඩි දියුණු කිරීම සඳහා අලංකාර ශාක සහිත මල් උයන්, අඩිපාරවල්, මාවත් සහ අනෙකුත් උද්‍යාන අංග වැඩිදියුණු කරමින් ක්ෂේත්‍ර සංවර්ධන කටයුතු ද සිදු කරන ලදි.




විධිමත් උද්‍යානයේ සංවර්ධිත ජල අපවහන පද්ධතිය

- ප්‍රදේශයේ මල් වගාකරුවන් හට පහසුකම් සැපයීම සඳහා උද්‍යානයේ මල් වගා සංවර්ධන කටයුතු වැඩිදියුණු කර ඇත. උද්‍යානයේ සජීවී ශාක එකතුව වැඩිදියුණු කර ඇති අතර මල් වගා ව්‍යාප්ති කාර්යාලයේ පහසුකම් වැඩිදියුණු කර ඇත. ප්‍රදේශයේ මල් වගාකරුවන් දිරිගැන්වීම සහ ධාරිතා වර්ධනය සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම, වැඩමුළු හා පුහුණු සැසි ද පවත්වන ලදී.

- උද්‍යානයේ සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් ශාක එකතුව ශක්තිමත් කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. උද්‍යානයේ පැළ නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර 43,414 ක පැළ ප්‍රමාණයක් නිපදවන ලදී.

- නව කාර්යාලයක්,කුඩා ශාකාගාරයක්, සාකච්ඡා කාමරයක්, පුස්තකාලයක් සමඟ නරඹන්නන් සඳහා මධ්‍යස්ථානයක් දකුණු දොරටුව අසල ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද අතර එහි පළමු අදියරේ වැඩ කටයුතු දැනට අවසන් වී ඇත.



අලුතින් ඉදිකරන ලද නිල නිවාස 04 ක් සහිත සංකීර්ණය- අවසන් කරන ලද පළමු අදියරේ ඉදිකිරීම් කටයුතු

- උද්‍යානයේ විදුලි පරිභෝජනයට වැය වන අධික මුදල අවම කර ගැනීමට සූර්ය කෝෂ පද්ධතියක් ගොඩනැගිලි සහ අනෙකුත් ආකෘති සඳහා විදුලිය සැපයීමට සවි කිරීමේ කටයුතු සිදු කිරීමට අවශ්‍ය ටෙන්ඩර් කැඳවීමේ කටයුතු සිදු කෙරුණු අතර 2018 වසරේ ස්ථාපිත කිරීම් සිදු කරනු ඇත.
- උද්‍යානයට අවශ්‍ය ශාක නාම පුවරු,විස්තරාත්මක පුවරු හා මාර්ගෝපදේශ සපයන පුවරු සවි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවති.
- උද්‍යානයේ මැද වැව කොටසේ සහ විධිමත් උද්‍යානයේ ජල අපවහනය කාර්යක්ෂම කිරීම සඳහා කාණු සහ ඇල මාර්ග සකසන ලදී.
- උද්‍යානයේ නව ප්‍රවේශය සහිත දකුණු කොටසේ රථගාල සංවර්ධන කටයුතු සිදු කරන ලදී.



අලුතින් ඉදිකරන ලද උද්‍යානයේ ප්‍රරෝහණ ඒකකය හා ගබඩාව



දක්ෂිණ ප්‍රවේශ දොරටුවේ රථ ගාල අසල

## 4.6.10. සීතාවක තෙත් කළාපීය උද්භිද උද්‍යානය, අවිස්සාවේල්ල

### මූල්‍ය ප්‍රගතිය

| | |
|---|---|
| අනුමත ප්‍රතිපාදන | - ඒකාබද්ධ අරමුදලින් රු. මි. 25.45 |
| | උද්භිද උද්‍යාන භාරකාර අරමුදලෙන් රු.මි. 2.403* |
| 2017 වර්ෂයේ වියදම | - රු.මි. 27.663 |

*අනුමත ප්‍රතිපාදන සංශෝධනය වී ඇත.

### භෞතික ප්‍රගතිය

- උද්‍යානයේ නරඹන්නන් සඳහා පහසුකම් උද්‍යානය තුල ඇතිකිරීම, නඩත්තු කටයුතු ඉහල මට්ටමකින් පවත්වාගෙන යාම සහ උද්‍යානය තුල නව පහසුකම් ඇති කිරීම සඳහා විවිධ සංවර්ධන කටයුතු සිදු කරන ලදී.
- උද්‍යානයට පැමිණෙන නරඹන්නන් හට පහසුකම් සැපයීමේ අරමුණින් වැව ආශ්‍රිතව බෝට්ටු අංගණයක් හා ජැටියක් ඉදිකරන ලදී.
- රෝස උයන හා ජපන් උයන අසල ගිම්හාන කුටි 02 ක් ඉදිකිරීම් කටයුතු නිම කරන ලදී.මීවන උයන අසල නව ගිම්හාන කුටියක් ඉදිකරන ලදී.
- උද්‍යානය තුල පානීය ජල පද්ධතියක් ස්ථාපනය කිරීමේ කටයුතු සිදුවෙමින් පවතින අතර ජල පොම්පාගාරය අළුත්වැඩියා කිරීම සිදුකරන ලදී.
- උද්‍යානය වටා ආරක්ෂිත වැට කොටසක් ස්ථාපනය කිරීම් කටයුතු සිදුකරන ලදී.
- නව වැසිකිලි පද්ධතියක ඉදි කිරීම් කටයුතු සිදුකර අවසන් කරන ලදි.



වැව ආශ්‍රිතව ඉදිකරමින් පවතින බෝට්ටු අංගණය හා ජැටිය



ජපන් උයන අසල නිම කරන ලද ගිම්හාන කුටිය

- උද්‍යානයේ මල්වගා කටයුතු වැඩිදියුණු කිරීමේ අරමුණින් ඇන්තූරියම් හා ඕකිඩ් පැල තවාන සහිත සෙවන ශාක උද්‍යානයේ පැල තවාන් පිහිටි ප්‍රදේශය වෙත විතැන් කරන ලදී.



ඉදි කිරීම් කටයුතු සිදුකරමින් පවතින නව වැසිකිලි පද්ධතිය

- උද්‍යානයේ භූ දර්ශනීය ලක්ෂණ වැඩි දියුණු කිරීම සඳහා අලංකාර ශාක සහිත මල් උයන්, අඩිපාරවල්, මාවත් සහ අනෙකුත් උද්‍යාන අංශ වැඩිදියුණු කරමින් ක්ෂේත්‍ර සංවර්ධන කටයුතු ද සිදු කරන ලදි.

- උද්‍යානයේ සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් ශාක එකතුව ශක්තිමත් කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. උද්‍යානයේ පැළ නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර 61,248 පැළ ප්‍රමාණයක් නිපදවන ලදී.

- උද්‍යානයේ ප්‍රවර්ධන කටයුතු සඳහා මාර්ග දෙපස සවි කිරීම සඳහා පුවරු සකසා ස්ථාපිත කිරීම් කටයුතු නිම කරන ලදි.



උද්‍යානයේ භූ දර්ශනීය ලක්ෂණ වැඩි දියුණු කිරීම් කටයුතු

- සියලු උද්‍යානයන් හි කාර්යක්ෂම කළමනාකරණය සඳහා අවශ්‍ය නව යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ උද්‍යාන මෙවලම් යනාදිය මිලදීගත් අතර පවතින යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ද වැඩිදියුණු කිරීම තුලින් උද්‍යාන අලංකාරය උසස් මට්ටමකින් පවත්වාගෙන යන ලදී.

- ඉහත සඳහන් සංවර්ධන වැඩසටහන් වලට අමතරව දෙපාර්තමේන්තුව විසින් මහනුවර, ජාවත්ත, බොරැල්ල සහ ත්‍රිකුණාමලයේ පිහිටි පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් ඒකක, අතිගරු ජනාධිපතිතුමාගේ කොළඹ 01, නුවර, නුවරඑළිය සහ අනුරාධපුර නිල නිවාස උද්‍යාන සහ ගරු අගමැතිතුමාගේ අරලියගහ මැදුර නිල නිවාස උද්‍යානය සහ නුවරඑළිය නිළ නිවාස උද්‍යානය ද අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ සෞඛ්‍ය තත්වය මනා ලෙස පවත්වාගෙන යාමේ කටයුතු ද සිදු කරනු ලැබීය.




අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ සෞඛ්‍ය තත්වය මනා ලෙස පවත්වාගෙන යාමට කටයුතු ද සිදු කරමින්

## 4.7. මූල්‍ය ප්‍රගතිය

ප්‍රධාන උද්‍යානයන් හි සහ අනෙකුත් ඒකකවල සංවර්ධන කටයුතු සැලසුම් කළ පරිදි සිදුකල අතර 2017 වර්ෂය අවසාන වන විට දෙපාර්තමේන්තුවේ සමස්ත මූල්‍යමය ප්‍රගතිය 99 % ක් විය.

### 4.7.1. 2017 වර්ෂයේ වැය විස්තරය

| විස්තරය | මුළු ප්‍රතිපාදන (රු.මි) | මුළු වැය (රු.මි) | % |
|---|---|---|---|
| ප්‍රාග්ධන මූල්‍ය වෙන්වීම් | 300.05 | 297.36 | 99.1 |
| පුනරාවර්තන මූල්‍ය වෙන්වීම් | 364.69 | 358.28 | 98.2 |
| එකතුව | **664.74** | **655.64** | **98.6** |

### 4.7.2. දෙපාර්තමේන්තුවට 2017 වර්ෂය සඳහා වෙන්කල ප්‍රාග්ධන ප්‍රතිපාදන හා වියදම

| වැඩසටහන | 2017 දී වෙන් වූ රජයේ ඒකාබද්ධ ප්‍රතිපාදන (රු.මි) | 2017 ඒකාබද්ධ ප්‍රතිපාදන වියදම (රු.මි) | 2017 දී උද්භිද උද්‍යාන අරමුදලින් වෙන් වූ ප්‍රතිපාදන වියදම (රු.මි) | 2017 උද්භිද උද්‍යාන අරමුදලින් වියදම (රු.මි) | 2017 දී වෙන් වූ මුළු ප්‍රතිපාදන වියදම (රු.මි) | මුළු වියදම (රු.මි) | % |
|---|---|---|---|---|---|---|---|
| පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය සංවර්ධනය | 2.579 | 2.560 | 28.310 | 28.195 | 30.889 | 30.755 | 99.6 |
| ගම්පහ උද්භිද උද්‍යානය සංවර්ධනය | 16.55 | 15.334 | 17.250 | 17.232 | 33.80 | 32.566 | 96.3 |
| හක්ගල උද්භිද උද්‍යානය සංවර්ධනය | 3.941 | 3.929 | 35.911 | 35.890 | 39.852 | 39.819 | 99.9 |
| ගනේවත්ත වන ඖෂධ උද්‍යානය සංවර්ධනය | 9.25 | 9.236 | 0.710 | 0.707 | 9.960 | 9.943 | 99.8 |
| මීගලෑව හරිත පියස පුහුණු මධ්‍යස්ථානය සංවර්ධනය | 6 | 5.982 | 0.0 | 0.0 | 6 | 5.982 | 99.7 |
| අධ්‍යාපන සහ පුහුණු වැඩසටහන | 0.5 | 0.496 | 2.250 | 2.247 | 2.750 | 2.743 | 99.7 |
| ශාකාගාරය සහ ශාක වර්ගීකරණ පර්යේෂණ වැඩසටහන | 0.0 | 0.0 | 4.850 | 4.841 | 4.850 | 4.841 | 99.8 |
| ජාතික මල්වගා සංවර්ධන වැඩසටහන | 10 | 9.985 | 24.626 | 24.612 | 34.626 | 34.597 | 99.9 |
| සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය සංවර්ධනය | 25.45 | 25.260 | 2.403 | 2.403 | 27.853 | 27.663 | 99.3 |
| මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය සංවර්ධනය | 74.2 | 73.205 | 0.0 | 0.0 | 74.20 | 73.205 | 98.7 |
| ප්‍රධාන කාර්යාලයේ වැඩිදියුණු කිරීම් කටයුතු සහ උද්භිද උද්‍යානයන් හි අලංකාරය හා ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම | 1.58 | 1.572 | 33.690 | 33.671 | 35.270 | 35.243 | 99.9 |
| එකතුව | **150.05** | **147.559** | **150.0** | **149.798** | **300.05** | **297.357** | **99.1** |



# 5. ශ්‍රී ලංකා වනජීවී භාරය

## දැක්ම

" ශ්‍රී ලංකාවේ වන සතුන් ආරක්ෂා කිරීම හා සංරක්ෂණය සඳහා දායකවීම."

## මෙහෙවර

" වනජිවී සම්පත් සංරක්ෂණය උදෙසා ප්‍රජාව දැනුවත් කිරීම."

## අරමුණු

- ශ්‍රී ලංකාවේ ස්වාභාවික උරුමයන්හි පාරිසරික හා ආර්ථික අගයන් ආරක්ෂා කිරීම හා වර්ධනය කිරීම.
- වනජීවී හා පාරිසරික අධ්‍යාපනික කටයුතු ප්‍රචලිත කිරීම.
- ශ්‍රී ලංකාවේ වනජීවී සංරක්ෂණ කටයුතු සඳහා සහාය වීම.
- සංරක්ෂිත කලාප ආශ්‍රිතව ප්‍රජා සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- වනජීවී/ පාරිසරික නීති අවශ්‍ය පරිදි ප්‍රචලිත කිරීම.
- පාරිසරික සංචාරක පහසුකම්, සන්නිවේදන කාර්යභාරයන් පවත්වාගෙන යාම හා සංවිධානය කිරීම.
- ශ්‍රී ලංකාවේ ස්වාභාවික හා සංස්කෘතික අගයන් පිළිබඳ ජාතික හා ජාත්‍යන්තර අවබෝධය වැඩිදියුණු කිරීම.

## පරිපාලනය

වනජීවී භාරය පාලනය කරනු ලබන්නේ සාමාජිකයන් 10 දෙනෙකුගෙන් යුත් භාරකාර මණ්ඩලයක් මගිනි. මෙහි සංයුතිය වනුයේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් නිල වශයෙන් සභාපති වශයෙන්ද, වනජීවී විෂය භාර අමාත්‍යාංශ ලේකම්තුමා, වන සංරක්ෂණ ජනරාල්, මුදල් අමාත්‍යාංශ නියෝජිත, ලංකා සංචාරක මණ්ඩල නියෝජිත, මධ්‍යම පරිසර අධිකාරියේ නියෝජිත, රාජ්‍ය නොවන ආයතන නියෝජිතයන් දෙදෙනෙකු හා පෞද්ගලික ව්‍යාපාරික අංශයෙන් දෙදෙනෙකු වශයෙනි.

# 5. ශ්‍රී ලංකා වනජීවී භාරය

## 5.1. වනජීවී භාරයේ ආදායම් මාර්ග

වනජීවී භාරය සිය සියලු කාර්යයන් සඳහා ආදායම් ඉපයීම කළ යුතු වේ. මේ සඳහා දැනට ප්‍රධාන ආදයම් මාර්ග 4ක් හදුනාගෙන ඇත.

- අරමුදල් ආයෝජනය
- රන්දෙණිගල පුහුණු මධ්‍යස්ථානයේ පහසුකම් කුලියට දීම
- පාරිසරික සංචාරක කටයුතු
- අලෙවි කටයුතු (සන්නිවේදන භාණ්ඩ ආදිය)

සංරක්ෂණ සේවාවන් වර්ධනය කිරීම වනජීවී භාරයෙහි වාර්ෂික ආදායම් වර්ධනය සමග බැඳී පවතී.

## 5.2. වනජීවී භාරයේ වැඩසටහන් හා සේවාවන්

වනජීවී භාරය තම වාර්ෂික ආදායමෙන් 50%ක් පමණ විවිධ වූ සංරක්ෂණ සේවාවන් පවත්වාගෙන යාම සඳහා වැය කරනු ලබයි.

- **ප්‍රජා අධ්‍යාපන වැඩසටහන්**

  මේ යටතේ ජංගම දැනුවත් කිරීමේ වැඩසටහන්, වැඩමුළු, ගවේෂණ චාරිකා, එක්දින දැනුවත් කිරීමේ වැඩමුළු, තෙදින නේවාසික ගවේෂණ චාරිකා හා සයමාසික වනජීවී සංරක්ෂණ සහතික පත්‍ර පාඨමාලා ආදිය ඇතුළත් වේ. මෙයට අමතරව විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් ද වනජීවී භාරය මගින් සංවිධානය කෙරේ.

- **පාසල් අධ්‍යාපනික වැඩසටහන් හා පාරිසරික කටයුතු**

  මෙම වැඩසටහන වනජීවී භාරයෙහි ප්‍රමුඛ වැඩසටහනකි. ඉතා වැදගත් ජෛව විවිධත්ව වටිනාකමකින් යුත් වනජීවී කලාප ආශ්‍රිත පාසල් සඳහා මෙහිදී ප්‍රමුඛත්වය ලබා දී ඇත. වනජීවී කලාප අවට ඇති පාසල්වල ක්‍රියාකාරී ගුරුවරුන් හා සිසුන් කණ්ඩායම් ඒකරාශී කරමින් ඔවුන්ගේ මූලික සහභාගීත්වය හා සැලසුම් කිරීම් යටතේ කෙටිකාලීන ක්‍රියාවන් ඉගෙනීමේ සැලසුම් හරහා මෙම වැඩසටහන් සංවිධානය කරනු ලබයි.

- **ප්‍රජා සංවිධාන ශක්තීන් දියුණු කිරීම**

  වනජීවී ආරක්ෂිත කලාප තුළ හා අවට ප්‍රජාවගේ සංවර්ධන ක්‍රියාවලිය අරමුණු කරගත් සමාජානුයෝජනය දියුණු කිරීම මෙම ක්‍රියාකාරකම් වලට ඇතුළත් වේ.

  දැනට වනජීවී භාරය මගින් තොරතුරු සන්නිවේදනය හා අලෙවි මධ්‍යස්ථාන 7 ක් ඉතා සාර්ථකව පවත්වාගෙන යනු ලැබේ.

- **පර්යේෂණ කටයුතු**

මේ යටතේ අදාළ ක්ෂේත්‍රයන් තුළ විවිධ මට්ටමේ පර්යේෂණ කටයුතු සඳහා සහය ලබාදීම. විශේෂයෙන්ම විශ්ව විද්‍යාල මට්ටමේ උපාධි අපේක්ෂක, පශ්චාත් උපාධි අපේක්ෂක, පර්යේෂණ කටයුතු සඳහා සහය වීම හා උසස් පෙළ සිසුන් සඳහා ව්‍යාපෘති කටයුතු වලට සහය වීම සිදු කෙරේ.

- **සන්නිවේදන හා ප්‍රවෘත්ති අංශ ව්‍යාපෘතිය**

වනජීවී භාරයෙහි අලෙවිසැල්හි ප්‍රකාශන කාර්යාංශය, ප්‍රදර්ශන අංශය හා සම්බන්ධ කාර්යයන් මීට ඇතුළත් වේ. දැනට වනජීවී භාරය මගින් තොරතුරු සන්නිවේදනය හා අලෙවි මධ්‍යස්ථාන 7 ක් ඉතා සාර්ථකව පවත්වාගෙන යනු ලැබේ.

## 5.3. 2017 වර්ෂයේ ශ්‍රී ලංකා වනජීවී භාරය මගින් සිදුකරන ලද සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය

- රටවල් 53 ක තරඟකරුවන් 103 දෙනෙකුගෙන් යුත් Racing the planet වැඩසටහන - 01
- අපනයන සඳහා මල් වැඩසටහනක් සංවිධානය කිරීම දැනුවත් කිරීමේ වැඩසටහන - 5
- අලුතින් අලෙවිසැල් 04 ක් ආරම්භ කිරීම. - දෙහිවල, සෆාරි උද්‍යානය රිදීගම -2, ඇත්අතුරු සෙවණ
- පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන පැවැත්වීම.– 02
- මාර්ගෝපදේශකයන් දැනුවත් කිරීමේ වැඩසටහන - 03
- ඡායාරූප සංගමයක් පිහිටුවීම - සාමාජික සංඛ්‍යාව 92 කි.
- ස්වභාවධර්ම සංරක්ෂණයට අදාළ පොත් 06 ක් එළිදැක්වීම. (පිටපත් 6000 - ශ්‍රී ලංකාවේ ක්ෂීරපායි සතුන්, ශ්‍රී ලංකාවේ ආවේණික කුරුල්ලෝ, සංක්‍රමණික කුරුල්ලෝ, ඇමර්සන් වර්ෂා වනාන්තරය, පාෂාණ ජීර්ණය, ගෝලීය උණුසුම)
- හෝර්ටන්තැන්නේ මල් පිළිබඳ ලියවුණ පොතක බෙදාහැරීමේ නියෝජිතයන් වශයෙන් භාර ගැනීම.
- වීඩියෝපට 08 ක් නිෂ්පාදනය කිරීම.
- CITES 17 සමුළුවේ ප්‍රචාරණ ද්‍රව්‍ය නිෂ්පාදනය
- Wild Lanka සඟරාව එළිදැක්වීම (පිටපත් 1000)
- අන්තර්ජාලයේ වෙබ් පිටුව ආරම්භ කිරීම.
- ෆේස්බුක් සමාජ ජාල පිටු 03 නිර්මාණය හා පවත්වාගෙන යාම (සාමාජිකයින් 3000)
- විදුලි වැට වල විදුලිය බිඳ වැටීම් හා වෙනස්වීම් ස්වයංක්‍රීයව නියාමනය කිරීම හා වාර්තා කිරීම උදෙසා පද්ධතියක් සැලසුම් කිරීම හා ප්‍රායෝගික පර්යේෂණ කටයුතු සිදු කිරීම.

- $Co_2$NegSLව්‍යාපෘතිය - පොදු සේවා හා ආයතනයන් මගින් කාබන් පිට කිරීම අවම කිරීම හා පිටවන කාබන් උරා ගැනීමට සමානුපාතිකව ගස් සිටවීමේ වැඩසටහන
- දුම්රිය - අලි ගැටුම් වැළැක්වීම උදෙසා ඉලෙක්ට්‍රොනික පද්ධතියක් නිෂ්පාදනය කර පේටන්ට් බලපත්‍රය සඳහා අයදුම් කිරීම .
- දුම්රිය මාර්ගයේ වනඅලි ගැටුම් වැළැක්වීම උදෙසා නිර්මාණය කරන ලද පද්ධතිය මන්නාරම් දුම්රිය මාර්ගයේ සවි කිරීම ආරම්භ කිරීම.
- සමාජ ජාල හා පරිසර ක්‍රියාකාරීන් මගින් දඩයම්කරුවන් හඳුනා ගැනීම හා නීතියට කොටු කර දීමේ වැඩසටහන (NWCPU)
- ස්වභාව සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳ මාධ්‍ය ප්‍රචාරණ
- ආදර්ශ තිරසර ගම්මාන 16 ව්‍යාපෘතිය
- ප්‍රචාරණ මාධ්‍යක් ලෙස ඩිජිටල් පුවරු 10 සවි කිරීමේ ව්‍යාපෘතිය
- රඹුක්කන හිරිවඩුන්න ග්‍රාමයේ පොලිතින් නිදහස් පාසලක් බිහි කිරීම හා සිසු සිසුවියන් ඒ සඳහා දිරිමත් කිරීමට කෑම පෙට්ටි, බෝතල්, පාසල් බෑග්, ලිපි ද්‍රව්‍ය බෙදා දීම ද නිරෝගී සිසු සිසුවියන් උදෙසා හුණු පුවරු වෙනුවට White board සවි කර දීම.

## 5.3. ආදායම සහ වියදම සාරාංශය

(රු. '000)

| අයිතම | ආදායම (රු.) |
|---|---|
| ස්ථාවර තැන්පතු පොලී ආදායම | 2,633,575.83 |
| යාල අලෙවිසැල | 777,051.00 |
| විල්පත්තු අලෙවිසැල | 396,040.00 |
| ප්‍රධාන කාර්යාලයේ අලෙවිය | 65,497.00 |
| හෝර්ටන්තැන්න අලෙවිසැල | 970,300.00 |
| රන්දෙනිගල පුහුණු කේන්ද්‍රයේ අලෙවිසැල | 75,700.00 |
| සත්වෝද්‍යානයේ අලෙවිසැල | 795,703.00 |
| උඩවලව අලෙවිසැල | 1,304,965.00 |
| රිදියගම අලෙවිසැල | 911,050.00 |
| රිදියගම ආපනශාලාව | 654,135.00 |
| ආපදාණය පොලිය | 1,911.00 |
| රන්දෙනිගල පුහුණු කේන්ද්‍රයේ ආදායම | (1,840,865.47) |
| හෝර්ටන්තැන්න භෝජනාගාරයේ කුලී ආදායම | 4,445,000.00 |
| වනඅලි දුම්රිය ගැටුම් වැලැක්වීමේ නියමු ව්‍යාපෘතිය-ආධාර මුදල් | 292,300.00 |
| ආධාර –Maximus (Pvt)ltd | 100,000.00 |
| සුභ පැතුම්පත් මුද්‍රණය කිරිමෙන් ලද ආදායම | 63,000.00 |
| යාල භෝජනාගාරයේ කුලී ආදායම | 156,250.00 |
| සේවා ප්‍රසාදිනී 2017 වැඩසටහන වෙනුවෙන් | 812,500.00 |
| BMICH හි ප්‍රදර්ශණයේ ආදායම | 770,000.00 |
| ඩිජිටල් පුවරු සවිකිරීමෙන් ලද ආදායම | 150,000.00 |
| සොබාසිරි වැඩසටහන සඳහා ආධාර | 500,000.00 |
| තිරසර වැඩසටහන සඳහා පොත් හා පොත් සලකුණු සඳහා මුද්‍රණ ආදායම | 4,500,000.00 |
| තිරසාර ගම්මාන වැඩසටහන | 2,310,540.00 |
| ප්‍රධාන කාර්යාලයෙන් පවත්වන වැඩසටහන් | 1,162,710.00 |
| වීඩියෝ පට 10 ක් සකස් කිරීම වෙනුවෙන් | 240,500.00 |
| පොත් ප්‍රදර්ශණයේ ආදායම | 830,772.50 |
| ආධාර- FOG | 250,000.00 |
| වෙනස සඟරාව මුද්‍රණය කිරීම | 386,970.00 |
| **මුළු ආදායම** | **23,697,404.86** |

## වියදම

(රු. '000)

| අයිතමය | ආදායම |
|---|---|
| වැටුප් -ප්‍රධාන කාර්යාලය | 3,720,915.56 |
| වැටුප් -අලෙවිසැල් | 3,045,108.60 |
| අතිකාල දීමනා හා ගමන් වියදම් | 16,705.00 |
| දුරකථන ගාස්තු | 50,898.29 |
| විදුලිය ගාස්තු | 1,936.40 |
| භාණ්ඩ සැපයුම්කරුවන්ට ගෙවීම් | 2,777,049.00 |
| සුභ පැතුම්පත් මුද්‍රණය කිරීමේ වියදම | 37,000.00 |
| රන්දෙනිගල පුහුණු ක්‍රේන්ද්‍රයේ D2 බංගලාව අළුත්වැඩියා කිරීම | 4,445,000.00 |
| ඉන්ධන | 195,705.00 |
| සළු මුදල් හා මුද්දර ගාස්තු | 74,950.53 |
| ලිපි ද්‍රව්‍ය | 64,679.25 |
| වාහන අළුත්වැඩියා කිරීම - 251-3758 | 39,425.00 |
| වාහන අළුත්වැඩියා කිරීම - CR-0127 | 95,270.00 |
| රිදියගම බීම හල වෙනුවෙන් භාණ්ඩ මිලදී ගැනීම | 650,605.61 |
| ටී ෂර්ට් මිලට ගැනීම | 431,950.00 |
| රක්ෂණ වාරිකය - 251-3758 | 1,072.08 |
| පොත් මුද්‍රණය කිරීමේ වියදම්- කතෘ භාගය ගෙවීම | 207,500.00 |
| වනඅලි දුම්රිය ගැටුම් වැලැක්වීමේ නියමු ව්‍යාපෘතිය | 502,832.57 |
| වෙනත් | 134,131.15 |
| සේවා ප්‍රසාදිනි 2017 වැඩ සටහන වෙනුවෙන් ගෙවීම් | 536,500.00 |
| ප්‍රධාන කාර්යාලයේ තිර රෙදි දැමීම | 50,000.00 |
| Change Beigns සඟරාව මුද්‍රණය කිරිම වෙනුවෙන් | 129,000.00 |
| BMICH හි ප්‍රදර්ශණයේ වියදම් | 904,836.00 |
| තිරසර වැඩසටහන සඳහා පොත් හා පොත් සලකුණු සඳහා වියදම් | 3,625,000.00 |
| පොත් රාක්ක මිලදී ගැනීම | 30,800.00 |
| රන්දෙනිගල පුහුණු කේන්ද්‍රය වෙනුවෙන් මෙට්ට මිලදී ගැනීම | 120,750.00 |
| රන්දෙනිගල පුහුණු කේන්ද්‍රය වෙනුවෙන් බෙඩ් ෂීට් කොට්ට උර මිලදී ගැනීම | 31,250.00 |
| තිරසර ගම්මාන වැඩසටහන | 704,443.56 |
| වෙබ් සයිට් එක සැකසීම වෙනුවෙන් | 83,432.50 |
| රිසිට් පොත් මුද්‍රණය කිරීම | 11,500.00 |
| සහතිකපත් මුද්‍රණය කිරීම | 44,250.00 |
| වීඩියෝපට 10 ක් නිර්මාණය කිරීම | 70,000.00 |
| පොත් හා පෝස්ටර් නිර්මාණය කිරීම | 1,149,346.00 |
| ප්‍රධාන කාර්යාලයේ වැඩසටහන් වියදම | 262,004.00 |
| පොත් ප්‍රදර්ශනයේ වියදම | 49,000.00 |
| එක්දින වැඩසටහන් සඳහා | 6,090.00 |
| වෙනස සඟරාව මුද්‍රණය කිරීමේ වියදම | 322,000.00 |
| **මුළු වියදම** | 24,622,936.10 |
| **ලාභය/ (අලාභය)** | (925,531.24) |

## රන්දෙණිගල පුහුණු කේන්ද්‍රයේ ආදායම

(රු. '000)

| ආදායම | (රු.) |
|---|---|
| බංගලා වෙන්කිරීමෙන් ලද ආදායම | 2,342,683.00 |
| ආපනශාලාව | 1,993,658.00 |
| දේශනාගාරය | 9,625.00 |
| කුලී ආදායම | 18,000.00 |
| වෙනත් | 20,806.44 |
| **මුළු ආදායම** | **4,384,772.44** |
| **වියදම** | **(රු.)** |
| වැටුප් | 4,437,596.94 |
| අපනශාලා වියදම් | 1,134,490.68 |
| ජල බිල්පත් | 104,160.00 |
| දුරකථන වියදම් | 44,237.88 |
| විදුලිය | 356,799.41 |
| සුළු මුදල් | 69,473.00 |
| වාහන අළුත්වැඩියා | 31,380.00 |
| ඉන්ධන | 47,500.00 |
| **මුළු වියදම** | **6,225,637.91** |
| **ලාභය/(අලාභය)** | **(1,840,865.47)** |